# පෙරදිග සංගීතය

# 10 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය

(2015 සිට ක්‍රියාත්මක වේ)



සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# පෙරදිග සංගීතය

## ගුරු මාර්ගෝපදේශය

# 10 වන ශ්‍රේණිය

(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

සෞන්දර්ය දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk    විද්‍යුත් තැපැල : info@nie.lk

# පෙරදිග සංගීතය

**10වන ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2014**

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සෞන්දර්ය දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපැල** : info@nie.lk

*මුද්‍රණය* : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# හැඳින්වීම

අපේ මාතෘභූමියටත්, සංස්කෘතියටත්, සොබාදහම හා සමස්ත ජීව, අජීව විශ්ව ධාතුවටත් හිතකාමී පුරවැසියකු නිර්මාණය කිරීමේ පුළුල් ජාතික පරමාර්ථයෙන් පාසල් පද්ධතිය තුළ දරුවන්ට ඉගෙනීමට ලැබෙන සුවිශේෂතම විෂයය සෞන්දර්ය විෂයයයි. එය ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස අප විසින් හඳුනා ගන්නා ලද පහත දැක්වෙන සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම කියැවීමෙන් ඔබට මැනවින් අවබෝධ වනු ඇත.

සෞන්දර්යයෙන් සංස්කෘතිකමය ළැදියා පුබුදුවා, එමඟින් නිර්මාණශීලී බව, සංවේදීතාව, දරා ගැනීම, ශ්‍රී ලාංකේය අනන්‍යතාව හා දේශානුරාගය වඩවා මාතෘ භූමිය කෙරෙහි සංවේදී වූ දරු කැලක් හා සමාජයක් බිහි කිරීම.

("To sensitize students and the community through Aesthetics to the Mother Land, endowed with cultural pride, creativity, Sensitivity, tolerance, partriotism and a sense of national identity")

දේශය ගොඩනැංවීමේ දී විශ්වය සමඟ යහ සබඳතා පවත්වා ගනිමින් පෙරට යන අනාගත පුරවැසියා කෙසේ විය යුතු ද යන්න ගැඹුරින් විමසා බැලීමත් සමඟ මෙතෙක් පැවති සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම අතික්‍රමණය කොට මෙම 2015 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය දෙස නවමු දෘෂ්ටියක් හෙළා ඇති බව එනයින්ම ඔබට පැහැදිලි වනු ඇත.

උසස් රසඥතා ඥානයකින් යුතු මානව හිතවාදී චින්තනයෙහි හෙබි ක්‍රියාශීලී සමාජානුයෝගී පුරවැසියකු ලෙස වැඩලෝකයට පිවිසීමට සෞන්දර්ය අධ්‍යාපනයෙන් ලබන ආධ්‍යාත්මික හා ශාරීරික ප්‍රබෝධය ඉවහල් කර ගැනීම අද්‍යතන සමාජ අවශ්‍යතාවකි.

සෞන්දර්ය අධ්‍යාපනයෙන් දරුවකු තුළ සොඳුරු මෙන් ම නිර්මාණශීලී හැකියාවන් හා චින්තනය ප්‍රවර්ධනය කිරීම ද විනය ගරුක, සදාචාරවත් අභිමානවත් පුරවැසියකු තැනීමේ වගකීම ඉටු කිරීම ද දෙවැනි වන්නේ ආගමෙන් මිනිසාට සැලසෙන සේවාවට පමණි.

එබැවින් විද්‍යා, ගණිත, වාණිජ, තාක්ෂණ හා භාෂා විෂයයන්ගෙන් ඥානනය වන මිනිස් සත්ත්වයාට මිනිස් ගුණ උරුම කර දෙන සෞන්දර්ය අධ්‍යාපනික විෂයයන් ඉගෙනීම එදාටත් වඩා අදට සහ හෙටට අත්‍යවශ්‍ය ම බැව් තරයේ ම කිව යුතු ව ඇත.

මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණයත් සමඟ අභිනවයෙන් 6 ශ්‍රේණියට පැමිණෙන දරුවන් නවමු චින්තනයක් ඇති අළුත් පරපුරක් ලෙස තැනුම උදෙසා පළමු ක්‍රියාකාරකමින්ම ස්වයං පෙලඹවීමක් ඇති වන පරිදි කැමැත්ත හා විශ්වාසය ගුරුවරයා විසින් දිනා ගත යුතු ය. ඒ සඳහා ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් අතින් විරචිත "ප්‍රාර්ථනාව" නම් වූ කුඩා ළමා ගීයක් දරුවාගේ ජීවන ප්‍රතිඥාවක් ලෙස දිනපතා පාඩම ඇරඹුමට පෙර ගැයුමට අප යෝජනා කරමු.

| | | | |
|---|---|---|---|
| ස ස ස - | ස ස ස - | රි රි රි - | රි රි රි - |
| හො ඳ දේ ඍ | හිත මී ඍ | හි තු දේ ඍ | කි ය මී ඍ |
| ස රි ස රි | ස ස රි - | රි ස රි ස | ස ස ස - |
| කි යු දේ ඍ | ක ර මී ඍ | ක ර මි න් | හැ දෙ මී ඍ |

මෙම ප්‍රවේශයත් සමඟ ඇරඹෙන සෞන්දර්යයේ වින්දනාත්මක ඉගෙනුම ජාතික, සංස්කෘතික අනන්‍යතා හා විවිධ සම්ප්‍රදායයන් ස්පර්ශ කරමින් විශ්ව චින්තනයක් කරා දරුවාගේ දැනුම, හැකියා හා ආකල්ප පුළුල් කර ගැනීමට හැකි වන පරිදි විෂය කරුණු අප අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක පදනමින් යුතු ව ක්‍රමිකව පෙළ ගස්වා ඇත.

එහි දී නායකත්වය, සහභාගිත්වය, ඉදිරිපත් වීම, සුහදත්වය, සාමූහිකත්වය, ඇගැයීම, සවන්දීම, පිළිගැනීම, බෙදාහදා ගැනීම, අන්‍යයන්ට ගරු කිරීම ආදී ආකල්ප සෑම සිසුවකු තුළ ම වර්ධනයට අවස්ථාව සැලසෙන පරිදි අප විසින් යෝජිත ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් පරිසරය සකසා ගැනීමට ගුරුවරයා වශයෙන් ඔබට ද ඉඩකඩ ඇත.

තවද දෛනික ජීවිතයේ දී මුහුණ දෙන විවිධ ගැටලුවලට සාර්ථකව මුහුණ දී තර්කානුකූල ව හා නිර්මාණාත්මකව චින්තනය මෙහෙයවා ඒවා විසඳා ගැනීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා වර්ධනය කිරීමට ද අප විසින් වත්මන් පරපුරට දායකත්වය සැපයිය යුතු ව ඇත.

එබැවින් ගුරු භවතුන් ලෙස ඔබ මෙම ගුරු මාර්ගෝපදේශය පෙරට වඩා හොඳින් පරිශීලනය කරන්නේ නම් ඔබගේ ද චින්තනයට අලුත් ආලෝකයක් හා ප්‍රබෝධයක් ලැබෙනු ඇත. ඒ ආලෝක කිරණ ජාතියේ දරු කැල මත පතිතව ඔවුන් ද ඉමහත් ප්‍රබෝධයෙන් මෙම විෂයය ඉගෙනීමට යොමු වනු නො අනුමානය.

එසේ ම කායික හා මානසික සමබරතාවෙන් හෙබි සෞඛ්‍ය සම්පන්න මෙන් ම නීරෝගී දිවිපෙවතක් ගත කිරීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා සංවර්ධනය කිරීම හා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනංවා ගනිමින් ජාතික හා ජාත්‍යන්තර තලයේ නොසැලී කටයුතු කිරීමට විචාරශීලී මනසකින් හෙබි පුද්ගලයකු බිහි කිරීමට වගවීම සෞන්දර්ය අධ්‍යාපන විෂය භාර ව කටයුතු කරන ඔබ අප සැමගේ වගකීම වේ.

ඒ සඳහා 2015 වසරේ සිට 6 ශ්‍රේණියෙන් ඇරඹී ක්‍රියාත්මක වන මෙම නව ප්‍රතිසංස්කරණය දරුවන් හරහා අපි සැම නවමු ලොවකට පිවිසීමේ වැදගත් අවස්ථාවක් ලෙස දකිමින් උද්යෝගයෙන් හා කැපවීමෙන් වඩාත් ඵලදායී සේවාවක් සැලසීමට කැප වෙමු.

**අධ්‍යක්ෂ (සෞන්දර්ය)**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# විෂයමාලා කමිටුව

| | |
|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | ජානකී පතිරණගේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

## ලේඛක මණ්ඩලය

**බාහිර සම්පත් දායකත්වය**

| | |
|---|---|
| ඩබ්. වී. ජී. විතානගේ | අතිරේක කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂ,<br>කලාප අධ්‍යාපන කාර්යාලය, රතනපුර. |
| කපිල මැද්දෙගොඩ | කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්‍ෂ,<br>කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පානදුර. |
| කේ. කේ. එස්. ජයවික්‍රම | සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (විශ්‍රාමික),<br>කලාප අධ්‍යාපන කාර්යාලය, පිළියන්දල. |
| ආර්. ඩී. පෙරේරා | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මහනුවර. |
| චිත්‍රානන්ද ෆොන්සේකා | ගුරු උපදේශක, කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, බණ්ඩාරගම. |
| ඊ. ඒ. ප්‍රේමසිරි | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කළුතර. |
| ජී. කේ. ලීනා මාග්‍රට් | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, පිළියන්දල. |
| නිහාරි සමන් කුමාරි මුණසිංහ | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය,<br>ශ්‍රී ජයවර්ධනපුර. |
| රංජිත් ප්‍රියන්ත සිල්වා | ගුරු සේවය, ජනාධිපති විද්‍යාලය, මිනුවන්ගොඩ. |
| රුවානි වීරසිංහ | ගුරු සේවය, රාජසිංහ විද්‍යාලය, හංවැල්ල. |

**අභ්‍යන්තර සම්පත් දායකත්වය**

| | |
|---|---|
| සුදත් සමරසිංහ | අධ්‍යක්‍ෂ, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |
| ජානකී පතිරණගේ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |

**භාෂා සංස්කරණය**

| | |
|---|---|
| ආචාර්ය මාදුරුඔය ධම්මිස්සර හිමි | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණි විශ්වවිද්‍යාලය, යක්කල. |
| එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>පූර්ව ළමා විය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |
| අමරසිරි වික්‍රමරත්න | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>අග්නිදිග විශ්ව විද්‍යාලය, ඔළුවිල්, අඩ්ඩාලච්චේන. |

| | |
|---|---|
| **පරිගණක යතුරු ලියනය** | ඩබ්ලිව්. එම්. ධම්මිකා |
| **පිටකවර නිර්මාණය** | රවීන්ද්‍ර තේනුවර |
| **විවිධ සහය** | ඊ. එම්. වික්‍රමනායක<br>ප්‍රේමරත්න පෙරේරා |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සෞන්දර්ය අධ්‍යාපනය යටතේ පෙරදිග සංගීතය විෂයයක් වශයෙන් හැදෑරීමෙන් දරුවාට පාසල් ජීවිතය තුළ පමණක් නොව පසු කාලීනව ද තම ජීවිත පැවැත්ම සඳහා අවශ්‍යවන සංවේදී අධ්‍යාත්මයක් හා නිපුණතා වර්ධනය කර ගැනීමට හැකි වනු ඇත. උක්ත කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙවර ප්‍රධාන නිපුණතා 9ක් හඳුන්වා දී ඇති අතර එම නිපුණතා කරා ළඟා වීමට අත්‍යවශ්‍ය නිපුණතා මට්ටම් පෙළක් ද හඳුන්වා දී ඇත. එම නිපුණතා මට්ටම්වල ඉහළ නිපුණතා මට්ටම් කරා සිසුවා ළඟා කරවීම 10වන ශ්‍රේණියේ දී අපේක්ෂිත ය.

මෙම නව විෂය නිර්දේශය සැකසීමේ දී, පෙරදිග සංගීත ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලවලින් ලබා ගත් දත්ත, ජාතික මට්ටමේ විභාග පරීක්ෂකවරුන්ගේ වාර්තා ඇසුරෙන් සිසුන් තුළ විශේෂයෙන් සංවර්ධනය විය යුතු විෂය කොටස් පිළිබඳ තොරතුරු පාදක කර ගන්නා ලදි. එසේ ම පළාත් බද සේවාස්ථ අධ්‍යායන සැසි, විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පාසල් නියාමන පර්යේෂණ වාර්තා, කලාප මට්ටමෙන් පවත්වන ලද කාර්ය බද්ධ පරීක්ෂණ දත්ත, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ හා විද්‍යාර්ථීන්ගේ අදහස්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයන්හි තූර්ය වාදක කණ්ඩායම්වල අදහස්, සංගීත විෂය හදාරන ලද විද්වතුන්ගේ අදහස්, විද්‍යුත් මාධ්‍යයන්හි විකාශය වූ සාකච්ඡා හා වැඩසටහන් ඇසුරෙන් ලබා ගත් තොරතුරු මෙන් ම පාසල් පද්ධතියේ පෙරදිග සංගීත විෂය ඉගැන්වීම් කරන ගුරුභවතුන්ගේ හා දෙමව්පියන්ගේ අදහස් ද විෂය නිර්දේශ සම්පාදනයේ දී විශේෂයෙන් අවධානයට ලක් කරන ලදි.

විෂය නිර්දේශය ප්‍රායෝගික නැඹුරුතාවයකින් යුතු ව ගොඩ නගා ඇති අතර ක්‍රියාකාරකම් සඳහා හඳුන්වා දී ඇති ගුණාත්මක යෙදවුම් හැකිතාක් යොදා ගනිමින් පාඩම සංවර්ධනය කිරීම ගුරුභවතාගේ වගකීමයි. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ හඳුන්වා දී ඇති නිදර්ශක ඇගයීම් උපකරණ ග්‍රන්ථය ඇසුරු කර ගනිමින් දරුවන්ගේ ඇගයීම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ඔබට සක්‍රීයව දායක වීමට සිදු වේ. එසේ ම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනීසිටිමට සුදුසු වන ආකාරයට ඉතා දක්ෂ ලෙස ප්‍රායෝගික කොටස්වල නිපුණත්වයට දරුවා ළඟා කරවීම ද, පෙළඹවීම ද ගුරුභවතාගේ වගකීම වේ.

ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී හඳුන්වා දී ඇති ප්‍රවේශවලට අමතර ව වෙනත් සුදුසු ක්‍රමවේද නිර්මාණශීලීව යොදා ගැනීමේ හැකියාව හා නිදහස ඔබට ඇත. ක්‍රියාකාරකමෙහි දක්වා ඇති ඉගෙනුම් පල ළඟා කර ගත හැකි වන අයුරින් වඩාත් ඵලදායි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කර ගැනීම තුළින් සාර්ථක ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ඔබට හැකි වනු ඇත.

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | iv |
| හැඳින්වීම | v-vi |
| විෂයමාලා කමිටුව | vii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | viii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | x-xv |
| වාර සටහන | xvi-xvii |
| ක්‍රියාකාරකම් සන්තතිය | 01-96 |

# 10 ශ්‍රේණිය විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 1.1 ආරෝහණයේ සහ අවරෝහණයේ විකෘති ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා වර්ධනය කර ගනී. | • භෛරවී සහ යමන් රාග විස්තර ලක්ෂණ ගී මගින්<br>• එම රාගවල ස්වර අභ්‍යාස<br>• එම රාගවල සර්ගම්<br>• එම රාගවල මධ්‍යලය ගීත | 1 ස්වර අභ්‍යාස, සර්ගම්, ලක්ෂණ ගීත යොදා ගනිමින් භෛරවී සහ යමන් රාග දෙකෙහි ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.<br>2 ලක්ෂණ ගීත ඇසුරින් භෛරවී යමන් රාග දෙක පිළිබඳ විස්තර කරයි.<br>3 ශිල්පීය දක්ෂතා ලැබීමට රාගධාරී සංගීතයේ ඇසුර ඉතා වැදගත් බව පිළිගනියි. | 03<br><br>03<br>03<br>03 |
| | 1.2 හින්දුස්ථානී තාල පද හා සම්බන්ධ අවනද්ධාක්ෂර තබ්ලාවේ නිකුත් වන අයුරු විමර්ශනය කරමින් ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි. | • හින්දුස්ථානී තාල පදවල අවනද්ධාක්ෂර සහ ඒවා තබ්ලාවෙන් වයන ආකාරය | 1 තබ්ලාවේ කොටස් හඳුනා ගනිමින් අවනද්ධාක්ෂර නිකුත් වන ආකාරය පැහැදිළි කරයි.<br>2. හින්දුස්ථානි තාලපද තබ්ලාවෙන් වැයීමට කැමැත්ත පල කරයි. | 04 |
| 2.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 2.1 ස්වර ලිපි බලා වාදනය කරයි. | • ස්වර ලිපි කියවීමේ ක්‍රමශිල්ප<br>• තනුවක් ස්වර ලිපි කිරීමේ ක්‍රමශිල්ප<br>• ස්වර පුවරුවෙන් ස්වර ලිපි බලා වාදනය<br>• තෝරා ගත් භාණ්ඩයෙන් ස්වර ලිපි වාදනය. | 1 ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික සංගීත ක්ෂේත්‍රය තුළ භාවිත වන සංකේත හඳුනා ගනිමින් ස්වර ප්‍රස්තාර කියවීමේ හුරුව ලබයි.<br>2. වෘත්තීය වාදකයෙකු වීමට අවශ්‍ය මූලික හැකියා වර්ධනය කර ගනියි.<br>3. තෝරාගත් භාණ්ඩයෙන් තම දක්ෂතා ඉදිරිපත් කළ හැකි, වාදනයෙහි නිපුණයෙකු බිහිවෙයි. | 02<br>02<br>03<br>03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරුවෙයි. | 3.1 ව්‍යවහාරික සංගීතයේ වර්ධනයේ විවිධ අවස්ථා හඳුනා ගනිමින් එක් එක් යුගවලට අයත් ගීත ගායනයේ / රසාස්වාදයේ යෙදෙයි. | • ග්‍රැමෆෝන් තැටි යුගයෙන් තෝරාගත් ගීත<br>• මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීත හා නිර්මාණකරුවන්ගේ දායකත්වය<br>• කපිරිඤ්ඤා ගීතවල ස්වභාවය | 1. ග්‍රැමෆෝන් ගීත, මුල් යුගයේ ගුවන්විදුලි සරල ගී හා කපිරිඤ්ඤා ගීතවල ස්වභාවය වෙන්කොට දක්වයි.<br>2. එම ගීත ගයමින් රසාස්වාදයේ යෙදෙයි.<br>3. ශ්‍රී ලංකාවේ සංගීත ක්ෂේත්‍රයට ඉහත ගීත මගින් සිදු වූ මෙහෙය අගය කරමින්, ගීත සංරක්ෂණය කළ යුතු බව පිළිගනියි. | 02<br>02<br>02 |
| | 3.2 ශ්‍රී ලංකාවේ සංගීතයේ උන්නතියට දායක වූ මෙරට සංගීතඥයින් අගය කරමින් ඔවුන්ගේ නිර්මාණ රසවිඳියි. | • ඩබ්ලිව්.බී.මකුලොලුව (දෙපානෝ ඇසුරින්)<br>• සී. ද. ඇස් කුලතිලකගේ නිර්මාණ (දෑතට වළලු ඇසුරින්)<br>• රෝහණ බැද්දගේ (මල්සරා ගීතය ඇසුරින්)<br>• ලයනල් රංවල (ගම අවුලඤ්ඤයි ගීතය ඇසුරින්) | 1 දේශීය ජන සංගීතයේ උන්නතිය සඳහා කැප වූ සංගීතඥයින්ගේ ජීවන තොරතුරු රැස්කරයි.<br>2. ඔවුන්ගේ නිර්මාණ ග්‍රන්ථ හා කරන ලද සේවාවන් වෙන් කර දක්වමින් අගය කරයි. | 02<br>02<br>02<br>02 |
| | 3.3 උතුරු ඉන්දීය අධ්‍යතන ශාස්ත්‍රීය සංගීතඥයින් හඳුනා ගනිමින් ඔවුන්ගේ නිර්මාණ අගය කරයි. | • හරිප්‍රසාද් චෞරාෂියා, රවි ශංකර්, ශබීර් හුසේන්, ජග්ජිත් සිං, රහ්මාන් යන සංගීතඥයින්ගේ නිර්මාණයක් ඇසුරින් | 1. භාරතීය වාද්‍ය ශිල්පීන්ගේ ජීවන තොරතුරු අධ්‍යයනය කරයි.<br>2. එම වාද්‍ය ශිල්පීන්ගේ වාදන කෘති රස විඳියි. මෙහෙයවීම වැනි විවිධ පෞරුෂ ගුණාංග පිළිබඳ අත්දැකීම් ලබයි. | 04 |
| | 3.4 ලබාගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගිකව ඉදිරිපත් කරමින් සතුට ලබයි. | • වාර්ෂික විවිධ ප්‍රසංගය | 1. මෙතෙක් උගත් ගායන වාදන හැකියා ප්‍රසාංගිකව ප්‍රදර්ශනය කරයි.<br>2. ඉදිරිපත් වීම, සංවිධානය හා මෙහෙයවීම වැනි ගුණාංග ප්‍රගුණ කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි. | 4.1 සිංහල පද්‍ය ගායනාවන්හි ස්වභාවය හඳුනා ගනිමින් ගායනය කරයි. | • සෝ ගීවල ස්වභාවය<br>• ගුත්තිලය සහ සැළලිහිණි සන්දේශයේ කාව්‍ය ගායනා | 1. සැළලිහිණි සංදේශයේ හා ගුත්තිල කාව්‍යයේ පද්‍ය ගායනය කරයි.<br>2. විවිධ විරිත් හා බැඳුණ ගීතවල සම්ප්‍රදායික නාදමාලා අධ්‍යයනය කරයි.<br>3. සෝ ගී යන්න නිර්වචනය කරමින් කාව්‍ය රචනයේ හා ගායනයේ පෙළඹෙයි. | 04 |
| | 4.2 ජන ගී වර්ග කරමින් එක් එක් වර්ගයට අයත් ගී පිළිබඳ ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි. | • ජන ගී වර්ගීකරණය හා විවිධ වර්ගයේ ජන ගී (මෙහෙගී, බැතිගී, සමාජගී, (ගැල්, පැල්, පාරු, පතල්)<br>• ආඝාතාත්මක බව සහ අනාඝාතාත්මක බව, ගැමි ගී නාමිකව හා ප්‍රායෝගිකව | 1. ජන ගී වර්ග කරයි, එක් එක් වර්ගවලට අයත් ගීත සම්ප්‍රදායික නාදමාලාව අනුව ගායනය කරයි.<br>2. ගැමි ගී නිර්වචනය කරමින් නිර්මාණයට බල පෑ හේතු සාධක විමසයි.<br>3. ආඝාතාත්මක බව හා අනාඝාතාත්මක බවෙහි වෙනස ප්‍රායෝගිකව ප්‍රදර්ශනය කරයි.<br>4. ගැමි ගී වර්ගීකරණය කරමින් අනාගත පරපුර සඳහා ගීත සංරක්ෂණය කළ යුතු බව පිළිගනියි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. | 5.1 උතුරු ඉන්දීය චිත්‍රපට සංගීත නිර්මාණයේ රාගධාරී පසුබිම සාකච්ඡා කරමින් රස විඳිමින් ගීත ගායනයේ යෙදෙයි. | • බෛයිජු බවරා, මධුමතී, අභිමාන්, දෙව්දාස්, ජනක ජනක පායල් බාජේ (චිත්‍රපටයක එක් ගීතයක් ඇසුරින්) | 1. උතුරු ඉන්දීය චිත්‍රපටවල ඇති රාගාශ්‍රිත ගීත රස විඳියි. | 03 |
| | 5.2 ශ්‍රී ලංකාවේ සරල සංගීත ක්ෂේත්‍රයේ මව්පිය ගුණ වරුණ සඳහන් ගීත ගායනයේ රස විඳියි. | • කඳුළු හෙලා නැඹිලියට/ඉපදුනු දා මා හඬා වැටෙන්නැති/ගමට කලින් හිරු | 2. ශ්‍රී ලංකාවේ සරල සංගීත ක්ෂේත්‍රයේ මව්පිය ගුණ ඇතුළත් ගීත ගයමින් අගය කරයි. | 03 |
| 6.0 රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි. | 6.1 විවිධ ශෛලීන් ආභාශය කරගත් නව නාට්‍ය සම්ප්‍රදායන් අවබෝධ කර ගනිමින් ගායනයේ යෙදෙයි. | • නව නාට්‍ය සඳහා නාඩගම් ශෛලියේ ආභාසය ලැබීම (මනමේ සිංහබාහු කාලගෝල නාට්‍ය ඇසුරින්) එක් නාට්‍යයකින් එක් ගීතයක් බැගින් ගායනය/වාදනය | 1. නාඩගම් ශෛලියේ ආභාසයෙන් නිර්මිත නව නාට්‍ය පිළිබඳ අදහස් දක්වයි.<br>2. මනමේ, සිංහබාහු, ගීත ගයා / වයා අගය කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි. | 7.1 ගීපද රචනාවක සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් ගීපද නිර්මාණය කර තනු නිර්මාණය කරයි. | • පද රචනා ගීතයකට සුදුසු වන ආකාරය<br>• මාතෘකාවක් මත පද නිර්මාණය<br>• සුදුසු තනු නිර්මාණය<br>• කවියක් ගීතයක් වන අයුරු<br>• ගීතවත් දෙබස් | 1. සාර්ථක ගීතයක් වීමට ඇතුළත් විය යුතු අංග පැහැදිළි කරයි.<br>2. ගීතයේ තනුව හා පදමාලාව අතර ප්‍රසම්බන්ධය විග්‍රහ කරයි.<br>3. සදෘස්, නිසදෘස්, වශයෙන් කවි වර්ග කරයි.<br>4. කවියක්, ගීතයක් බවට පත් කළ හැකි උපක්‍රම සොයා බලයි. | 02 |
| 8.0 සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි. | 8.1 ශ්‍රවණ මාධ්‍යයෙන් ගීපද ප්‍රස්තාර කරයි. | • ජප්තාල් දීප්චන්දි යන තාල මත නිර්මාණය වූ ගීත ප්‍රස්තාර කිරීම<br>• සමග්‍රහ, විෂමග්‍රහ, අවග්‍රහ සහිත ගීපද ප්‍රස්තාරකරණය. | 1. විවිධ තාල පදනම් කර ගනිමින් ගීත ප්‍රස්තාර කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>2. සමග්‍රහ, අවග්‍රහ, විෂමග්‍රහ වශයෙන් ඇති වන වෙනස ප්‍රායෝගිකව දක්වයි.<br>3. විවිධ ග්‍රහයන් යෙදීම තුළින් ගීත මාධුර්යය වෙනස් විය හැකි බව පිළිගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 සංගීතයේ තාක්ෂණික මෙවලම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි. | 9.1 නාදයේ ත්‍රිවිධ ගුණ සහ එහි භෞතික පදනම විග්‍රහ කරයි. | • නාද නිෂ්පත්තිය සහ ප්‍රගමනය<br>• තාරතාවය, විපුලතාවය, ධ්වනිගුණය<br>• සප්තකයේ ස්වර සංඛ්‍යාත | 1. නාද ශබ්ද අතර වෙනස දක්වමින්, විද්‍යාත්මකව සංසන්දනය කරයි.<br>2. නාද උත්පාදනය හා නාදයේ ත්‍රිවිධ ගුණ පිළිබඳ විද්‍යාත්මක චින්තනයේ යෙදෙයි.<br>3. ස්වරයන්ගේ සංඛ්‍යාතයන් ගණනය කරයි.<br>4. සංගීතයේ ඇති භෞතික විද්‍යාත්මක පදනම විග්‍රහ කරයි. | 06 |
| | 9.2 සංගීත අධ්‍යයනයේ, නිර්මාණයේ සහ සංරක්ෂණයේ දී පරිගණකය භාවිතය පිළිබඳ අවබෝධය ලබමින් ප්‍රායෝගික අත්හදා බැලීම්වල යෙදෙයි. | • Playing & Recording Music with computer<br>• E-Learning, E-Music (MIDI)<br>• E-Encyclopedia & Music<br>• Music learning through Internet | 1. සංගීත අධ්‍යයනය කිරීම හා සංගීත නිර්මාණය සඳහා පරිගණකය යොදා ගනී.<br>2. අන්තර් ජාලය අතර වෙනස දක්වමින්, විද්‍යාත්මකව සංසන්දනය කරයි. | 08 |

## 10 ශ්‍රේණිය - පෙරදිග සංගීතය
### වාර සටහන.

### *පළමු වාරය*

| නිපුණතා මට්ටම | අනුක්‍රමික පාඩම් අංකය | විෂය කරුණු / ක්‍රියාකාරකම් | කාලච්ඡේද |
|---|---|---|---|
| 1.1 ආරෝහණයේ සහ අවරෝහණයේ විකෘති ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන /වාදන හැකියා වර්ධනය කරගනී. | 01 | • භෛරව් රාගයේ ස්වර අභ්‍යාස | 01 |
| | 02 | • භෛරව් රාගයේ සරගම් | 01 |
| | 03 | • භෛරව් රාගයේ ලක්ෂණ ගී | 01 |
| | 04 | • භෛරව් රාගයේ මධ්‍යලය ගීතය ගායනය | 02 |
| | 05 | • යමන් රාගයේ ස්වර අභ්‍යාස | 01 |
| | 06 | • යමන් රාගයේ සරගම් | 01 |
| | 07 | • යමන් රාගයේ ලක්ෂණ ගී | 01 |
| | 08 | • යමන් රාගයේ මධ්‍යලය ගීතය ගායනය | 02 |
| | 09 | • භෛරව් රාගයේ සහ යමන් රාගයේ රාග විස්තර | 02 |
| 2.1 ස්වර ලිපි බලා වාදනය කරයි. | 10 | • ස්වර ලිපි කියවීමේ ක්‍රමශිල්ප. | 02 |
| | 11 | • තනුවක් ස්වර ලිපි කිරීමේ ක්‍රම ශිල්ප. | 02 |
| | 12 | • ස්වර පුවරුවෙන් ස්වර ලිපි බලා වාදනය | 02 |
| | 13 | • තෝරා ගත් භාණ්ඩයන් ස්වර ලිපි වාදනය | 02 |

### *දෙවන වාරය*

| | | | |
|---|---|---|---|
| 3.1 ව්‍යවහාරික සංගීතයේ වර්ධනයේ විවිධ අවස්ථා හඳුනා ගනිමින් එක් එක් යුගවලට අයත් ගීත ගායනයේ රසාස්වාදයේ යෙදෙයි | 14 | • ග්‍රැමෆෝන් තැටි යුගයෙන් තෝරාගත් ගීත | 02 |
| | 15 | • මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීත හා නිර්මාණකරුවන්ගේ දායකත්වය | 02 |
| | 16 | • කවිකොළ ගීතවල ස්වභාවය හා මුල් යුගයේ සරල ගීතයක් | 02 |
| 2.1 ස්වර ලිපි බලා වාදනය කරයි | 17 | • ස්වර පුවරුවෙන් ස්වර ලිපි බලා වාදනය | 02 |
| | 18 | • තෝරා ගත් භාණ්ඩයන් ස්වර ලිපි වාදනය | 02 |
| 4.1 සිංහල පද්‍ය ගායනාවන්හි ස්වභාවය හඳුනා ගනිමින් ගායනය කරයි | 19 | • සෙත් ගී වල ස්වභාවය සහ සැළලිහිණි සන්දේශයේ කාව්‍ය ගායනා | 02 |
| | 20 | • ගුත්තිලයේ කාව්‍ය ගායනය | 02 |
| 4.2 ජන ගී වර්ග කරමින් එක් එක් වර්ගයට අයත් ගී පිළිබඳ ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි. | 21 | • ජන ගී වර්ගීකරණය හා විවිධ වර්ගයේ ජන ගී( ගමනගී, බැතිගී, සමාජගී, සෙත්ගී, ) | 01 |
| | 22 | • ආඛ්‍යානාත්මක ගැමි ගී | 02 |
| | 23 | • අනාඛ්‍යානාත්මක බව ගැමි ගී නාමිකව | 04 |
| 6.1.විවිධ ශෛලීන් ආභාසය කරගත් නාට්‍ය සම්ප්‍රදායන් අවබෝධ කරගනිමින් ගායනයේ යෙදෙයි. | 24 | • නාට්‍ය සඳහා නාඩගම් ශෛලියේ ආභාසය ලැබීම | 01 |
| | 25 | • මනමේ සිංහබාහු කාලගෝල නාට්‍ය ඇසුරින්) එක් නාට්‍යයකින් එක් ගීතයක් බැගින් ගායනය/වාදනය | 03 |
| 1.2 හින්දුස්ථානි තාල පද හා සම්බන්ධ අවනද්ධ භාණ්ඩ තබ්ලාවේ නිකුත්වන අකුරු විමර්ශනය කරමින් ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි. | 26 | • හින්දුස්ථානි තාලපදවල අවනද්ධ භාණ්ඩ තබ්ලාවෙන් නිකුත්වන අකුරු | 02 |
| | 27 | • ඒවා තබ්ලාවෙන් වයන ආකාරය | 02 |
| 3.2 ශ්‍රී ලංකාවේ සංගීතයේ උන්නතියට දායක වූ මෙරට සංගීතඥයින් අගය කරමින් ඔවුන්ගේ නිර්මාණ රස විඳියි. | 28 | ඩබ්ලිව්. බී. මකුලොලුව<br>සී. ද. එස්. කුලතිලක | 02 |

## තෙවන වාරය

| | | | |
|---|---|---|---|
| 9.1 නාදයේ ත්‍රිවිධ ගුණ සහ එහි භෞතික පදනම විග්‍රහ කරයි. | 29<br>30<br>31 | • නාද නිෂ්පත්තිය සහ ප්‍රගමනය.<br>• තාරතාවය , විපුලතාවය, ධ්වනිගුණය.<br>• සප්තකයේ ස්වර සංඛ්‍යාත. | 02<br>03<br>02 |
| 5.1 උතුරු ඉන්දීය චිත්‍රපට සංගීත නිර්මාණයේ රාගධාරී පසුබිම සාකච්ඡා කරමින් රසවිඳිමින් ගීත ගායනයේ යෙදෙයි. | 32 | • උතුරු ඉන්දීය චිත්‍රපට සංගීත නිර්මාණයේ රාගධාරී පසුබිම (බෛජුබාව්රා, මධුමතී, අභිමාන්, දේව්දාස්, ජනක් ජනක් පායල් බාජේ., චිත්‍රපටයක එක් ගීතයක් ඇසුරින්.) | 03 |
| 5.2 ශ්‍රී ලංකාවේ සරල සංගීත ක්ෂේත්‍රයේ මව්පිය ගුණවරුණ සඳහන් ගීත ගායනයේ රසවිඳියි. | 33 | • සඳලු තෙලා නැඹිලියට / සොම්නස හෝ සන්තාපය හමුවේ / මිහිමඬලේ අඳුරු කුසේ/ ගමට කලින් හිරු ගීත රසාස්වාදය | 03 |
| 7.1 ගීපද රචනාවක සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් ගීපද නිර්මාණය කර තනු නිර්මාණය කරයි. | 34<br>35 | • පදරචනා ගීතයකට සුදුසු වන ආකාරය මාතෘකාවක් මත පද නිර්මාණය.<br>• සුදුසු තනු නිර්මාණය.<br>කවියක් ගීතයක් වන අයුරු.<br>ගීතවත් දෙබස්. | 01<br>04 |
| 8.1 ශ්‍රාවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි. | 36<br>37 | • ජප්තාල් දීප්චන්දි යන තාල මත නිර්මාණය වූ ගීත ප්‍රස්තාර කිරීම.<br>• සමග්‍රහ, විෂමග්‍රහ අවග්‍රහ සහිත ගීපද ප්‍රස්තාර කරණය | 02<br>01 |
| 9.2 සංගීත අධ්‍යයනයේ , නිර්මාණයේ, සහ සංරක්ෂණයේ දී පරිගණකය භාවිතය පිළිබඳ අවබෝධය ලබමින් ප්‍රායෝගික අත්හදා බැලීම්වල යෙදෙයි. | 38<br>39<br>40 | • Playing & Recording Music with Computer<br>• E-Leaming , E-Music(MIDI)<br>E-Encyclopaedia & Music<br>• Music leaming through Internet | 04<br>02<br>02 |
| 3.2 ශ්‍රී ලංකාවේ සංගීතයට දායක වූ මෙරට සංගීතඥයින් අගය කරමින් ඔවුන්ගේ නිර්මාණ රස විඳියි. | 41 | • ලයනල් රංවල<br>• රෝහණ බැද්දගේ | 02 |
| 3.3 උතුරු ඉන්දීය අධ්‍යතන ශාස්ත්‍රීය සංගීතඥයින් හඳුනා ගනිමින් ඔවුන්ගේ නිර්මාණ අගය කරයි. | 42<br>43 | • හරිප්‍රසාද් චෞරාසියා, රවි ශංකර්<br>• ජග්ජිත්සිං, රහුමාන් | 01<br>01 |
| 3.4.ලබා ගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගිකව ඉදිරිපත් කරමින් සතුට ලබයි. | 44 | • වාර්ෂික විවිධ ප්‍රසංගය | 05 |

# භෛරවී ස්වර අභ්‍යාස

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1 :** ආරෝහණයේ සහ අවරෝහණයේ ඇති විකෘති ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 01

**ඉගෙනුම් පල** :
- ස්වර අභ්‍යාස නිවැරදි ව ගායනය කරමින් ස්වර ඥානය වර්ධනය කර ගනියි.
- රාගධාරී සංගීතයේ ස්වර අභ්‍යාස ගායනය වැදගත් වන බව පිළිගනියි.
- විවිධ රටාවන්ට අනුව භෛරවී රාගයෙන් ස්වර අභ්‍යාස ගොඩ නැගීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්:** සර්පිනාව / තාම්පුරාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

ශාස්ත්‍රීය සංගීත අධ්‍යාපනයේ දී ස්වර අභ්‍යාස පළමුවත්, සර්ගම් මධ්‍යලය ගීත දෙවනුවත් යොදා ගැනීම සාම්ප්‍රදායික පිළිවෙතයි. ස්වර ගායන හුරුව ලබා දීමේ දී ගීත පළමුව යොදා ගැනීම සිසුනට පහසු ය. භෛරවී රාගයේ ආරෝහණයේ සහ අවරෝහණයේ යෙදී ඇති ස්වර රටාව අනුව රාගයට අදාළ ස්වර අභ්‍යාස ගොඩ නගා ගත යුතුවේ. ස්වර අභ්‍යාස ප්‍රගුණ කිරීමෙන් රාගය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත හැකි වේ. මේවා ප්‍රගුණ කිරීමෙන් සර්ගම් මධ්‍යලය ගීත හා තානාලංකාර ගැයීමට වැයීමට රුකුලක් වෙයි. 10 ශ්‍රේණියට ගැළපෙන සේ භෛරවී රාගයෙන් ස්වර අභ්‍යාස කීපයක් ගොඩ නගන්න.

උදා: නි ස ග රි ස, නි ස ග ම ග රි ස, නි ස ග ම ප ම ග රි ස
නි ස ග ම ප ධ ප ම ග රි ස, නි ස ග ම ප ධ නි ධ ප ම ග රි ස

නි ස ග ම ප ම ග ම, ග ම ප ධ නි ධ ප ම,
ග ම ප ධ නි ස නි ධ ප ම, ග ම ප ධ නි ස රි ස නි ධ ප ම
ග ම ප ම ග රි ස - ,

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- භෛරවී රාගාශ්‍රිත සරල ගීයක් හෝ ගී කිහිපයක කොටස් ගයන්න. එහි විචිත්‍රත්වය පිළිබඳ විමසන්න.
- ශාස්ත්‍රීය ගායනයේ වැදගත් අංගයක් වන තානාලංකාරවලට පවා ස්වර අභ්‍යාස භාවිත කරන බව උදාහරණ මගින් පැහැදිලි කරන්න. විස්තර කරන්න.

(මිනිත්තු 05)

**පියවර 02**

- ඒ අනුව භෛරවී රාගාශ්‍රිත ස්වර අභ්‍යාස ඇතුළත් දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කර ඒ පිළිබඳ ව දැනුවත් කරන්න
- දෘශ්‍යාධාරයෙහි අඩංගු ස්වර අභ්‍යාස පියවරින් පියවර ගායනයට හුරු කරවන්න.
- නැවත නැවත ගායනයෙහි නිරත කරවන්න.

(මිනිත්තු 15)

**පියවර 03**

- සිසුන් කණ්ඩායම් කරන්න.
- රාගයට අදාළ ව නව ස්වර අභ්‍යාසයක් නිර්මාණය කිරීමට හා ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒ ඒ කණ්ඩායම් නිර්මාණය කළ ස්වර අභ්‍යාස පන්තිය හමුවේ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.

(මිනිත්තු 15)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

සිසුන් නිර්මාණය කළ ස්වර අභ්‍යාස නිර්මාණ හා ගායනය ඇගයීමට ලක් කරන්න.

**පසු අභ්‍යාස** : වාර්ෂික විවිධ ප්‍රසංගය සඳහා භෛරවී රාගයේ ස්වර අභ්‍යාස ඇසුරින් මිනිත්තු 05 කට සරිලන නිර්මාණයක් කරන්න.

ක්‍රියාකාරකම 2

# භෛරවී රාගය- සර්ගම්

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග ශිල්පාංග හඳුනා ගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ආරෝහණයේ සහ අවරෝහණයේ ඇති විකෘති ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :
- ස්වර ප්‍රස්තාර ගායනය කිරීමේ හැකියාව ලබයි.
- සර්ගම් මතකයෙන් ගායනය කරයි.
- සර්ගම් ගීතයේ ලක්ෂණ පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- රාගධාරී සංගීතයේ සර්ගම් වැදගත් වන බව පිළිගනියි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුමෙහි ඇතුළත් සර්ගම් ලියන ලද දෘශ්‍යාධාරකය හෝ ඡායා පිටපත්
- තබ්ලාව / සර්පිනාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

සර්ගම් ස්වර ''මාලිකා'' නමින් ද හඳුන්වනු ලබයි. සෑම රාගයකටම සර්ගම් ගීයක් ඇත. සර්ගම්වල රාගයට අදාළ රාග සංගති ඇතුළත් වෙයි. ස්වරවලින් පමණක් නිර්මාණය වී ඇත. මෙම සර්ගම් ගායන / වාදන අභ්‍යාස තුළින් රාග ඥානය, ස්වර ඥානය වර්ධනය වන අතර මධ්‍යලය ගීත ගැයීමට උපකාරී වෙයි. නිවැරදි ගායනය හුරුවන තෙක් වරින් වර සර්ගම් ගායනයේ / වාදනයේ සිසුන් යොමු කිරීම ගුරුවරයාගේ වගකීමකි. පහත දැක්වෙන සර්ගම් මෙම ශ්‍රේණිය සඳහා වඩාත් සුදුසු ය.

1. ස ධ ප ධ / ම ප ග ම / නි ධ - ස / - රි ග ම

2. ම ග රි / ස රි නි̣ / ස - ධ̣ /නි̣ ස -/

**පාඩම සංවර්ධනය** :

**පියවර 01** මීට පෙර අධ්‍යයනය කළ ස්වර අභ්‍යාසයක් සිසුන් සමග ගායනය කරන්න. එය ස්වේච්ඡාවෙන් ගායනයට ඉදිරිපත් වන සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. භෛරවී රාගයේ ස්වරූපය ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න. සර්ගම්වල භෛරවී රාග සංගති ඇතුළත් බව පෙන්වා දෙන්න.

(මිනිත්තු 5)

**පියවර 02**
- ඔබ විසින් සකසා ගත් භෛරවී සර්ගම් දෘශ්‍යාධාරකය ප්‍රදර්ශනය කරන්න.
- ''සර්ගම්'' පාදයෙන් පාදය නාද මාලාව තහවුරු වන තෙක් ගායනය කරවන්න.
- සර්ගම් රසවත් ව ගැයීමට සුදුසු ක්‍රමවේදයක් යොදා ගන්න.

(මිනිත්තු 20)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් ගායනය කිරීමට අවස්ථාව දෙන්න.
- සදොස් තැන් නිදොස් කරන්න.
- සමාලෝචනයෙහි යෙදෙන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

Ⅱ පියවරෙහි අධ්‍යයනය කළ සර්ගම් ගායනය / වාදනය ඇගයීමට ලක් කරන්න. (මිනිත්තු 5)

**පසු අභ්‍යාස :** භෛරවී සර්ගම් ප්‍රස්තාරය තුළ ගැබ් වී ඇති රාග සංගති (ස්වර ඛණ්ඩ) ඇතුළත් සටහනක් සකස් කරවන්න.

**ඇමුණුම :**

1. **ස්ථායි**

ස ධ ප ධ / ම ප ග ම / නි ධ - ස / - රි ග ම /

ග රි ස - / ධ̣ නි̣ ස රි / නි̣ ස ම ම / ග ග රි ස /

**අන්තරා**

නි̣ ස ග ම / ධ ම ධ නි / ස̇ - ස̇ - / ග̇ ග̇ රි̇ ස̇ /

නි ස̇ ග̇ ම̇ / ප̇ ග̇ - ම̇ / ග̇ රි̇ ස̇ - / ග̇ ග̇ රි̇ ස̇ /

ස̇ ස̇ නි නි / ධ ධ පප/ ම ම ග ග / රි රි ස - /

2. **ස්ථායි**

ම ග රි / ස රි නි̣ / ස - ධ̣ / නි̣ ස -/

ස රි ග / ම ප ධ / ප ම ග / රි ස - /

**අන්තරා**

ධ ම ධ / නි ස̇ - / ධ නි ස̇ /රි̇ ස̇ - /

ස̇ ග̇ රි̇ / ස̇ නි ධ / ප ම ග / රි ස - /

ක්‍රියාකාරකම 3

# භෛරවී ලක්ෂණ ගී

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ආරෝහණයේ සහ අවරෝහණයේ ඇති විකෘති ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනී.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :
- ලක්ෂණ ගීත නිර්වචනය කරයි.
- ලක්ෂණ ගීත පුහුණු වීමේ ඇති අගය පිළිගනියි.
- ලක්ෂණ ගීත නිවැරදි ව ගායනය කරයි.
- ලක්ෂණ ගීත ප්‍රස්තාරය ඇසුරෙන් එහි ඇතුළත් රාග විස්තර උපුටා දක්වයි.
- රාගධාරී සංගීතය ප්‍රගුණ කිරීමේ දී ලක්ෂණ ගීතවල ඇති වැදගත්කම සාකච්ඡා කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- සර්පිනාව, තාම්පුරාව, තබ්ලාව හෝ විද්‍යුත් තබ්ලාව
- ලක්ෂණ ගීත ස්වර ප්‍රස්තාරය ලියන ලද දෘශ්‍ය ආධාරකය / ඡායා පිටපත්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

කිසියම් රාගයකට අදාළ ව ලක්ෂණ ඇතුළත් කරමින් තාලයකට අනුව ප්‍රබන්ධ කර ඇති ගීත ශෛලිය ලක්ෂණ ගී නමින් හැඳින්වෙයි. සෑම රාගයකට ම ලක්ෂණ ගී ප්‍රබන්ධ කොට ඇත. එක් එක් රාගයට අදාළ ආරෝහණ - අවරෝහණ, වාදී සංවාදී ආදී විස්තර පහසුවෙන් මතක තබා ගැනීමට ලක්ෂණ ගීත ඉවහල් වන බව සිසුන්ට පැහැදිලි කරන්න. එබැවින් සංගීතය හදාරන ආධුනිකයෙකුට ලක්ෂණ ගීත ඉතා වැදගත් වෙයි. මධ්‍යලය ගීත මෙන් ම ලක්ෂණ ගීත ද රසවත් බව පැහැදිලි කරන්න. මේ සඳහා ඔබට පහත දැක්වෙන ගීවලින් එකක් තෝරා ගත හැකි ය.

1. වියොව කුළුණ සිරිගර රස
2. සපිරුණු මේ රාග භෛරවි
3. භෛරවී කහීමන මානි

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- භෛරවී රාගයේ ලක්ෂණ ගීතය ගුරුවරයා රසවත් ව ගායනා කර පන්තියට ඉදිරිපත් කරන්න.
- එම ගීතයේ පද මාලාවේ ගැබ් වී ඇති ලක්ෂණ පිළිබඳ ව සිසුන්ගෙන් විමසමින් සාකච්ඡාවක යෙදෙන්න.

(මිනිත්තු 08)

**පියවර 02**
- භෛරවී රාගයේ ලක්ෂණ ගීතය ලියන ලද දෘශ්‍ය ආධාරකය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- ලක්ෂණ ගීතය ප්‍රස්තාර කර ගැනීමට අවස්ථාව දෙන්න.
- සමස්ත ගීතය රසවත් ව ගායනා කරන්න.
- ගීතයේ ස්ථායි කොටස පාදයෙන් පාදය සිසුන් සමග ගායනා කරන්න.

- ස්ථායි කොටසේ නාදමාලාව තහවුරු වූවාට පසුව අන්තරා කොටස ද පුහුණු කරවන්න.
- භෛරවී රාගයේ ස්වර විහිදෙන ආකාරය සහ රාග සංගතිවල ස්වභාවය පිළිබඳ අවධාරණය කරමින් සමස්ත ගීත සිසුන් සමග ගායනා කරන්න.
- ගීතවල කොටස් අහඹු ලෙස වාදනය කර දක්වමින් ඒවා හඳුනා ගැනීමට සලස්වන්න.

(මිනිත්තු 16)

**පියවර 03**

- ලක්ෂණ ගීතය ගයමින් භෛරවී රාගයේ විස්තර වගුවක සටහන් කරන්න.
- එම විස්තර අභ්‍යාස පොතේ ලකුණු කරන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කරනු ලබන ලක්ෂණ ගීත ගායනයේ ඇති ප්‍රබලතා හා දුබලතා දැක්වීමට අනෙක් සිසුන්ට අවස්ථාව දෙන්න.
- ගායනයේ දුර්වලතාවයන් ඇත්නම් මග හරවා ගැනීමට මග පෙන්වන්න.

(මිනිත්තු 08)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

කණ්ඩායම් වශයෙන් ඔවුන්ගේ ප්‍රබලතා දුබලතා ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 08)

**අතිරේක උදව්** :

- 2007 - 10 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිටු අංක 18
- ක්‍රමික පුස්තක් මාලිකා – භාත්ඛණ්ඩේ පඬිතුමා

# භෛරවී රාගයේ මධ්‍යලය ගී

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1 :** ආරෝහණයේ සහ අවරෝහණයේ ඇති විකෘති ස්වර හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනී.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල** :
- භෛරවී රාගාශ්‍රිත නාදමාලා හඳුනා ගනියි.
- භෛරවී රාගය සර්ව කෝමල රාගයක් බව ප්‍රකාශ කරයි.
- භෛරවී මධ්‍යලය ගීත නිවැරදි ව ගායනය කිරීමේ කුසලතාවය ලබයි.
- රාග රස උද්දීපනය වන සේ භාවාත්මක ව ගායනා කරයි.
- භෛරවී රාගය ආශ්‍රිත තනු නිර්මාණයට පෙළඹෙයි.
- භෛරවී රාගය ආශ්‍රිත සරල ගී රස වින්දනයට යොමු වෙයි.

**ගුණාත්මක යෙදවුම්:**
- සර්පිනාව, තබ්ලාව / විද්‍යුත් තබ්ලාවක්, තාම්පුරාවක්
- 2007, 10 ශ්‍රේණි ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇමුණුම් අංක 1.1.4.1 හි ඇති පාරමිතා බල, කවාලා විලඳ ජාතී, කවුරුදෝ අර කවුළුවෙන්, එන්න මද නලේ, කලිඳු ගංගා, මහ බෝධි මුලේ, සුපිපුණු සුගන්ධ යුත් යන ගී අතරින් එක් ගීතයක් අඩංගු CD / VCD / DVD තැටි එකක්
- මධ්‍යලය ගීතය ලියන ලද දෘශ්‍යාධාරකයක් හෝ ඡායා පිටපත්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

භෛරවී රාගය සර්ව කෝමළ ස්වර යෙදෙන රාගයක් සේ සම්මතව තිබුණත් ප්‍රකෘති විකෘති ස්වර දොළසම මෙම රාගයේ භාවිත කෙරේ. සරල රූපයෙන් යුක්ත උත්තරාංග වාදී රාගයකි. කෝමළ ස්වර භාවිත බැවින් කරුණා, භක්ති රසය ජනනය වේ. මධ්‍යලය ගීතවලට අමතරව, භජන්, තුම්රි, ගසල් වැනි ගායන ශෛලීන් විශේෂයෙන් මෙම රාගයෙන් ඉදිරිපත් කෙරේ. ඒ අනුව භෛරවි රාගාශ්‍රිත ගීතයක් ගයා ඒ ඇසුරෙන් රාගයේ ස්වභාවය පහදා දෙන්න.

භෛරවී රාගයට අයත් නිර්දේශිත මධ්‍යලය ගීත ලැයිස්තුවක් පහත දැක්වේ. ඉන් එක් ගීතයක් හෝ ඔබ පාසලේ සිසුන්ගේ දක්ෂතාවලට ගැළපෙන පරිදි ගීත කිහිපයක් හෝ ඔබට තෝරා ගත හැකි ය.

1. මනහර ගීත නාද ඇසේ
2. විහිදා රශ්මී පායන සූර්යා
3. අබතොරි භාංකී
4. භවානී දයානී
5. අදර සයුරකී

**පාඩම සංවර්ධනය :**

**පියවර 01** භෛරවි රාගාශ්‍රිත සරල ගීයක් ශ්‍රවණයට සලස්වන්න. ගුරුතුමා සිසු සහභාගිත්වය ඇති ව සරල ගීය ගයන්න. ගීතයේ රස භාවයන් පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න. භක්ති ගීත නිර්මාණයේ දී භෛරවී රාගය වැඩි වශයෙන් ඇසුරු කර ගත හැකි බව පහදා දෙන්න.

(මිනිත්තු 10)

**පියවර 02** ඔබ විසින් තෝරා ගත් භෛරවී රාගයේ මධ්‍යලය ගීතය ඇතුළත් දෘශ්‍යාධාරකය ප්‍රදර්ශනය කරන්න. ඡායා පිටපත් සිසුන්ට ලබා දෙන්න.

- භෛරවී රාගයේ මධ්‍යලය ගීතය ස්ථායි අන්තරා වශයෙන් රසවත් ව ගයා දක්වන්න.
- තබ්ලා වාදනයේ නිපුණ සිසුවකුගේ සහායෙන් හෝ විද්‍යුත් තබ්ලාවක ආධාරයෙන් ගැයීමට යොදා ගැනීම වඩාත් ඵලදායි වේ.
- මධ්‍යලය ගීතයේ ස්ථායි, අන්තරා කොටස් ගී පාදයෙන් පාදය සිසුන්ට තහවුරු වන සේ ගායනයෙහි යොදවන්න.
- මධ්‍යලය ගීතයේ ස්වර ප්‍රස්තාරය පියවරෙන් පියවර ගායනයට සලස්වන්න.

(මිනිත්තු 30)

**පියවර 03**

- තබ්ලා සහය වාදනය සමග මධ්‍යලය ගීතය කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.
- උපස්ථම්භනය ලබා දෙන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

: කණ්ඩායම් වශයෙන් ඔවුන්ගේ ප්‍රබලතා දුබලතා ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස** :

- වාර අවසාන / වාර්ෂික විවිධ ප්‍රසංගය සඳහා භෛරවී මධ්‍යලය ගීතය ඉදිරිපත් කිරීම සඳහා නිරන්තර අභ්‍යාසයෙහි නිරත වන්න.
- භෛරවී රාගයට අයත් සරල ගීත ලැයිස්තුවක් පිළියෙල කරන්න.

**අතිරේක උදව්** :

- 2007 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය
- අන්තර්ජාලය හෝ VCD / DVD හරහා භෛරවී මධ්‍යලය ගීත අඩංගු වීඩියෝ දර්ශනයක් නරඹන්න.
- ක්‍රමික් පුස්තක් මාලිකා I – භාත්ඛණ්ඩේ පඬිතුමා
- අභිනව මූලික ගීත - ඩබ්ලිව්. බී. මකුලොලුව
- භාවික ගීත - වින්සන්ට් සෝමපාල
- ඛ්‍යාල ගීත - ආනන්ද ජයසිංහ
- ශිෂ්‍ය ගීත - එම්. ජී. පෙරේරා

# යමන් ස්වර අභ්‍යාස

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1:** ආරෝහණයේ සහ අවරෝහණයේ විකෘති ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනී.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 01

**ඉගෙනුම් පල** :
- ස්වර අභ්‍යාසයේ ක්‍රමික අනුපිළිවෙල නිවැරදි ව ගායනය කරයි.
- ස්වර අභ්‍යාස ගායනය වැදගත් වන බව පිළිගනියි.
- වෙනත් නිර්මාණ සඳහා අත්දැකීම් පුළුල් කර ගනියි.

**ගුණාත්මක යෙදවුම් :**
- සර්පිනාව / තබ්ලාව / තාම්පුරාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

යමන් රාගයේ ආරෝහණයේ සහ අවරෝහණයේ යෙදී ඇති ස්වර රටාව අනුව රාගයට අදාළ ස්වර අභ්‍යාස ගොඩනගා ගත යුතු වේ. ශ්‍රැතියට අනුව නිවැරදි ස්වරවල ස්ථානීය අගය ඇතිව ගායනය කළ යුතු ව ඇත. ස්වර අභ්‍යාස ප්‍රගුණ කිරීමෙන් සර්ගම්, මධ්‍යලය ගීත හා තානාලංකාර ගැයීමට වැයීමට මෙය රුකුලක් වේ. මෙම ස්වර අභ්‍යාස ප්‍රගුණ කිරීම තුළින් රාගයට තානාලංකාර සාදා ගැනීමට හා නිර්මාණ කාර්යයට ඉතා පහසු වෙයි. මෙම ස්වර අභ්‍යාස ගොඩ නගා ගැනීමේ දී කිසියම් රටාවකට පිළිවෙලකට කළ යුතු වෙයි. ඕනෑම රාගයකට ස්වර අභ්‍යාස නිර්මාණය කළ හැකි ය. ඔබගේ පාසලේ 10 ශ්‍රේණියට ගැළපෙන සේ අභ්‍යාස කීපයක් ගොඩ නගන්න.

යමන් රාගයේ ස්වර අභ්‍යාස සඳහා නිදසුනක්:

නි̣ රි ස, නි̣ රි ග රි ස, නි̣ රි ග ම́ ග රි ස, නි̣ රි ග ම́ ප ම́ ග රි ස
නි̣ රි ග ම́ ප ධ ප ම́ ග රි ස නි̣ රි ග ම́ ප ධ නි ධ ප ම́ ග රි ස
නි̣ රි ග ම́ ප ධ නි ස̇ නි ධ ප ම́ ග රි ස

මෙවැනි අභ්‍යාස අඩුලයකින් පුහුණු කිරීම ආරම්භ කර ක්‍රම ක්‍රමයෙන් ලය වැඩි කිරීමට පුහුණු කරන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- යමන් රාගයේ මධ්‍යලය ගීතයේ මුල් පාදය ගයා අලංකාරික තානයක් ගයන්න.
- ශාස්ත්‍රීය ගායනයේ වැදගත් අංගයක් වන තානාලංකාරවලට පවා ස්වර අභ්‍යාස භාවිත කරන බව විස්තර කරන්න.
- යමන් රාගාශ්‍රිත ස්වර අභ්‍යාස ඇතුළත් දෘශ්‍යාධාරකයක් ප්‍රදර්ශනය කරන්න.

(මිනිත්තු 08)

**පියවර 02**
- දෘශ්‍යාධාරකයේ / ඡායා පිටපත්වල අඩංගු ස්වර අභ්‍යාස පියවරින් පියවර ගායනයට හුරු කරන්න.
- නැවත නැවත ගායනයෙහි නිරත කරවන්න.

(මිනිත්තු 20)

**පියවර 03**
- සිසුන් කණ්ඩායම් කරන්න.
- ඒ ඒ කණ්ඩායම්වලට සිය ස්වර අභ්‍යාස පන්තිය හමුවේ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.

(මිනිත්තු 07)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිර්මාණය කළ ස්වර අභ්‍යාස නිර්මාණ හා ගායනය ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 05)

**පසු අභ්‍යාස** : වාර්ෂික විවිධ ප්‍රසංගය සඳහා යමන් රාගයට අනුව ස්වර අභ්‍යාස ඇසුරින් විනාඩි 3කට සරිලන නිර්මාණයක් පුහුණු වන්න.

ක්‍රියාකාරකම 6

# යමන් රාගය - සර්ගම්

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1 :** ආරෝහණයේ සහ අවරෝහණයේ විකෘති ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනී.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 01

**ඉගෙනුම් පල** :
- තීව්‍ර මධ්‍යමය ඇතුළත් ස්වර ප්‍රස්තාර ගායනය කිරීමේ හැකියාව ලබයි.
- සර්ගම් ගීතයේ ලක්ෂණ පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- රාගධාරී සංගීතයේ සර්ගම් වැදගත් හා අත්‍යවශ්‍ය වන බව පිළිගනියි.
- වෙනත් නිර්මාණ සඳහා අත්දැකීම් පුළුල් කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්:**
- 9 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ඇමුණුම 1.1.4.3 සර්ගම් ඇතුළත් දෘශ්‍යාධාරකය හෝ ඡායා පිටපත්
- තබ්ලාව / සර්පිනාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

''සර්ගම්'' ස්වර මාලිකා නමින් ද හඳුන්වනු ලබයි. රාගයක ආරෝහණ අවරෝහණ ස්වර ගමන් කරන ආකාරය හඳුනා ගැනීම ඉතා වැදගත් වෙයි. සෑම රාගයකටම සර්ගම් ගී ප්‍රබන්ධ කර ඇත. මේවායෙහි රාගයට අදාළ රාග සංගති ඇතුළත් වෙයි. ''සර්ගම්'' ස්වරවලින් පමණක් ගැයෙන අතර තාලයක් අනුව ප්‍රබන්ධ වී ඇත. මෙම සර්ගම් ගායන / වාදන අභ්‍යාස තුළින් රාග ඥානය, ස්වර ඥානය වර්ධනය වන අතර මධ්‍යලය ගීත ගැයීමට ද මහෝපකාරී වෙයි.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- වින්සන්ට් සෝමපාල සූරීන්ගේ ''භාවික ගීත'' පොතේ එන රමණීය සිරිසාර මගේ මෑණී ලංකා යන ගීතය හෝ ගාමිණී පැරකුම් අපේ යන ගීතය සිසුන් සමග ගායනය කරන්න. ස්වේච්ඡාවෙන් ගායනයට ඉදිරිපත් වන සිසුන්ට ද අවස්ථාව ලබා දෙන්න.
- යමන් රාගයේ ස්වරූපය පිළිබඳ ව ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙය වන්න.

(මිනිත්තු 07)

**පියවර 02**
- යමන් රාගයේ සර්ගම් දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- පාදයෙන් පාදය නාද මාලාව තහවුරු වන තෙක් ගායනය කරවන්න.
- සර්ගම් රසවත් ව ගැයීමට සුදුසු ක්‍රමවේදයක් යොදා ගන්න.

(මිනිත්තු 20)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් ගායනයට අවස්ථාව දෙන්න.
- සදොස් තැන් නිදොස් කරන්න.

(මිනිත්තු 08)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

සර්ගම් ගීත ගායන / වාදන ඇගයීමට ලක් කරන්න. (මිනිත්තු 05)

**පසු අභ්‍යාස** : යමන් සර්ගම් ප්‍රස්තාරය තුළ ගැබ් වී ඇති රාග සංගති (ස්වර ඛණ්ඩ) නම් කරන්න.

ක්‍රියාකාරකම 7

# යමන් ලක්ෂණ ගී

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ආරෝහණයේ සහ අවරෝහණයේ විකෘති ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනී.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :
- ලක්ෂණ ගීත නිර්වචනය කරයි.
- ලක්ෂණ ගීත පුහුණු වීමේ ඇති අගය පිළිගනියි.
- ලක්ෂණ ගීත ප්‍රස්තාරය ඇසුරෙන් එහි ඇතුළත් රාග විස්තර ලියයි.

**ගුණාත්මක යෙදවුම්** :
- සර්පිනාව, තබ්ලාව, තාම්පුරාව, ඉලෙක්ට්‍රොනික් තබ්ලාව
- ගීත ස්වර ප්‍රස්තාරය ලියන ලද දෘශ්‍යාධාරකය, ඡායා පිටපත්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

කිසියම් රාගයකට අනන්‍ය වූ ලක්ෂණ ඇතුළත් කරමින් තාලයකට අනුගතව ප්‍රබන්ධ කර ඇති ගීත ලක්ෂණ ගී නමින් හැඳින්වෙයි. සෑම රාගයකට ම ලක්ෂණ ගීත ප්‍රබන්ධ කොට ඇත. රාගයකට අයත් විස්තර හඳුනා ගැනීමටත් රාග හා තාල අවබෝධය ලබා ගැනීමටත් ලක්ෂණ ගීත රුකුලක් වෙයි. ලක්ෂණ ගීත ගයා රාග විස්තර මතකයේ රඳවා ගැනීමට පහසුවෙන් ඒවා ප්‍රායෝගික ව යොදා ගැනීමෙන් රාගයේ ස්වර සංගති හා රාගයට අදාළ ස්වර ගායනය වාදනය පිළිබඳ දක්ෂතා ද ගොඩ නැගේ. මේ නිසා සංගීතය හදාරන ආධුනිකයෙකුට ලක්ෂණ ගීත වැදගත් වෙයි. යමන් රාගයේ රසය, භාවය ජනිත කරන පහත දැක්වෙන ලක්ෂණ ගීතවලින් එකක් මේ සඳහා යොදා ගත හැකි ය.

1. නිති විඳිමු සුමධුර යමන රාග රස
2. සබ ගුණිජන

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- ගුරුවරයා විසින් යමන් රාගයේ ලක්ෂණ ගීතය රාග රස දනවන පරිදි ගායනය කරන්න.
- එම ගීතවල පද මාලාවෙන් කියවෙන අරුත් පිළිබඳ ව සිසුන් ගෙන් විමසමින් සාකච්ඡාවක යෙදෙන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- යමන් රාගයේ ලක්ෂණ ගීතය ලියන ලද දෘශ්‍ය ආධාරකය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- ලක්ෂණ ගීතය ප්‍රස්තාර කර ගැනීමට අවස්ථාව දෙන්න.
- සමස්ත ගීතය ප්‍රස්තාරයට අනුව ගායනා කරන්න.
- ගීතයේ ස්ථායි කොටස පාදයෙන් පාදය සිසුන් සමග ගායනා කරන්න.
- ස්ථායි කොටසේ නාද මාලාව තහවුරු වූවාට පසු ව අන්තරා කොටස ද ඒ ආකාරයට ම පුහුණු කරවන්න.

- යමන් රාගයේ ස්වර විහිදෙන ආකාරය සහ රාග සංගතිවල ස්වභාවය අවධාරණය කරන්න.
- ගීතයේ කොටස් අහඹු ලෙස වාදනය කර දක්වමින් ඒවා හඳුනා ගැනීමට සලස්වන්න.

(මිනිත්තු 20)

**පියවර 03**
- සිසුන් කුඩා කණ්ඩායම්වලට බෙදන්න.
- යමන් රාගයේ විස්තර වගු සටහනක ලකුණු කිරීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායම් වශයෙන් ලක්ෂණ ගීතය ගායනා කරවන්න.
- ගායනයේ දුර්වලතා ඇත්නම් මග හරවා ගැනීමට මග පෙන්වන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

කණ්ඩායම් වශයෙන් ඔවුන්ගේ ප්‍රබලතා දුබලතා ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 05)

**අතිරේක උදව් :**
- 2007 - 9 වන ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය
- භාවික ගීත - වින්සන්ට් සෝමපාල

# යමන් රාගය මධ්‍යලය ගී

**නිපුණතාව 1.0** : සංගීතයේ ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1**: ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනී.

**කාලච්ඡේද සංඛ්‍යාව**: 02

**ඉගෙනුම් පල** :
- යමන් රාගයේ යෙදෙන සුවිශේෂ ස්වර හා අංග හඳුනා ගනියි.
- යමන් මධ්‍යලය ගීත නිවැරදි ව ගායනය කිරීමේ කුසලතාවය ලබයි.
- රාග රස උද්දීපනය වන සේ භාවාත්මක ව ගායනා කරයි.
- යමන් රාගය ආශ්‍රිත තනු නිර්මාණයට පෙළඹෙයි.
- යමන් රාගය ආශ්‍රිත සරල ගී හඳුනා ගනියි.

**ගුණාත්මක යෙදවුම්** :
- සර්පිනාව, තබ්ලාව, තාම්පුරාව, විද්‍යුත් තබ්ලාව
- මධ්‍යලය ගීත ස්වර ප්‍රස්තාරය ලියන ලද දෘශ්‍ය ආධාරකය / ඡායා පිටපත්
- සාදු දන්ත දා, සැන්දෑ කළුවර ගලා හැලෙන විට ආදී ගීත ඇතුළත් C D පටයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

යමන් රාගය මෙතෙක් සිසුන් අධ්‍යයනය කළ රාගවලට වඩා වෙනස් වනුයේ තීව්‍ර මධ්‍යමය යෙදෙන නිසා ය. මේ පිළිබඳ ව සිසුන්ගේ අවධානය යොමු කළ යුතු ව ඇත. පාඩම ආරම්භයේ දී යමන් රාගය ආශ්‍රිත ව නිර්මාණය වී ඇති සරල ගී කොටස ප්‍රායෝගික ව සිසුන්ට හඳුනා ගැනීමට ඉඩ සැලසීම ඵලදායී වනු ඇත. ඉඩකඩ ඇති අවස්ථාවන්හි දී භෛරවී සහ යමන් රාග නිරන්තර අභ්‍යාසයේ යොදවන්න. කරුණා රසය ඉස්මතු කෙරෙන ගීත, නිර්මාණය සඳහා යමන් රාගය වැඩි වශයෙන් යොදා ගෙන ඇත. පාසල් පද්ධතිය තුළ දීර්ඝ කාලයක සිට භාවිත වූ යමන් රාගයට අයත් නිර්දේශිත මධ්‍යලය ගීත ලැයිස්තුවක් පහත දැක්වේ. ඉන් එක් ගීතයක් ඔබ කැමති පරිදි තෝරා ගන්න.

1. සදාකල් වඳිමි මා පාද යුග
2. දිනිඳා අවරේ බැස යන්නේ
3. ගුරු බින කෛසේ ගුණගාවේ
4. පියා කී නජරියා
5. තරු කැට මෝරන
6. ශාක්‍යමුනී සිරිපා

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- ඉහත දක්වා ඇති හෝ උචිත රාගාශ්‍රිත සරල ගීයක් ගයන්න. එසේ නැත්නම් ශ්‍රවණයට සලස්වන්න. සිසු සහභාගිත්වය ඇතිව සරල ගීතය ගයමින් ගීතයේ රස භාවයන් පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න. කරුණා රසය ඉස්මතු කළ හැකි නිර්මාණ ගැන කෙටි සාකච්ඡාවක් කරන්න. යමන් රාගයේ තීව්‍ර මධ්‍යමයෙන් දනවන රසභාව, ගීත කොටස් ගායනය මගින් නිදසුන් දක්වමින් එහි විශේෂත්වය පෙන්වා දෙන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- යමන් රාගයේ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න.
- යමන් රාගයේ ගීතය ස්ථායි අන්තරා වශයෙන් රසවත් ව ගයා පෙන්වන්න.
- මධ්‍යලය ගීතයේ ස්ථායි අන්තරා කොටස් පාදයෙන් පාදය සිසුන්ට තහවුරු වන සේ ගායනය පුහුණු කරන්න.
- මධ්‍යලය ගීතයේ ස්වර ප්‍රස්තාරය පියවරෙන් පියවර ගායනයට සලසන්න.
- තබ්ලා වාදනයට අනුව මධ්‍යලය ගීතය ගායනය කිරීමට අවස්ථාව සලසා දෙන්න. (විද්‍යුත් තබ්ලාවක් වුව ද යොදා ගත හැකි ය.)

(මිනිත්තු 30)

**පියවර 03**
- තබ්ලා සහාය වාදනය සමග මධ්‍යලය ගීතය කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.
- උපස්ථම්භනය ලබා දෙමින් සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

කණ්ඩායම් වශයෙන් ඔවුන්ගේ ප්‍රබලතා දුබලතා ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 10)

**අතිරේක උදව්** :
- 2007 - 9 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අන්තර්ජාලය හරහා V C D / DVD යමන් මධ්‍යලය ගීත අඩංගු වීඩියෝ දර්ශන නරඹන්න.
- පිටු අංක 8 හි දැක්වෙන සංගීත ග්‍රන්ථ

ක්‍රියාකාරකම 9

# භෛරවී / යමන් රාග විස්තර

**නිපුණතාව 1.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.3 :** රාග භාවය එකිනෙක වෙනස්වීමට බලපාන හේතු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල** :
- රාග විස්තර හා බැඳි සංකල්ප නිර්වචනය කරයි.
- රාග විස්තර පිළිබඳ දැනුවත් වීමේ අවශ්‍යතාවය පිළිගනියි.
- එක් එක් පාරිභාෂික පදවලට අදාළ ව උදාහරණ ඉදිරිපත් කරයි.
- ප්‍රායෝගික ව භාවිතා කිරීමේ හැකියාව ලබයි
- භෛරවී / යමන් ලක්ෂණ ගීත තුළින් මෙම කරුණු වෙන්කර ගැනීමට හැකියාව ලබයි.

**ගුණාත්මක යෙදවුම්:**
- සර්පිනාව, තබ්ලාව
- නිති විඳිමු. සුමධුර යමන් රාග රස ලක්ෂණ ගීය.
- භෛරවී ලක්ෂණ ගීය, වියොව කුළුන, සිරිගර රස, සපිරුණු මේ රාග භෛරවී

මෙම ගීත ස්වර ප්‍රස්තාර ලියන ලද දෘශ්‍ය ආධාරකය

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

රාගධාරී සංගීතයේ දී රාගවල සිද්ධාන්ත පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම වැදගත් වෙයි. එහි දී රාගයක ඇති අනන්‍ය ලක්ෂණ හා එම රාගයේ යෙදෙන ස්වර හඳුනා ගැනීම අත්‍යවශ්‍ය ය. හින්දුස්ථානී සංගීතයේ රාග විස්තර භාවිත වන පාරිභාෂික පද කීපයක් ඇත. ආරෝහණ, අවරෝහණ, මේලය, ජාතිය වාදී, සංවාදී, ගානසමය, මුඛ්‍යාංගය යන ඒවා ය. සෑම රාගයකට ම මෙම සිද්ධාන්තික කොටස් ඇතුළත් වෙයි. රාගයක් විස්තර කිරීමට, හඳුන්වා දීමට, එකිනෙක සැසඳීමට මෙම කරුණු පිළිබඳ ව මනා අවබෝධයක් තිබිය යුතු ය.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- මීට පෙර ප්‍රායෝගික ව අධ්‍යයනය කර ඇති භෛරවී හා යමන් රාගවල ලක්ෂණ ගීත සිසුන් සමග ගායනය කරන්න.
- එම ගීතවල පදමාලාවේ ගැබ් වී ඇති ලක්ෂණ පිළිබඳ ව සිසුන්ගෙන් විමසමින් සාකච්ඡාවේ යෙදෙන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- යමන් / භෛරවී රාගවල ලක්ෂණ ගීත ලියන ලද දෘශ්‍යාධාරක සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- සමස්ත ගීත ඔවුන් සමග ගායනා කරන්න.
- රාග විස්තරයෙහි සඳහන් පාරිභාෂික පද පිළිබඳ සිද්ධාන්තික දැනුම ලබා දෙන්න.

(මිනිත්තු 30)

**පියවර 03**

- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
- යමන් රාගයේ ලක්ෂණ ගීය අනුව පහත සඳහන් වගුව සම්පූර්ණ කිරීම එක් කණ්ඩායමකටත්, භෛරවී රාගයේ ලක්ෂණ ගීතය අනුව අනෙක් කණ්ඩායමටත් සම්පූර්ණ කිරීමට පවරන්න.

| | මේලය | ජාතිය | ආරෝහණ | අවරෝහණ | වාදී | සංවාදී | මුඛ්‍යාංගය | ගානසමය |
|---|---|---|---|---|---|---|---|---|
| යමන් | | | | | | | | |
| භෛරවී | | | | | | | | |

(මිනිත්තු 35)

පහත දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට අවස්ථාව සලසන්න. (ප්‍රායෝගිකව යොදා ගත් ලක්ෂණ ගීතයට ගැලපෙන අයුරින් පහත ප්‍රශ්න සාකච්ඡා කරන්න.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- කණ්ඩායම් වශයෙන් ඔවුන්ගේ ක්‍රියාකාරකම ඇගයීමට ලක් කරන්න.
- යමන් හා භෛරවී වගු සටහන අගයන්න.
- ප්‍රශ්නවලට සාර්ථකව පිළිතුරු සැපයූ සිසුන් අගයන්න.

(මිනිත්තු 05)

**පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. යමන් ලක්ෂණ ගීතයේ කලන මේල ගත යනුවෙන් හඳුන්වනු ඇත්තේ කුමන මේලයට අයත් බව ද?
2. පිරුණු නිස ගැයෙන යනුවෙන් අදහස් කරන ජාතිය කුමක් ද?
3. ''යන එන'' ස්වර ගෙන යනුවෙන් සඳහන් වන ආරෝහණ අවරෝහණ ලියන්න.
4. මෙහි වාදී හා සංවාදී ස්වර මොනවා ද?
5. සමස්ත ගීතය තුළ ඇති විශේෂ ස්වර සංගතියක් ලියන්න.
6. ''සපිරුණු මේ රාග භෛරවී'' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
7. ''බැති සිරිගර රසපිරි'' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
8. එහි අන්තරා කොටසේ පළමු පාදයේ අදහස ඔබේ වචනයෙන් ලියන්න.
9. ගානසමය දැක්වෙන්නේ කුමන පාදයෙන් ද?

# ස්වර ලිපි කියවීමේ ශිල්ප ක්‍රම

ක්‍රියාකාරකම 10

**නිපුණතාව 1.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ස්වර ලිපි බලා වාදනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- ස්වර ප්‍රස්තාර කියවීමට අවශ්‍ය සංකේත හඳුනා ගෙන භාවිත කරයි.
- ස්වර ප්‍රස්තාර තාලානුකූල ව කියවයි.
- වෘත්තීය වාදකයකු වීමට අවශ්‍ය කරන මූලික හැකියා වර්ධනය කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්:**
- තෝරාගත් ගීත ස්වර ප්‍රස්තාරයක් (සංකේත සහිත)
- සර්පිනාවක් හෝ තෝරාගත් භාණ්ඩයක්
- සිසුන් විසින් සපයා ගත් භාණ්ඩ

ඇමුණුම 01 සහ 02

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

නාදය සහ කාලය රිද්මයානුකූල ව සංවිධානය කර නිර්මාණය කරගත් සටහන ස්වර ප්‍රස්තාරය නම් වේ. සංගීත සංරක්ෂණයට මෙන් ම වාදකයින් මගින් නැවත ප්‍රතිනිර්මාණය කරවා ගැනීම සඳහා ස්වර ප්‍රස්තාරයෙන් වන සේවය ඉතා විශාල ය. ස්වර ප්‍රස්තාරයන්හි අගය පිළිබඳ ව මනා වැටහීමක් මෙහි දී සිසුනට ලබාදිය යුතු ය. තව ද ස්වර ප්‍රස්තාරයක් තුළ වූ විවිධ සංකේත පිළිබඳ ව සෛද්ධාන්තික මෙන් ම මනා ප්‍රායෝගික දැනුමක් ලබා දිය යුතු ය. ඒ සඳහා දී ඇති ඇමුණුම් භාවිතකර පාඩම සංවිධානය කර ගන්න.

පාඩම අවසානයේ දි ව්‍යවහාරික සංගීතයේ තිබෙන සියලු සංකේත යෙදූ ස්වර ප්‍රස්තාරයක් වාදනය කිරීමේ හැකියාව සිසුවා සතු විය යුතු ය.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- තෝරා ගත් ගීතයක ස්වර ප්‍රස්තාරයක් ප්‍රදර්ශනය කර සර්පිනාවෙන් හෝ තෝරා ගත් භාණ්ඩයෙන් වාදනය කර පෙන්වන්න.
- එහි තිබෙන විවිධ සංකේත පිළිබඳ ව ප්‍රායෝගික ව උදාහරණ පෙන්වා සිසුන් සමග සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- සිසුන් සංඛ්‍යාව අනුව කණ්ඩායම් කර ඇමුණුම 1 හි ඇති කියවීම් පත්‍රිකාව බෙදා දී එහි ඇති තොරතුරු ගවේෂණයට යොමු කරන්න.
- පත්‍රිකාවෙහි ඇති උදාහරණ ස්වර ඛණ්ඩ සිසුන් විසින් සපයා ගත් භාණ්ඩයන්හි වයමින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට සලස්වන්න.

මෙම කාර්යයේ දී ඔබගේ සහාය ලබා දීම අත්‍යවශ්‍ය ය.

(මිනිත්තු 30)

**පියවර 03**
- ඇමුණුම 2 හි ඇති කාර්ය පත්‍රිකාව බෙදා දී එහි ඇති ස්වර ප්‍රස්තාරය සිසුන් විසින් සපයා ගත් භාණ්ඩයන්හි තනි තනිව වයා පෙන්වීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ඇමුණුම 2 හි ඇති කාර්ය පත්‍රිකාවේ ඇතුළත් ස්වර ඛණ්ඩ වයන ආකාරය බලා ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 10)

**පසු වැඩ** : සිසුන් විසින් සපයා ගත් ගීත ප්‍රස්තාර නිවසේ දී පුහුණු වීමට උපදෙස් දෙන්න. මිල දී ගත හැකි ප්‍රස්තාර පොත් ඇසුරින් සරල ගී වාදනයට යොමු කරන්න.

**අතිරේක උදව්** : ගීත ප්‍රස්තාර සහිත පොත්

**ඇමුණුම 01**

**කියවීම් පත්‍රිකාව**

පහත දක්වා ඇත්තේ ලාංකීය ව්‍යවහාරික සරල සංගීත ක්ෂේත්‍රයෙහි ස්වර ප්‍රස්තාර ලිවීමේ දී භාවිත කරනු ලබන සංකේතයන් ය. එම තොරතුරු කියවා හොඳින් අවබෝධ කර ගන්න. ගැටලු ඇතොත් ගුරු මහත්ම මහත්මීන්ගෙන් විමසන්න.

(i) [[ ]] විභාග දෙකක් හෝ කීපයක් මැදිවන සේ මෙසේ යෙදීමෙන් අදහස් වන්නේ එම වරහන් යුගලයන්ට මැදි වූ ස්වර ඛණ්ඩය දෙවරක් වාදනය විය යුතු බව ය. මෙය Repitation Mark නම් වෙයි.

උදා:

[ස+ප̣ / ස ප̣ ප̣]

(ii) ‖: :‖ මෙය ද Repitation Mark එකකි.

උදා: ‖: ස රි ග රි ස නි̣ / ස + + + + + :‖

(iii) ⁒ මෙයත් සංගීත ප්‍රස්තාරවල යෙදෙන Repitation Mark එකකි. මෙහි අදහස වනුයේ මෙයට පෙර විභාගයේ ඇති ස්වර ඛණ්ඩයම නැවත වාදනය කළ යුතු බව මින් අදහස් වේ. මීට අමතර ව ප්‍රස්තාරවල කෝඩ්ස් සටහන් කිරීමේදී ද මෙය භාවිත කෙරේ. උදා :C/ ⁒ /G/ ⁒/

උදා: /ස - රි ග / ⁒ /

(iv) ⁒⁒ මෙය ද විභාග 2කට අදාළ වූ Repitation Mark එකකි.

මෙම සලකුණට පෙර ඇති විභාග දෙකෙහි ඇතුළත් ස්වර ඛණ්ඩ නැවත වාදනය කළ යුතු බව මෙහි අදහසයි.

උදා:

|ප - ම ග|ප - - - | ⁒⁒

(v) 𝄋 Sign to Sign (සයින් ටු සයින්)

ස්වර ප්‍රස්තාරයක, කිසියම් ස්වර ඛණ්ඩයක පේළිය මුලින් මෙය යොදා දෙවනුව ප්‍රස්තාරයේ කිසියම් ස්වර පේළියක අග මෙම සංකේතය යෙදූ විට එයින් කියවෙන්නේ මෙම සංකේතය මුලින් යෙදූ ස්ථානයට අදාළ ස්වර ඛණ්ඩය වෙත නැවත ගමන් කළ යුතු බව ය.

උදා: 𝄋 / ප̣ ස ස ස / රි ග ම ප / මග රි ග - / - ස රි ග ග
/ නි̣ ස රි - / නි̣ස රි රි / ප̣ නි̣ ස ම / ග රි නි̣ නි̣
/ ස - - - /
[ප̣ ධ̣ නි̣ / ස නි̣ ධ̣ ප̣] 𝄋

**සැ.යු.** ප්‍රස්තාරය අග " 𝄋 " යන සලකුණ යොදා ඇති ස්ථානයට නැවත මුල එම සළකුණු යොදා ඇති ස්වර පේළිය වාදනය කළ යුතු ය.

(vi) ⁜ මෙය ද සයින්ටු සයින් Mark ලෙස භාවිත කරයි.

(vii) $^3{}_4$ $^4{}_4$ $^5{}_8$ $^6{}_8$ $^7{}_8$ තාලය පෙන්වන සංකේත ය. මෙය බටහිර සංගීතයෙහි Time Signature එක ලියා දක්වන ආකාරය යි. එහෙත් අප ව්‍යවහාරික සංගීත ප්‍රස්තාරයන් හි දී මෙම සංකේතයෙන් බටහිර සංගීතය තුළ ප්‍රකාශිත අදහසට යම් තරමක් සමාන ව තාල යෙදීම අදහස් වේ.

$^3{}_4$ = දාදරා උදා: /ස ප ප / ප ප ම / ප ස නි / රි ස - /

$^4{}_4$ = කෙහෙර්වා උදා: /ස -ස - / ග - ස ග / ප -ග ප / ස - ස - /

$^5{}_8$ = ජප්තාල් /ස - / ප - ප / ප - / ප ධ ප

$^6{}_8$ = බෙම්ටො ග ම ප ප ප - /ග ම ප ප ප -/ ග ම ප ප ධ ප/ම ප ම ග රි –/

$^7{}_8$ = දීප්චන්දි / රූපක් = රි - - / රි ග ප ධ / නි - - / - - - -

(viii) C, $C^M$ = Scale (ගීතය පිහිටුවා ඇති ශ්‍රැතිය හැඳින්වීම සඳහා සටහන් කෙරේ. තනි ඉංග්‍රීසි අකුරින් Major Scale එකත් සිම්පල් m අකුර ඒ ළඟින් ම දකුණු පසින් යෙදීමෙන් [$C^m$] යෙදීමෙන් Minor Scale එකත් හඳුන්වා දෙයි.

උදා : 1. C = C Major

ස රි ග ම ප ධ නි ස්

$C^m$ = C Minor (බටහිර සංගීත පද්ධතියේ minor scale වර්ග දෙකක් ඇතත් මෙහි දක්වා ඇත්තේ ලාංකීය ව්‍යවහාරික සංගීතයේ භාවිතය අනුව minor scale වෙයි. (natural minor) තුන්වන ස්වරය ස්වර 2 1/2 ක අන්තරයක පිහිටුවා ඇති ඕනෑම ස්වර සප්තකයකට ය.

ස රි ග ම ප ධ නි ස

2. F = F Major

ම ප ධ නි ස් රි ග් ම්

$F^m$ = F Minor

ම ප ධ නි ස් රි ග් ම්

(ix) Intro= හඳුන්වා දීමේ වාදනය (පෙර වාදනය) (Introduction)

(x) Inter= අතුරු වාදනය (Interlude)

(xi) Harmony හා Counter සංගීත ඛණ්ඩ (මුල් තනුව) melody එකට අනුව ලිවීමේ දී Harmony හා Counter Part ලියනුයේ melody (තනුවට) යටින් ඊළඟ පේළිය හෝ දෙක මත ය. එම පේළි තුනම එකට සම්බන්ධ Bar Line (විභාග බෙදීමේ) රේඛාවකින් දක්වේ.

(a)

| | | | | |
|---|---|---|---|---|
| Melody Part → | ග - ම | ප - ග | ම - ග | රි - - |
| Harmony Part → | ප - ධ | නි - ප | ධ - ප | ම - - |
| Counter | S – – | G – – | R – – | N – – |

මෙහි දී සිංහල හා ඉංග්‍රීසි අකුරු දෙවර්ගයම භාවිත කරනු දැකිය හැකි ය.

**ඇමුණුම 02**

ඇමුණුම 1 හි ඇති කරුණු තහවුරු වන පරිදි ඔබ විසින් තෝරා ගත් සරල ගීතයක ස්වර ප්‍රස්තාරයක් සිසුනට ලබා දෙන්න. එහි දැක්වෙන එක් එක් කොටස් හොඳින් තහවුරු කරවන්න.

ක්‍රියාකාරකම 11

# තනුවක් ස්වර ලිපි කිරීමේ ශිල්ප ක්‍රම

**නිපුණතාව 1.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ස්වර ලිපි බලා වාදනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- තනුවක් ස්වර ප්‍රස්තාර කිරීමට අවශ්‍ය කරුණු දැන ගනියි.
- තනුවක් ස්වර ප්‍රස්තාර කරයි.
- ස්වර ඥානය වර්ධනය කර ගනියි.
- සංගීත ස්වර ප්‍රස්තාරකරණයේ දී ශ්‍රවණය ඉතා වැදගත් බවට පිළිගනියි.

**ගුණාත්මක යෙදවුම්** :
- සර්පිනාවක් හෝ ඔබ වයන භාණ්ඩය
- පාඩමට අදාළ ප්‍රස්තාරයක්
- ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

තනුවක් ස්වර ලිපි කිරීම සඳහා අවශ්‍ය මූලික දැනුමට අදාළ කොටස් වන මාත්‍රා, විභාග තාල ස්ථාන ආවර්ත යනාදිය ද සම ග්‍රහ, අව ග්‍රහ හා විෂම ග්‍රහ යන කරුණු ද මේවන විට පෙර වසරවල දී අධ්‍යයනය කර ඇත. ඒ සියල්ල නැවත සිහිපත් කරවන්න.

කණට ඇසෙන සරල තනුවක් ප්‍රස්තාරගත කිරීමට යොමු කිරීම මෙම පාඩමින් අපේක්ෂිත ය. මේ සඳහා මධ්‍යලයෙන් ගැයෙන ගීයක් තෝරා ගන්න. නැතහොත් එකම ස්වර නැවත නැවත යෙදෙන ජන ගීයක් තෝරා ගන්න.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- පෙර පාඩමෙහි භාවිත කළ ගීතයක් ප්‍රස්තාරයක් ප්‍රදර්ශනය කොට වාදනය කර පෙන්වන්න.
- තනුවක් ප්‍රස්තාර කිරීමට අවශ්‍ය ශිල්ප ක්‍රම හා කරුණු පිළිබඳ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 08)

**පියවර 02**
- ඇමුණුම 01 හි දැක්වෙන ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(මිනිත්තු 32)

**පියවර 03**
- සිසුන් විසින් ප්‍රස්තාරයට නැගූ ගීය අභිමත වාද්‍ය භාණ්ඩයකින් හෝ ස්වර පුවරුවකින් වාදනය කර පෙන්වීමට ඉඩ දෙන්න.
- සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.

(මිනිත්තු 32)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

ජන ගීතයක් හෝ ''නිල් අහස්තලේ'' වැනි ගීතයක් ගයා, ළමුන්ට ස්වර හඳුනාගෙන ප්‍රස්තාර කිරීමට සලස්වා අගයන්න.

(මිනිත්තු 08)

**පසු වැඩ** : පසු පාඩම් හි භාවිත ස්වර ප්‍රස්තාර සිසුන් ලවා ප්‍රස්තාර කරවන්න.

**අතිරේක උදව්** : ගීත ප්‍රස්තාර සහිත ග්‍රන්ථවල ඇතුළත් ගීත තමා විසින් ප්‍රස්තාර කොට නැවත එම ග්‍රන්ථවල ප්‍රස්තාර සමග සසඳා නිවැරදිතාවය බැලීමට උපදෙස් දෙන්න).

**ඇමුණුම 01**

පහත දැක්වෙන ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න.

1. 'අයන්න කියන්න...', 'දකුණ නැගෙනහිර...' වැනි ගීතයක ස්වර ප්‍රස්තාරයක් වාදනය සමග ආකාරයෙන් ගයා පෙන්වන්න.
2. ඔබ ගායනය කරන ආකාරය අනුව ශිෂ්‍යයා හඳුනා ගත් ගීතය සංකේත යොදමින් ප්‍රස්තාර කිරීමට යොමු කරන්න.
3. ස්වර පුවරු භාණ්ඩ සිසුන්ට ගෙන ඒමට උපදෙස් දෙන්න.
4. සිසුන් කණ්ඩායම් කර ස්වර පුවරු ලබා දී ඉහත ගීත ප්‍රස්තාරයන්හි ස්වර ප්‍රස්තාර කිරීමට උපදෙස් දෙන්න.

# ස්වර ලිපි බලා ස්වර පුවරුවෙන් වාදනය කරයි

**නිපුණතාව 1.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

ස්වර පුවරුව ස්ථාවර ස්වර පිහිටි වාද්‍ය භාණ්ඩයක් බැවින් සංගීතය හදාරන්නෙකුට ඒ පිළිබඳ තිබෙන පුහුණුව ඉතා වැදගත් වේ. මෙම සිසුන් 6 ශ්‍රේණියේ සිට මෙම භාණ්ඩය පිළිබඳ ව අත්දැකීම් ලබා ඇත. මෙහි දී අපේක්ෂා කරනුයේ ස්වර බලා වාදනයට අයත් සංකේත භාවිතා කරමින් වාදනය කිරීම ය. CHORD භාවිතා කරමින් වැයීමට කිසිවකු සමත් නම් එහි වරදක් නොමැත. එහෙත් එය අත්‍යවශ්‍යම නැත.

ස්වර පුවරු වාදනය දියුණු කර ගැනීමෙන් සිසුන්ට අත්පත් කරගන්නා අමතර දැනුම හා කුසලතා හා සමාජීය වටිනාකම් කිහිපයක් පහත දැක්වේ.

- ස්වර ඥානය දියුණු වේ.
- වාදනය කරමින් ගැයීමේ හැකියාව වර්ධනය වේ.
- ස්වර සංවාද පිළිබඳ ඍජු අත්දැකීම් ලැබේ.
- සාමූහික සංගීත රසවින්දනාත්මක අවස්ථාවන්හි දී ස්වර පුවරු භාණ්ඩ වාදන හැකියාව ප්‍රයෝජනයට ගනියි.

මේ කරුණු ඔස්සේ ඔබට සාකච්ඡාවක් ගොඩනැගිය හැකි ය.

**ඉගෙනුම් පල** :

- ස්වර ප්‍රස්තාර කියවා ස්වර පුවරුව වාදනය කරයි.
- ප්‍රාසංගික ලෙස වාදනය කරයි.
- පාසලේ සියලු උත්සවයන්හි කැපී පෙනෙන කාර්යභාරයක් ඉටුකරන්නෙකු වෙයි.
- දිගු කාලීන ව සංගීතය හදාරන්නෙකුට වෘත්තීය අවශ්‍යතා සඳහා මග පාදයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඔබ විසින් සපයා ගත් ගීත ප්‍රස්තාර
- ස්වර පුවරු භාණ්ඩ
- ස්වර පුවරු වාදන ඇතුළත් CD තැටි
- CD player

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**

- ස්වර පුවරු වාදන ඇතුළත් CD තැටි වාදනය කර ඇසීමට සලස්වන්න. (පහසුකම් ඇති පරිදි ඔබ ද වයා පෙන්වන්න)
- ස්වර පුවරු වාදන ශිල්පය හා එහි සුවිශේෂත්වය පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.

(මිනිත්තු 8)

**පියවර 02**

- ඔබ විසින් සපයා ගත් ගීත ප්‍රස්තාර ලබා දී වාදනයට යොමු කරවන්න.
- අවශ්‍ය තන්හි උපදෙස් ලබා දෙන්න.

(මිනිත්තු 32)

පියවර 03 • ගීත තනි තනිව වයා පෙන්වීමට උපදෙස් දෙන්න.
• පිරිස අනුව කණ්ඩායම් කර ස්වර පුවරුවෙන් Introduction, Interlude ආදිය වාදනයට පොළඹවන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ඔබ විසින් සපයා ගත් වෙනත් ස්වර ප්‍රස්තාරයක් වැයීමට දී ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 10)

**පසු වැඩ** : සිසුන් විසින් සපයා ගත් ගීත ප්‍රස්තාර නිවසේ දී පුහුණු වීමට උපදෙස් දෙන්න. සරල ගී ප්‍රස්තාර ස්වර පුවරුවෙන් වාදනයට යොමු කරන්න. මෙතෙක් අධ්‍යයනය කළ මධ්‍යලය ගීත ද ස්වර පුවරුවෙන් වාදනය කිරීමට යොමු කරන්න.

**අතිරේක උදව්** : ගීත ප්‍රස්තාර සහිත පොත්

# තෝරා ගත් භාණ්ඩයෙන් ස්වර ලිපි බලා වාදනය

**නිපුණතාව 1.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ස්වර ලිපි බලා වාදනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- ස්වර ප්‍රස්තාර කියවා වාදනය කරයි.
- සියලු සංකේත නිවැරදි ව අවබෝධයෙන් වාදනය කරයි.
- තෝරාගත් භාණ්ඩය වැදනයෙන් තම දක්ෂතා මනාව ඉදිරිපත් කරයි.
- වාදනයෙහි නිපුණයෙකු විය හැකි ලක්ෂණ පෙන්වයි.

**ගුණාත්මක යෙදවුම්**:
- ඔබ විසින් සපයා ගත් ගීත ප්‍රස්තාරයක්
- ඇමුණුම 02 උපදෙස් පත්‍රිකාව
- තෝරා ගත් භාණ්ඩයක්
- සංගීතඥ යානිගේ හෝ වෙනත් සංගීතඥයකුගේ වාදන ඇතුළත් VCD, CD පට
- CD player, රූපවාහිනියක්
- සිසුන් විසින් සපයා ගත් භාණ්ඩ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

පෙරදිග සංගීතයේ දී ගායනය සංගීතයෙහි ප්‍රධාන අංගය ලෙස සැලකුව ද වාදනය ද විටෙක එලෙසම ඉතා සුවිශේෂී වේ. පෙරදිග සංගීතයට වඩා, සුවිශේෂ ස්ථානයක් බටහිර සංගීතය තුළ වාද්‍ය සංගීතයට හිමිව ඇති බවද මෙහිදී සඳහන් කිරීම වැදගත් ය. සැබවින් ම ව්‍යවහාරික සංගීතය තුළ වෘන්ද සංගීතය ඉතා සුවිශේෂී වෙයි.

ගුණාත්මක බවින් පිරුණු වාදනයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්තිය ළඟා කර ගැනීම ඉතා ඉවසීමෙන් කළ යුතු දෙයකි. වාද්‍ය භාණ්ඩය සුසර කර ගැනීම පළමුව සිදුවිය යුත්තකි. මේ සඳහා විවිධ උපකරණ වර්තමානයෙහි ඇත (tuner). මෙම උපකරණයම ස්වර නිවැරදි කර ගනු සඳහා ද යොදා ගත හැක. ඒ පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.

දක්ෂ වාදකයකු වීමට ස්වර ලිපි බලා කියවීමේ හැකියාව මෙන් ම අත අතැඟිලි නිවැරදි ව හැසිරවීම ද අත්‍යාවශ්‍ය ය.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- යානිගේ වාදනයක් ප්‍රදර්ශනය කරන්න. (පහසුකම් නොමැති විට රසවත් ගීතයක් ඔබ විසින් වයා පෙන්වන්න.)
- වාදන කුසලතා පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- ක්‍රියාකරකම් අංක 10, 11, 12 යන පාඩම්වල දී සිසුන් උගත් දෑ පිළිබඳ කෙටියෙන් ආවර්ජනය කරන්න.
- භාණ්ඩ වර්ග අනුව හෝ සිසුන්ගේ දක්ෂතා අනුව කණ්ඩායම් කරගන්න.
- 10 ශ්‍රේණියට උචිත ලෙස ඔබ විසින් තෝරා ගත් ස්වර ප්‍රස්තාර ලබා දී වාදනයට සලස්වන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- සිසුන් විසින් පුහුණු වූ ස්වර ප්‍රස්තාරය තනි තනිව වයා පෙන්වීමට උපදෙස් දෙන්න.
- එය සංගීත කණ්ඩායමක ස්වරූපයෙන් වැයීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 20)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

සිසුන් විසින් තනි තනිව ඉදිරිපත් කරන වාදනය ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 20)

**පසු වැඩ** : සිසුන් විසින් සපයා ගත් ගීත ප්‍රස්තාර නිවසේ දී පුහුණු වීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව්** :
- භාවික ගීත - වින්සන්ට් සෝමපාල
- අභිනව මූලික ගීත - ඩබ්ලිව්. බී. මකුලොලුව
- බ්‍යාල ගීත - ආනන්ද ජයසිංහ
- සරල ගී ප්‍රස්තාර කළ ග්‍රන්ථ

# ග්‍රැමෆෝන් තැටි යුගයෙන් තෝරා ගත් ගීතයක්

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරුවෙයි.

**නිපුණතා මට්ටම 3.1 :** ව්‍යවහාරික සංගීතයේ වර්ධනයේ විවිධ අවස්ථා හඳුනා ගනිමින් එක් එක් යුගවලට අයත් ගීත ගායනයේ රසාස්වාදයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල** :
- ග්‍රැමෆෝන් ගීයේ අනන්‍යතාව රකිමින් ගැයීමේ කුසලතාව ලබයි.
- ග්‍රැමෆෝන් ගීවල පසුබිම අවබෝධ කොට ගනියි.
- ග්‍රැමෆෝන් තැටියුගයට අයත් තොරතුරු වගුගත කරයි.
- එම ගීත සංරක්ෂණය කළ යුතු බව පිළිගනියි.
- ග්‍රැමෆෝන් ගී රස විඳිමින් අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ග්‍රැමෆෝන් ගී තැටියක් (සපයා ගත හැකි නම්)
- ග්‍රැමෆෝනයක පින්තූරයක් හෝ ග්‍රැමෆෝනයක්
- ග්‍රැමෆෝන් ගී පටිගත කොට ඇති CD තැටි
- ගීතය ලියාගත් දෘශ්‍යාධාරකය
- 2007 විෂය සංස්කරණයට අදාළ 10 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.2 ඇමුණුමට අදාළ ගවේෂණ පත්‍රිකා
- සර්පිනාව, තබ්ලාව

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

ශිල්පියකු සජීවී ව ගැයූ ගීයක් උපකරණ ඇසුරෙන් ඒ අයුරින් ම නැවත ශ්‍රවණයට අවකාශ සැලසූ මුල්ම උපකරණය ග්‍රැමෆෝනය වේ. ග්‍රැමෆෝනය ගී ලාංකේය සරල ගීයේ ප්‍රවර්ධනය උදෙසා විශාල බලපෑමක් කළ ශබ්ද විකාශන යන්ත්‍රයකි. එබැවින් ග්‍රැමෆෝන් තැටි යුගය පිළිබඳ අධ්‍යයනය ඉතා වැදගත් ය. මෙම කාලච්ඡේද 02 තුළ දී ග්‍රැමෆෝන් තැටි යුගයේ තොරතුරු සහ ග්‍රැමෆෝන් ගීයක් ගායනය අපේක්ෂා කෙරේ. පහත ගීත අතුරින් ඔබට අභිමත ගීයක් තෝරා ගන්න.

- මහ බෝධි මුලේ
- මව්පියෝ ආදී
- බැස සීතල ගඟුලේ
- ශ්‍රී රාහුල හිමිගේ නාමේ
- දසබලධාරී
- විසෙහී විස සඳනා
- සිරි බුද්ධ ගයා
- ශ්‍රී සෙත් සාදයි
- දූඩිකළ මාතා
- අඩු කළේ

ග්‍රැමෆෝන් තැටි යුගය පිළිබඳ කරුණු හා විස්තර ගවේෂණය කිරීමට සිසුන් යොමු කිරීම සඳහා 2007 වසරේ 10 ශ්‍රේණියට අදාළ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ විස්තර ඇමුණුම සපයා ගන්න. නැතහොත් අතිරේක කියවීම් පොත ආශ්‍රයෙන් ඔබ විසින් කියවීමේ පත්‍රිකාවක් සකසා සිසුනට සපයන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01** • ග්‍රැමෆෝන් ගීයක් ශ්‍රවණයට ඉඩ සැලසීම. (ග්‍රැමෆෝන් යුගයේ තැටිගත කරන ලද ගීයක් නම් වඩාත් යෝග්‍යයි) / ග්‍රැමෆෝන් ගීයක කොටසක් වාද්‍ය භාණ්ඩ සහිත ව එහි අනන්‍යතා ලක්ෂණ රැකෙන පරිදි ගයා වයා පෙන්වීම. මෙහි දී ක්‍රියාකාරකමට අදාළ ගීතය හැර වෙනත් ගීයක් යොදා ගැනීමට සැලකිලිමත් වන්න. ග්‍රැමෆෝනය සහිත පින්තූරයක්/ග්‍රැමෆෝනයක්, ග්‍රැමෆෝන් තැටියක් ප්‍රදර්ශනය කොට ඒ පිළිබඳ ව හා ග්‍රැමෆෝන් ගීතයේ ලක්ෂණ දරුවන් සමග සරල ව සාකච්ඡා කිරීම.

(මිනිත්තු 10)

**පියවර 02**

- ඔබ තෝරා ගත් ග්‍රැමෆෝන් ගීය ලියූ දෘශ්‍යාධාරකය ඉදිරිපත් කරන්න.
- පියවරින් පියවර ගයා වයා සුදුසු ක්‍රමවේද තුළින් සිසුන්ට තහවුරු කරන්න.
- ගීයෙහි පදමාලාව, නාද මාලාව, රිද්මය ආදී කරුණු සැලකිල්ලට ගෙන විශේෂයෙන් නාදමාලාවට මුල්තැන දී ඇති අයුරු ගීතය තුළින් සාකච්ඡා කරන්න. (මිනිත්තු 30)
- පන්තිය කණ්ඩායම්වලට බෙදන්න.
- 2007 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 3.1.2 හි ඇතුළත් ග්‍රැමෆෝන් තැටි යුගයෙහි විස්තර ලියන ලද උපදෙස් පත්‍රිකා හෝ ඔබ විසින් ගොඩනැගූ කියවීමේ පත්‍රිකා ලබා දෙන්න.
- කණ්ඩායම් ගවේෂණයෙහි යොදවන්න. (මිනිත්තු 20)

**පියවර 03**

- කණ්ඩායම් විසින් ගවේෂණය කරගත් තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට අවකාශය ලබා දී අවශ්‍ය තැන්හි දී සහාය වන්න.
- සෙසු කණ්ඩායම්වල සංවර්ධනාත්මක යෝජනා විමසා සමාලෝචනයක යෙදෙන්න. (මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

කණ්ඩායම් වශයෙන් ගීතය ගායනයට අවස්ථාව සලසා දී ඇගයීමට ලක් කිරීම හෝ ගුරුවරයාට අභිමත උචිත ක්‍රමවේදයක් මගින් ඇගයීමකට ලක් කිරීම. (මිනිත්තු 10)

**පසු වැඩ :**

- ග්‍රැමෆෝන් ගී යුගයේ ගීත ස්වයං අධ්‍යයනයට යොමු කිරීම.
- පාසලේ හෝ නිවසේ අන්තර්ජාල පහසුකම් ඇති දරුවන් YouTube මෘදුකාංගය හරහා ග්‍රැමෆෝන් ගීත ශ්‍රවණයට, රැස් කිරීමට හා හුවමාරු කර ගැනීමට යොමු කිරීම.
- විවිධ ප්‍රසංගය සඳහා ග්‍රැමෆෝන් ගීත පුහුණු කරවීම.

**අතිරේක උදව් :**

- 2007 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.1 ක්‍රියාකාරකමට නිපුණතා මට්ටමට අදාළ තොරතුරු හා කියවීමේ පත්‍රිකා.
- කතා පෙට්ටියේ ගී - ඇඹුල්දෙණියේ ලයනල් ගුණතිලක (ප්‍රස්තාර සහිත)
- ග්‍රැමෆෝන් ගී - මහාචාර්ය සුනිල් ආරියරත්න
- ග්‍රැමෆෝන් ගී - CD තැටිය - ශිල්පිනී නන්දා මාලනී

# මුල් යුගයේ ගුවන් විදුලි සරල ගී නිර්මාණ අගයමු

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳී මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරුවෙයි.

**නිපුණතා මට්ටම 3.1** : ව්‍යවහාර සංගීතයේ වර්ධනයේ විවිධ අවස්ථා හඳුනා ගනිමින් එක් එක් යුගලවලට අයත් ගීත ගායනයේ / රසාස්වාදයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- මුල් කාලීන ගුවන් විදුලි සරල ගීයේ ලක්ෂණ පවසයි.
- තෝරා ගත් සරල ගී ඒවායේ අනන්‍ය ලක්ෂණ රකිමින් ගයා රසවිඳියි.
- ශ්‍රී ලංකාවේ සංගීත ක්ෂේත්‍රයට ගුවන් විදුලි සරල ගී මගින් සිදු වූ මෙහෙය අගය කරයි.
- ආනන්ද සමරකෝන් හා සුනිල් ශාන්ත යන යුග පුරුෂයින් දෙදෙනා පිළිබඳ තොරතුරු රැස් කරයි.

**ගුණාත්මක යෙදවුම්:**

- මුල් කාලීන ගුවන් විදුලි සරල ගී තැටිගත කළ ශ්‍රව්‍ය පටි, සංයුක්ත තැටි හා යන්ත්‍ර (සපයා ගත හැකි නම්)
- ගීත ඇතුළත් දෘශ්‍යාධාර
- සර්පිනාව, තබ්ලාව
- 2007 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 3.1.2.3 පියවරට අයත් සංගීතඥයින් පිළිබඳ තොරතුරු පත්‍රිකා

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

ගුවන් විදුලියේ මුල් කාලයේ ප්‍රචාරය වූයේ අපරදිග සංගීතය මුල් කොට ගත් වැඩසටහන් ය. පෙරදිග සංගීතයට අදාළ වැඩසටහන් ප්‍රචාරය වූයේ ඉන් කලකට පසුව ය. ගුවන් විදුලි සරල ගීයට අඩිතාලම සැකසුණේ ග්‍රැමෆෝන් තැටි යුගයේ ස්වාධීන තැටි යුගයට අයත් ගීතාවලියෙනි. එබැවින් මෙම ක්‍රියාකාරකමේ ප්‍රවේශයට ග්‍රැමෆෝන් තැටි යුගයේ ස්වාධීන තැටි යුගයට අයත් ගීයක් තෝරා ගැනීම උචිත ය. එය පෙර උගත් ග්‍රැමෆෝන් තැටි යුගය පාඩම ආවර්ජනයට ද රුකුලක් වනු ඇත. මෙහි දී සිංහල ගීය විප්ලවීය වෙනසකට භාජනය කළ ආනන්ද සමරකෝන් සූරීන්ගේ ''එන්ඩද මැණිකේ මමත් දියඹටා'' වැනි ගීතයක් වඩාත් උචිතය.

ගුවන් විදුලි සරල ගීයට මුල් අත්තිවාරම සැකසුවේ ආනන්ද සමරකෝන් හා සුනිල් ශාන්ත සූරින් බව පැහැදිලි කර දිය යුතු ය. ඊට අමතර ව ජී.ආර්. එඩ්වඩ්, ලීලාවතී, සූර්ය ශංකර් මොල්ලිගොඩ, ආර්.ඒ. චන්ද්‍රසේන, ඩබ්ලිව්.ඩී. අමරදේව වැනි ගායක ගායිකාවන් මුල් යුගයේ සරල ගී සඳහා දායක වූ බව සඳහන් කරන්න.

මෙම ක්‍රියාකාරකම තුළින් ආනන්ද සමරකෝන් හා සුනිල් ශාන්තයන්ගේ දායකත්වය හා ඔවුන්ගේ ගීත දෙකක් ගායනය අපේක්ෂිත යි. කොටසින් කොටස පාදයෙන් පාදය ගායනය හුරු කිරීම අපේක්ෂා නොකරන අතර ගුරුවරයා සමග වාදනය සහිතව රසවත් ව සියලු දෙනා එක්ව ගායනය ප්‍රමාණවත් ය. හැකි නම් මුල් සරල ගීයේ ම සංයුක්ත තැටියක් හෝ හඬ පටයක් යොදා ගැනීම ඵලදායි වේ.

පාඩම සංවර්ධනය :

**පියවර 01**

- ග්‍රැමෆෝන් තැටි යුගයේ ස්වාධීන තැටි යුගයට අයත් ගීයක් ශ්‍රවණයට ඉඩ සැලසීම හෝ ගීතය වාද්‍ය භාණ්ඩක් වයමින් ගයා වයා පෙන්වීම.
- ඉහත ගීය ඇසුරින් මුල් යුගයේ, ගුවන් විදුලි සරල ගීයේ ස්වභාවය, ගීයෙහි පදමාලාව, නාදමාලාව, තාලය, කටහඬ, සංගීතය ආදී කරුණු ඇසුරින් සාකච්ඡා කරන්න. මෙහි දී විශේෂයෙන් මුල් වාදන අතුරු වාදන ඉතා කෙටි වීම, ''එන්ඩද මැණිකේ මමත් දියඹටා'' වැනි ගීයක කෙටි අතුරු සංගීත ඛණ්ඩයක්වත් නොමැති බව ද, කටහඬට මුල්තැන දීම උදෙසා සීමිත භාණ්ඩ සංඛ්‍යාවක් වාදනය, සරල වචන භාවිතය ආදී කරුණු ඇතුළත් ව සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**

- ආනන්ද සමරකෝන් සූරින්ගේ ගීත අතුරින් ඔබ තෝරා ගත් ගීතය ගයා වයා ශ්‍රවණයට ඉඩ සලස්වන්න. සිසුන් සමග එක්ව සාමූහික ව ගයන්න. තැටිය හෝ හඬ පටය යොදා ගන්න.
- ඉහත අයුරින් ම සුනිල් සාන්ත සූරීන්ගේ ගීතය ද සිසුන් සමග එක් ව ගයන්න.

  (මේ සඳහා 2007 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 3.1.2 ක්‍රියාකාරකමට අදාළ ගීත දෙකක් උපයෝගී කොට ගත හැකි ය.)

- ස්වයං අධ්‍යයන ක්‍රමවේද හෝ අන්තර්ජාලය පරිහරණය කරමින් මුල් යුගයේ ගුවන් විදුලි සරල ගී 5ක මුල් පාද කිහිපය ගායන හුරුව ලබා ගැනීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 30)

**පියවර 03**

- කණ්ඩායම් වශයෙන් හෝ කේවලව මුල් කාලීන ගුවන් විදුලි සරල ගී පිළිබඳ අදහස් දැක්වීමට ඉඩ සලස්වන්න.

(මිනිත්තු 20)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

කණ්ඩායම් වශයෙන් ගීත දෙකේ කොටස් ගායනයට අවස්ථාව සලසා දී ප්‍රශංසාවට ලක් කිරීම හෝ උචිත ක්‍රමවේදයක් මත අගයන්න.

(මිනිත්තු 20)

**පසු වැඩ** : 2007 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 3.0 නිපුණතාවයට අයත් 3.1.2.3 පියවරෙහි සමාලෝචනයට අදාළ ව සපයා දී ඇති කරුණු හෝ අතිරේක කියවීම් පොතේ කරුණු පාදක කොට ගනිමින් සුනිල් සාන්ත හා ආනන්ද සමරකෝන් සූරීන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපියක් සැකසීමට යොමු කරන්න. අතිරේක උදව් තීරුවේ දක්වා ඇති ග්‍රන්ථ පරිශීලනයට යොමු කරන්න.

**අතිරේක උදව්** :

- 2007 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.2.3 පියවරට අදාළ තොරතුරු
- ආනන්ද සමරකෝන් අධ්‍යයනය - සුනිල් ආරියරත්න
- සිංහල සංගීතයේ සුනිල් සාන්ත පිළිබිඹුව - සුසිල් ජයවීර
- සුනිල් ගී, රිදී වළාව, සුනිල් හඬ, ගුවන් තොටිල්ල

# කපිරිඤ්ඤා ගීතවල ස්වභාවය

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳී මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරුවෙයි.

**නිපුණතා මට්ටම 3.1** : ව්‍යවහාරික සංගීතයේ වර්ධනයේ විවිධ අවස්ථා හඳුනා ගනිමින් එක් එක් යුගවලට අයත් ගීත ගායනයේ / රසාස්වාදයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- කපිරිඤ්ඤා ගීතවල ස්වභාවය විස්තර කරයි.
- කපිරිඤ්ඤා ගීතය නිවැරදි ව ගයයි.
- රිද්මයට අනුව චලනයෙහි යෙදෙමින් වින්දනාත්මක ව ගයයි.
- මෙම සම්ප්‍රදාය අනුව නිර්මාණය වී ඇති සරල ගීත ගයයි.

**ගුණාත්මක යෙදවුම්**:
- 2007 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඇමුණුම 3.1.3.3 ට අදාළ උපදෙස් පත්‍රිකා හා ඇමුණුම 3.1.3.1 ට අදාළ කපිරිඤ්ඤා ගීතය අඩංගු දෘශ්‍යාධාරකය.
- සර්පිනාව, රබාන, බොංගෝ ආදී සංගීත භාණ්ඩ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

විදෙස් ආභාස ඇසුරින් නිර්මාණය වූ ගී, කලක පටන් පාසල් විෂයමාලාවට අන්තර්ගත වී ඇත. ඉන් කපිරිඤ්ඤා ගී වලට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. එයට හේතුව එම ගීතවල රිද්මය හා නාද මාලාවේ හැඩය හේතුවෙන් පහසුවෙන් ගැයිය හැකි ගීත විශේෂයක් වීමයි. එසේ ම ගායනය වාදනය නර්තනය අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධය මෙන් ම රිද්මය ප්‍රධාන කොට චලනයෙහි යෙදෙමින් සාමූහික ව ගැයීමට හැකි වීම ද මෙම ගීතවල විශේෂත්වය වේ. මෙම ක්‍රියාකාරකමේ දී එම කරුණු ආවරණය වන පරිද්දෙන් පාඩම ගොඩනගා ගැනීමට ගුරුවරයා උත්සාහ ගත යුතු යි.

බයිලා සමග එන යුගල පදයක් සේ යෙදෙන අනෙක් පදය කපිරිඤ්ඤා වේ. බයිලා නැමති නැටුම් විශේෂයට යොදා ගත් සංගීතය කපිරිඤ්ඤා බව ළමුන් සමග සාකච්ඡා කළ යුතු යි.

පාඩම ප්‍රවේශයේ දී කපිරිඤ්ඤා ගී තනු ආශ්‍රයෙන් නිර්මාණය කළ වඩාත් ප්‍රකට ගීත දෙකක මුල් කොටස් ගැයීම සුදුසු ය. මේ සඳහා මී වදයකි ජීවිතේ, රස ආහාර කවලා ආදී ගීත යෝජනා කෙරේ. ''තැර ඉස්ති තැර'' යන කපිරිඤ්ඤා ගීතය ද ගයා වයා පෙන්වීම ඵලදායී වේ. මෙම ගීත ගායනයේ දී වයලීනය යොදා ගත් අතර එහිදී එය 'රවිකිඤ්ඤා' යන නමින් හැඳින්වීය. වයලීනයෙන් කපිරිඤ්ඤා ගීතයක් වාදනය කර පෙන්වීම වඩාත් ඵලදායක ය.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- කපිරිඤ්ඤා ගීත ආශ්‍රයෙන් නිර්මාණය වී ඇති සරල ගී දෙකක මුල් කොටස් වාද්‍ය භාණ්ඩ සහිත ව දරුවන්ගේ ද සහභාගිත්වය සහිත ව ගයන්න. අනතුරු ව එම ගී තුළ ඇති සුවිශේෂතා සාකච්ඡා කරන්න. ''තැර ඉස්ති තැර'' යන කපිරිඤ්ඤා ගීතය ද ගයා / වයා පෙන්වන්න. (මෙම ගීය විශාරද සුදත් සමරසිංහගේ 'සඳ සරා කුමාරි' සංගත තැටියේ ඇත.)

(මිනිත්තු 10)

**පියවර 02** • කපිරිඤ්ඤා ගීය සහිත දාශ්‍යාධාරකය ඉදිරිපත් කර සුදුසු ක්‍රමවේද භාවිත කරමින් නාදමාලාව තහවුරු කරන්න. තාල වාද්‍ය භාණ්ඩ (රබාන, බොංගෝ, ටැම්බරින් ආදිය) වාදනය කරමින් සාමූහික ව රිද්මයට අදාළ චලනයෙහි යෙදෙමින් වින්දනාත්මක ව ගැයීමට අවස්ථාව සලසා දෙන්න. තාල වාදනයට දක්ෂ ළමුන්ට ඔවුන්ගේ ශක්‍යතා එළිදැක්වීමට ද මෙය අවස්ථාවක් සලසා දෙන්න

(මිනිත්තු 30)

**පියවර 03** • 2007 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 3.1.3.3 ට අදාළ උපදෙස් පත්‍රිකා සිසුන් හට ලබා දෙන්න. එම කරුණු ආශ්‍රයෙන් කපිරිඤ්ඤා ගී පිළිබඳ සටහනක් සිසුන් ලවා පිළියෙල කර පන්තිය ඉදිරියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- කණ්ඩායම් වශයෙන් ගීතයේ කොටස් ගැයීමට අවස්ථාව සලසා අගයන්න.
- සිසුන් සැකසූ සටහන අගය කරන්න.

(මිනිත්තු 10)

**පසු වැඩ** :

- කපිරිඤ්ඤා සම්ප්‍රදායට නිර්මාණය වී ඇති සරල ගී එකතුවක් සහිත ගී පොතක් නිර්මාණය කිරීමට යොමු කරන්න.
- විවිධ ප්‍රසංගය සඳහා වෙනත් කපිරිඤ්ඤා ගීතයක් පුහුණුවට මග පෙන්වන්න.

**අතිරේක උදව්** : බයිලා, කපිරිඤ්ඤා මහාචාර්ය සුනිල් ආරියරත්න

# මුල් යුගයේ සරල ගීතයක ස්වර ලිපි ස්වර පුවරුවෙන් වාදනය කරයි

**නිපුණතාව 1.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ස්වර ලිපි බලා වාදනය කරයි.

**කාලච්ඡේද** : 02

**හැඳින්වීම** : ස්වර පුවරුවෙන් ස්වර ලිපි වාදනය කිරීමේ කුසලතාවය මේ වන විට ඔබ ලබා දී ඇති හෙයින් මෙම පාඩමේ දී මුල් යුගයේ සරල ගීතයක් වාදනයෙහි යෙදවීම අපේක්ෂා කෙරේ.

**ඉගෙනුම් පල** :
- ස්වර ප්‍රස්තාර කියවා ස්වර පුවරුවෙන් ගීත වාදනය කරයි.
- මුල් යුගයේ ගීත හා වර්තමාන ගීතවල ස්වභාවය විස්තර කරයි.
- වාදන දක්ෂතා ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- ඔබ විසින් සපයා ගත් ගීත ප්‍රස්තාර
- ස්වර පුවරු භාණ්ඩ
- මුල් යුගයේ ගීත ඇතුළත් ස්වර පුවරු වාදන ඇතුළත් CD තැටි
- CD player 1

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- ස්වර පුවරු වාදන ඇතුළත් CD තැටි වාදනය කර ඇසීමට සලස්වන්න. (පහසුකම් නොමැති නම් ඔබ විසින් වයා පෙන්වන්න)
- ස්වර පුවරු වාදන පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- ඔබ විසින් සපයා ගත් ගීත ප්‍රස්තාර ලබා දී වාදනය කරවන්න.
- අවශ්‍ය තැන්හි උපදෙස් ලබා දෙන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- ගීත තනි තනිව වයා පෙන්වීමට අවස්ථාව දෙන්න.
- Introduction, Interlude සහ ගීතයේ තනුව මුල් ගීතයේ ආකාරයටම විවිධ සංගීත භාණ්ඩ ඇසුරෙන් හා ස්වර පුවරුවෙන් වාදනයට පොළඹවන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

ඔබ විසින් සපයා ගත් වෙනත් ස්වර ප්‍රස්තාරයක් වැයීමට දී ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 10)

**පසු වැඩ** : සිසුන් විසින් සපයා ගත් ගීත ප්‍රස්තාර නිවසේ දී පුහුණු වීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව්** : ගීත ප්‍රස්තාර සහිත පොත්

# තෝරා ගත් භාණ්ඩයෙන් ස්වර ලිපි බලා වාදනය

**නිපුණතාව 1.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1 :** ස්වර ලිපි බලා වාදනය කරයි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :
- ස්වර ප්‍රස්තාර කියවා ඒ අනුව ම වාදනය කරයි.
- සිසුන් කැපවීමෙන් වාදනය ප්‍රගුණ කිරීමෙන් පාසලේ සියලු උත්සවයන්හි කැපී පෙනෙන හා අත්‍යවශ්‍ය චරිත බවට වෙයි.
- දිගු කාලීනව සංගීතය හදාරන්නෙකුට වෘත්තීය මාර්ග සඳහා මග පාදයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුම 02 ඔබ විසින් සපයා ගත් ගීත ප්‍රස්තාර
- ඇමුණුම 01 උපදෙස් පත්‍රිකාව
- සර්පිනාවක් තෝරා ගත් භාණ්ඩයක්
- සංගීතඥ යානිගේ හෝ වෙනත් එවැනි සංගීතඥයකුගේ වාදන ඇතුළත් C D තැටි, CD player
- සිසුන් විසින් සපයා ගත් භාණ්ඩ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්**

: දක්ෂ වාදකයකු වීමට ස්වර ලිපි බලා කියවීමේ හැකියාව අත්‍යාවශ්‍ය ය. ස්වර ලිපි බලා නිවැරදි ස්ථානයන්හි පිහිටා වාදනය කිරීමට අවශ්‍ය මග පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

ගුණාත්මක බවින් පිරුණු වාදනයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්තිය ළඟා කර ගැනීම ඉතා ඉවසීමෙන් කළ යුතු දෙයකි. වාද්‍ය භාණ්ඩය සුසර කර ගැනීම පළමුව සිදුවිය යුතු ය. මේ සඳහා විවිධ උපකරණ වර්තමානයෙහි ඇත (tuner). මෙම උපකරණයම ස්වර නිවැරදි කර ගනු සඳහා ද යොදා ගත හැක. ඒ පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.

පාඩම සංවර්ධනය :

**පියවර 01**
- දේශීය වාද්‍ය වෘන්දයක් /යානිගේ වාදනයක් ප්‍රදර්ශනය කරන්න. එසේ නොමැති අවස්ථාවල ඔබ වාදනයක් ඉදිරිපත් කරන්න.
- වාදන කුසලතා පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- සිසුන් කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 01 ලබා දෙන්න.
- එම උපදෙස් අනුව අදාළ ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- ඇමුණුම 02 හි ඇතුළත් ස්වර ප්‍රස්තාර ලබා දී වාදනයට සලස්වන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- ඇමුණුම 02 හි සිසුන් විසින් පුහුණු වූ සංගීත ඛණ්ඩ තනි තනිව වයා පෙන්වීමට උපදෙස් දෙන්න.
- එය සංගීත කණ්ඩායමක ස්වරූපයෙන් වැයීමට අවශ්‍ය සංවිධානාත්මක සහය ලබා දෙන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ඔබ විසින් සපයා ගත් වෙනත් ස්වර ප්‍රස්තාරයක් වැයීමට දී ඇගයීමට ලක් කරන්න.

(මිනිත්තු 10)

**පසු වැඩ** : සිසුන් විසින් සපයා ගත් ගීත ප්‍රස්තාර නිවසේ දී පුහුණු වීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදව්** : ගීත ප්‍රස්තාර සහිත පොත

## ඇමුණුම 01

ඔබ අතට ලබා දී ඇති ස්වර ප්‍රස්තාරය පහත උපදෙස් අනුව වාදනයට පුහුණු වන්න. සියලු දෙනා එක්ව සාමූහික ව සාකච්ඡා කරන්න. අවශ්‍ය විටෙක පමණක් ගුරු උපදෙස් පතන්න.

**පියවර** 1. එහි Scale (ශ්‍රැතිය) අනුව භාවිත කර ඇති ස්වර හඳුනා ගන්න.

2. ප්‍රස්තාර ගත තාලයට අනුව ස්වර ප්‍රස්තාරය රිද්මයානුකූල ව කියවන්න.

ප්‍රස්තාරය මාත්‍රා තුනෙන් තුන බෙදෙන ගීයක නම් 1 2 3 යනා දී වශයෙන් රිද්මයානුකූල ව ගණන් කර (count) කියවීම අරඹන්න. ප්‍රස්තාරය කියවීමේ දී විභාගය තුළ ඇති ස්වර මත ඒ ඒ මාත්‍රාවට ඇඟිල්ල තබමින් ගණින්න. වෙනත් තාලයක දී ද $\frac{4}{4}$ $\frac{6}{8}$ මෙම ක්‍රමයම අනුගමනය කරන්න.

3. රිද්මයට අනුව ස්වර යෙදී ඇති ආකාරය නිවැරදිව කියවා ගැනීම සඳහා පහත උදාහරණය පරිදි ''ට'' අක්ෂරය භාවිත කිරීම ප්‍රමාණවත් ය.

උදා: 1. ධ ප ධ / ස - රි / ග - ධ / ප - ප /

ට ට ට / ටා - ට / ටා - ට / ටා - ට /

2. ග - ම ප / ම - ග - / රි - ස නි̣ / රි - ස -

ටා - ට ට / ටා - ටා - / ටා - ට ට / ටා - ටා -

මෙසේ හොඳින් පුහුණු වීමෙන් ප්‍රස්තාරය තුළ ස්වර ගමන් කරනු ලබන රටාව වටහා ගත හැක.

4. දැන් ස්වරාකාරයෙන් ප්‍රස්තාර කියවන්න.

(මෙහි දී ස්වර ගායනා කිරීම නොව කතා කරන හඬින් රිද්මයානුකූලව ස්වර කියවීම අපේක්ෂා කෙරේ.)

5. පෙර 3 හා 4 හි අත්දැකීම් අනුව ඔබගේ වාද්‍ය භාණ්ඩයෙන් ගුරුවරයා ලබා දුන් ප්‍රස්තාරය වාදනය කරන්න.

## ඇමුණුම 02

සියලු අංග සහිත වූ මෙතෙක් යොදා නොගත් ගීතයක ගීත ස්වර ප්‍රස්තාරයක් ඔබ විසින් සපයා ගන්න.

# සේ ගීවල ස්වභාවය

**නිපුණතාව 4.0** : දේශීය සංගීතාංග පිළිබඳ ව ප්‍රයෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1 :** සිංහල පද්‍ය ගායනාවන්හි ස්වභාවය හඳුනා ගනිමින් ගායනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල** :
- සේ ගී යන්න නිර්වචනය කරයි.
  සමුද්‍රඝෝෂ විරිත යන්න නිර්වචනය කරයි.
- සාම්ප්‍රදායික නාදමාලාව ආරක්ෂා කර ගනිමින්, ගායනය කළ යුතු බව පිළිගනියි.
- සැළලිහිණි සංදේශයේ එන කවියක් සමුද්‍රඝෝෂ විරිතට අනුව ගායනය කරයි.
- වියත් බස හා ග්‍රාම්‍ය බසෙහි වෙනස සන්සන්දනාත්මක ව දකියි.

**ගුණාත්මක යෙදවුම්:**
- සැළලිහිණි සංදේශයේ එන සමුද්‍රඝෝෂ විරිතට අයත් පැහැසරණිය - මිණි පැමිණිය කවිය ලියූ දෘශ්‍යාධාරයක්.
- ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

: භාෂාව හා සාහිත්‍ය පිළිබඳ හසළ දැනුමක් ඇති උගතුන් අතින් නිර්මාණය වූ ගීත විශේෂයක් ලෙස සේ ගී හැඳින්විය හැකි බවත්, උපමා, උපමේය ශබ්ද අලංකාර, එළිවැට සහ අනුප්‍රාස රස ආදිය මතු කරමින්, එම කවි රචනා කර ඇති බවත් සිසුන්ට පහදා දෙන්න. සැළලිහිණි සංදේශයේ එන ගීත, සේ ගීවලට අයත් වන අතර ඉන් සමුද්‍රඝෝෂ විරිතට ගැයෙන ගීයක් ගායනය සඳහා මෙහිදී යොදා ගන්න. සමුද්‍රඝෝෂ විරිත අනුව ''පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට'' කවිය ස්වර ප්‍රස්තාරය සමග ගායනයට යොදා ගත හැකි ය. සමුද්‍රඝෝෂ යන පදයේ අරුත පරිදි මුහුදේ රළ නැගෙන, බසින ආකාරය මෙන් ම වෙරළෙහි රළ හැපෙන ආකාරය සිහියට නැගෙන ආකාරයට තනුව නිර්මාණය වී ඇති බැවින් එම විරිත සමුද්‍රඝෝෂ නම් වන බව පහදා දෙන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- සංදේශ කාව්‍යයක එන ළමුන් කැමති කවියක් ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ ගීතය අගයන්න.
- සමුද්‍රඝෝෂ විරිතට අනුව ගැයෙන මෙම කවිය එහි භාව රිද්ම වඩාත් හොඳින් ප්‍රකාශ වන පරිදි ගායනය කර පෙන්වන්න.
- අනාඝාතාත්මක ව ගැයෙන එම ගීතය පිළිබඳ සාකච්ඡාවක් කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- දෘශ්‍ය උපකරණය මගින් ගීතය ප්‍රදර්ශනය කරන්න.
- කොටසින් කොටස ගායනය හුරු කරන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් හා තනි තනිව මෙම කවිය ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වඩාත් භාවාත්මක ව ගායනා කළ සිසුන් අගයන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

වඩාත් භාවාත්මක ව හා නිවැරදි ව ගායනය කරන සිසු සිසුවියන් පන්තිය ඉදිරියට කැඳවා ගීත ගායනයට සලස්වා අගයන්න.

(මිනිත්තු 10)

**පසු වැඩ** : නිදහස් කාලවල දී සමුද්‍රඝෝෂ වෘත්තයට අයත් වෙනත් කවියක් ගායනයට පුහුණු කරන්න.

උදා: සුර රද සමන් සමගින් සුරඟන එවර

**අතිරේක උදව්** : 2007 ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ ගුරු මාර්ගෝපදේශයේ 10 ශ්‍රේණිය පොත පරිශීලනය කරන්න.

## ගුත්තිල කාව්‍යයේ ගී ගයමු

**ක්‍රියාකාරකම 20**

**නිපුණතාව 4.0** : දේශීය සංගීතාංග පිළිබඳ ව ප්‍රයෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1** : සිංහල පද්‍ය ගායනාවන්හි ස්වභාවය හඳුනා ගනිමින් ගායනය කරයි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :

- ගුත්තිල කාව්‍යයේ පැදි ගායනය කරයි.
- ගුත්තිල කාව්‍යයේ පැදි විවිධ විරිත් අනුව රචනා කර ඇති බව නිදර්ශනාත්මක ව හඳුනා ගනියි.
- ගුත්තිල කාව්‍ය රචකයා නම් කරයි.
- ගුත්තිල කාව්‍යයේ පැදි ඒ ඒ විරිතට උචිත හා ප්‍රචලිත ව ඇති නාදමාලාවට අනුව ගායනා කරයි.

**ගුණාත්මක යෙදවුම්:**

- ගුත්තිලයේ පද්‍ය ලියූ දෘශ්‍යාධාර
- හාර්මෝනියම්
- තාලවාද්‍ය භාණ්ඩයක්

**හැඳින්වීම** : වැත්තෑවේ හිමි විසින් ලියන ලද ගුත්තිල කාව්‍යයේ එන පැදි විවිධ විරිත් අනුව රචනා වී ඇත. දොළොස්මත්, සොළොස්මත්, අටවිසිමත් ආදී වශයෙන් ගුත්තිල කාව්‍යයේ එන ගී වර්ග කළ හැකි බවත්, වියත් බසින් රචනා කර ඇති මෙම කවි ඊට උචිත නාදමාලා අනුව ගායනා කළ යුතු බවත්, සිසුන්ට පහදා දෙන්න.

- දොළොස්මත් පැදි –සදවා සුදු වැලි පිවිතුරු/රැගත් සුරා පිරූ විතින්
- සොළොස්මත් පැදි –මන්මත් කරවන දනමුළු දෙරණා
- අටවිසිමත් පැදි –රූ රැසේ අඳිනා ලෙසේ අත්

කාලඡේද 2 ක දී ඉහත ගීත තුන ස්වර ප්‍රස්තාර සමග ගායන පුහුණුවට යොදා ගැනීම කළ හැකි ය.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**

- ගුත්තිලයේ සැණකෙළි වැනුමේ එන ''සදවා සුදු වැලි පිවිතුරු හෝ රූ රැසේ '' යන කවි ගුරුවරයා විසින් ගායනය කරන්න. එම අවස්ථාව ගැන සාකච්ඡා කරන්න.
- කිහිප වරක් ම ගායනය කරන්න.
- ඒ පිළිබඳ කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.

(මිනිත්තු 10)

**පියවර 02**

- දෘශ්‍ය උපකරණ මගින් ගීත ප්‍රදර්ශනය කරන්න.
- කොටසින් කොටස ගායනයට හුරු කරන්න.
- එම ගීතයේ ප්‍රස්තාරය ද, ගායනයට හුරු කරන්න.
- ගී පද එක කණ්ඩායමකුත්, ස්වර තවත් කණ්ඩායමකුත් ආදී වශයෙන් වින්දනාත්මක ව ගායනා කරමින් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(මිනිත්තු 30)

**පියවර 03**

- කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව මෙම ගී ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ස්වර ප්‍රස්තාරය ගායනයට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

වඩාත් ම මිහිරිව හා නිවැරදි ව ගායනය කරන සිසුවා / සිසුවිය හෝ කණ්ඩායම පන්තිය ඉදිරියට කැඳවා ගීත ගායනයට සලස්වා අගයන්න.

(මිනිත්තු 10)

**පසු වැඩ** : නිදහස් කාලවල දී ගුත්තිලයේ එන කවි ගායනය පුහුණු කරන්න. ගුත්තිල කාව්‍යයේ ඇති අනෙක් කවි ඉගෙන ගත් නාද රටාවලට ගායනය කළ හැකි දැයි විමසීමට යොමු කරන්න.

**අතිරේක උදව්** : 2007 ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ ගුරු මාර්ගෝපදේශයේ 10 ශ්‍රේණිය පොත පරිශීලනය කරන්න. ගුත්තිල කාව්‍ය සපයා ගන්න.

# අපේ ජන ගී

**නිපුණතාව 4.0** : දේශීය සංගීතාංග පිළිබඳ ව ප්‍රයෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.2** : සිංහල පද්‍ය ගායනාවන්හි ස්වභාවය හඳුනා ගනිමින් ගායනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :
- ගැමි ගී යන්න නිර්වචනය කරයි.
- ගැමි ගී නිර්මාණයට බලපෑ හේතු සාධක නම් කරයි.
- එම හේතු සාධක 3ට අදාළව ගී වර්ග කරයි.
- ගැමි ගීවල සාම්ප්‍රදායික නාදමාලා අනුගමනය කරමින් ගායනා කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- මෙහෙ ගී, බැති ගී, සමාජ ගී වශයෙන් පදමාලා ලියූ පත්‍රිකා එක් වර්ගයකට ගී දෙක බැගින් සකස් කර ගැනීම.
- සර්පිනාවක්, රබානක්, බෙරයක්, දවුලක්, තාලම්පටක්
- ගැමි ගී වර්ග කර සකසාගත් වගු සටහන ඇතුළත් දෘශ්‍යාධාරකය

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

ගැමි ජීවිතයේ අත්දැකීම්, සිතුම් පැතුම් ගැමි ගීවලට අන්තර්ගත ව ඇත. ජන ගී ගැමියන් විසින් ඒ ඒ අවස්ථාවන්හි ගැයූ ගීත බවත් සිසුන්ට පහදා දෙන්න. ඊට අමතර ව ගැමි ගී නිර්මාණයට බලපා ඇති හේතු සාධක වන වෘත්තීන් මත ගොඩ නැගුණ ගී, ඇදහිලි හා විශ්වාස මත ගොඩනැගුණ ගී හා විනෝදස්වාදය හා සමාජ අවශ්‍යතාවයන් මත ගොඩනැගුණ ගී වශයෙන් වර්ගීකරණය වන බව උදාහරණ ලෙස පෙන්වා දීම කළ හැක.

පාඩම සංවර්ධනය :

**පියවර 01**
- ගැමි ගී ලියූ පත්‍රිකා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- කැමති පදමාලාවක් ගායනය කිරීමට සිසුවෙකුට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුවරයා ද එක් ගීතයක සම්ප්‍රදායික නාද මාලාව මත ගායනය කර පෙන්වන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- ගැමි ගී ලියූ පත්‍රිකා අනුව මෙහෙ ගී, ඇදහිලි ගී, සමාජ ගී යන ශීර්ෂ යටතේ වර්ග කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ගැමි ගී යන්න නිර්වචන කිරීමටත්, ශීර්ෂ තුනට අදාළ හේතු සාධක සොයා ගැනීමටත් ගුරුවරයා මඟ පෙන්වන්න.
- රැස් කරගත් තොරතුරු ආශ්‍රයෙන් ජන ගී වර්ගීකරණය පිළිබඳ වගු සටහනක් කණ්ඩායම් වශයෙන් සකස් කිරීමට උපදෙස් දෙන්න. (අමුණා ඇත)

(මිනිත්තු 20)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් සකස් කළ වගුව ඉදිරිපත් කර විස්තර කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වලට ද ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ගැමි ගී වර්ග කර සකස් කරගත් වගුව සිසු අභ්‍යාස පොතට ඇතුළත් කර ගැනීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

කණ්ඩායම් සකස් කළ වගු සියල්ල ම ප්‍රදර්ශනය කර හොඳම කණ්ඩායම තෝරා ගෙන ඇගයීමක් කරන්න.

(මිනිත්තු 05)

**පසු වැඩ** : වර්ගීකරණයට ඇතුළත් ඉතිරි ජන ගීත, නිදහස් කාල පරිච්ඡේදයක දී පුහුණු වීමට අවස්ථාව සලසා දෙන්න.

**අතිරේක උදව්** : 2007 ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ ගුරු මාර්ගෝපදේශයේ 4.2.1 නිපුණතා මට්ටමට අදාළ විෂයය කොටස් පරිශීලනය කරන්න.

**ආදර්ශ වගු සටහනක්**

| ගී වර්ගය | නිර්මාණයට පදනම් වූ හේතු සාධක | නිදර්ශන ලෙස ගැමි ගී කිහිපයක පළමු පාද |
|---|---|---|
| මෙහෙ ගී | | |
| ඇදහිලි ගී (බැති ගී) | | |
| සමාජ ගී | | |

# ආශාතාත්මක බැති ගී හා කෙළි ගී

**නිපුණතාව 4.0** : දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රයෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1** : ජන ගී වර්ග කරමින් එක් එක් වර්ගයට අයත් ගී පිළිබඳ ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- ආසාතාත්මක ගී යන්න නිර්වචනය කරයි.
- ඇදහිලි ගී යටතේ තුන්සරණේ ගීතයක් ගයයි.
- සමාජ ගී යටතේ කෙළි ගීතයක් ගයයි.
- තාල තබමින් ගීත ගයයි.
- නාදමාලාවට අනුව මෙම ගීත ගායනය කරයි.
- අනාගත පරපුර සඳහා මෙම ගීත සංරක්ෂණය කළ යුතු බව පිළිගනියි.

**ගුණාත්මක යෙදවුම්** :
- තුන් සරණේ ගීයක් හා කෙළි ගීයක් ලියූ දාශ්‍යාධාරයක්.
- සර්පිනාවක්, වයලීනයක්, බටනලාවක්, ගැටබෙරයක්, තාලම්පටක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

: බැති ගී, ඇදහිලි ගී ගණයට ද, කෙළි ගී සමාජ ගී ගණයට ද අයත් වේ. මේවා තාල තබමින් ගායනය කළ හැකි වේ. එබැවින් එම ගීත ආසාතාත්මක ගී වශයෙන් හඳුන්වන බව සිසුන්ට පහදා දෙන්න. බැති ගී යටතේ තුන් සරණේ කවියක් ද කෙළි ගී යටතේ ඔළිඳ කෙළියේ එන කවියක් ද මෙහිදී ඉගෙනීමට හැකි බව සිසුන්ට මතක් කර දෙන්න.

- තුන් සරණේ ගී - සීත ගඟුලෙදි ඇඳ පේවෙනවා - සම්මා සම්බුදු වෙන මුණිරජුනේ
- ඔළිඳ කෙළිය - දොඩම් කපාලා ඇඹුල් තනාලා

කාලච්ඡේද දෙකක දී ඉහත ගීත දෙක ගායනය පුහුණුවට යොදා ගැනීම සුදුසු වේ. තුන් සරණේ ගී ගායන හුරුව ලබා දීමේ දී කෝමළ ස්වරාශ්‍රිත නාදමාලාව සහ ශුද්ධ ස්වරාශ්‍රිත නාදමාලාව යන දෙක ම යොදා ගන්න.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- සිරිපා වන්දනා කළ අය පිළිබඳ විස්තරයක් හෝ අවුරුදු සමයේ ගෘහස්ථ ක්‍රීඩාවල ඇතුළත් ගීත මොනවාදැයි සිසුන්ගෙන් විමසන්න. ඒ අවස්ථාවන්හි ඇසෙන කවියක් ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එම කවි පිළිබඳ කෙටි සාකච්ඡාවක් කරන්න.
- තුන් සරණේ කවිවල අන්තර්ගතය සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- තුන්සරණේ ගී දෙකක් දෘශ්‍යාධාරයක් මගින් ප්‍රදර්ශනය කරන්න. ශුද්ධ ස්වරාශ්‍රිත නාදමාලාව පළමුව යොදා ගන්න.
- සර්පිනාවෙන් නාදමාලාව වයන විට පදමාලාව ගායනය කිරීමට සිසුන්ට මග පෙන්වන්න.
- ස්වර ප්‍රස්තාරය ද ගායනයට හුරු කරවන්න.

- කෝමල ස්වරාශ්‍රිත තුන් සරණේ ගී ඇතුළත් දෘශ්‍යාධාරය ද මේ ආකාරයට ප්‍රදර්ශනය කර, ගායනයට මග පෙන්වන්න.
- ගී පද එක් කණ්ඩායමකුත්, ස්වර තවත් කණ්ඩායමකුත් වන සේ ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 30)

**පියවර 03**

- ඔළිඳ කෙළියේ තෝරා ගත් ගීතය ප්‍රදර්ශනය කර ගායනය හුරු කරන්න.
- ස්වර ප්‍රස්තාර ද ගායනයට අවස්ථාව ලබා දෙන්න.
- නිවැරදි ව ගායනය කළ සිසුන් අගයන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

වඩාත් ම මිහිරි ව හා නිවැරදි ව ගායනය කරන කණ්ඩායම පන්තිය ඉදිරියට කැඳවා ගීත ගායනා කිරීමට සලස්වා අගය කිරීමක් කරන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස :**

- තුන්සරණේ කවි හා ඔළිඳ කෙළියට අයත් ගීත එකතුවක් නිර්මාණය කිරීමට යොමු කරවන්න.
- නිදහස් කාලවල දී එම ගීත ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

# අනාඝාතාත්මක ගීත ගයමු (ගැල්, පැල්, පාරු, පතල්)

**නිපුණතාව 4.0** : දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රයෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 4.1** : ජන ගී වර්ග කරමින් එක් එක් වර්ගයට අයත් ගී පිළිබඳ ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :
- අනාඝාතාත්මක ගී යන්න නිර්වචනය කරයි.
- මෙම ගීතවල ස්වභාවය හා සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- මෙහෙගී වර්ග ගායනා කරයි.
- තාල තැබිය නොහැකි බැවින් මෙහි හැගීම් ප්‍රකාශනයට වඩාත් ඉඩකඩ ඇති බව පිළිගනියි.
- හෙළ සංස්කෘතික උරුමය රැක ගැනීමට පෙළඹෙයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ගැල්කවි, පැල්කවි, පාරුකවි, පතල්කවි ලියූ දෘශ්‍යාධාර
- ස්වර වාද්‍ය භාණ්ඩයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

අනාඝාතාත්මක මෙහෙගී යටතේ එන ගීවල ස්වභාවය හා සුවිශේෂ ලක්ෂණ සිසුන්ට විස්තර කරන්න. නිශ්චිත මාත්‍රා සංඛ්‍යාවකට අනුව තාල බෙදීමක් ගැයුම තුළ විද්‍යමාන නොවන නිදහස් ව ඇද පැද ගැයෙන තනු සහිත ගී අනාඝාතාත්මක ගී නම් වේ. විවිධ වෘත්තීන් හා සබැඳි ව එම ගීත ගැයෙන බවත්, ඒවා යම් කාර්යයකට (මෙහෙයකට) අනුබද්ධ බවත් සිසුන්ට පහදා දෙන්න. මේ සඳහා සුදුසු නිර්දේශිත ගීත පහත දැක්වේ. ඔබට අභිමත වෙනත් ගීතයක් වුව ද ගායනය කළ හැක.

- ගැල්කවි - දූප්පත්කමට ගොන් බැඳගෙන දක්කනවා /
  කළුගල් තලාලයි පාරට දමන්නේ
- පැල්කවි - වෙල්යායක ගොන් දෙන්නෙක් කකා උනි /
  පෙර කාලේ කරපු අකුසල් පල දීලා
- පාරුකවි - මලේ මලේ ඔය නාමල නෙලා වරෙන් /
  පෙර බලලා පැදගෙන යන ඔරුව පිට
- පතල් කවි - දොළු කන්දේ ගලදෝ අර පෙනෙන්නේ / දඩිබිඩි ගගා / කළුවන් කළු රුවයි

එක් ගී වර්ගයක් සඳහා එක් කාලච්ඡේදයක් යොදා ගන්න.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01** ගැල් ගීයක් ගයා ඒ පිළිබඳ සංස්කෘතිකමය තොරතුරු ඉදිරිපත් කරන්න. (මිනිත්තු 05)

**පියවර 02** ගැල් ගී ගායනය හුරු කරන්න. (මිනිත්තු 25)

**පියවර 03** උගත් ගැල් ගීය තනි තනි ව ගායනයට සලසා අගය කරන්න. (මිනිත්තු 05)

(මේ අයුරින් පැල් ගී, පාරු ගී හා පතල් ගී සඳහා ද පියවර සහ කාලය යොදා ගෙන සැලසුම් කර ගන්න. එක් ගී වර්ගයකට විනාඩි 40 කි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

: වඩාත් ම මිහිරි ව හා නිවැරදි ව ගායනය කරන සිසුවා / සිසුවිය පන්තිය ඉදිරියට කැඳවා ගායනයට සලස්වා ආදර්ශයක් ලෙස අගයන්න.

**පසු අභ්‍යාස** : ගී වර්ගවලට අදාළ විස්තර හා සුවිශේෂ ලක්ෂණ හා ගීත සිසුන්ගේ අභ්‍යාස පොත්වල ලිවීමට උපදෙස් දෙන්න. වෙනත් ගැල්, පැල්, පාරු, පතල් ගීත එක්රැස් කිරීමට ද සිසුන් යොමු කරවන්න.

# නව නාට්‍ය ගී සඳහා නාඩගම් ගී ආභාසය ලැබීම

**නිපුණතාව 6.0** : රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.1** : විවිධ ශෛලීන් ආභාසය කරගත් නව නාට්‍ය සම්ප්‍රදායන් අවබෝධ කර ගනිමින් ගායනයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :
- පැරණි නාඩගම් කිහිපයක් හඳුනා ගනියි.
- පැරණි නාඩගම් නිෂ්පාදකයන් හා නව නාට්‍ය නිෂ්පාදකයන් පිළිබඳ තොරතුරු රැස් කරයි.
- සාම්ප්‍රදායික නාඩගම් ගීත තනු යොදා නිර්මාණය කර ඇති නව නාට්‍ය ගීත පිළිබඳ ව සොයා බලයි.
- පැරණි නාඩගම් ගී තනු හා ඒ අනුකාරක නව නාට්‍ය ගීත ගායනය / වාදනය කිරීමට පෙළඹෙයි.

**ගුණාත්මක යෙදවුම්**:
- සර්පිනාවක්, තාල වාද්‍ය භාණ්ඩයක් (තබ්ලාවක්)
- පටිගත කරන ලද ගීත ශ්‍රවණය සඳහා අවශ්‍ය කැසට් හෝ සී.ඩී. යන්ත්‍රයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

: 6 වන ශ්‍රේණියේ සිට 10 වන ශ්‍රේණිය දක්වා සංගීතය හදාරන දරුවන් මේ වන විට විවිධ නව නාට්‍ය ගීත ගායනා කර ඇත. එම නාට්‍ය ගීත කිනම් සංගීත සම්ප්‍රදායික ආභාසයක් ලබා ගෙන ඇත්දැයි දැනුවත් කිරීම ගුරුවරයා සතු වගකීමකි. මේ සඳහා ප්‍රචලිත නව නාට්‍ය ගීත කිහිපයක් රසවත් ව ගයා පෙන්වීමට ඔබට සිදු වේ. ඔබ විසින් ගයා වයා ඉදිරිපත් කරනු ලබන ගීත ගායනයට දරුවන් ද, දායක කර ගන්න. ඇමුණුමේ සඳහන් ගීත කිහිපයක් හෝ පටිගත කර ගැනීමට උත්සාහ ගන්න. එම ගීත සිසුන් ඉදිරියේ ඉදිරිපත් කිරීමට ඔබට හැකිවන පරිදි සූදානම් වන්න.

පාඩම සංවර්ධනය :

**පියවර 01**
- ''... ඒ .. බුදු බව පතමින් ලොබිනේ...'' (සිංහල නාඩගම් සම්ප්‍රදාය - ජී.ඩබ්. ජයන්ත අරවින්ද - පිටු අංක 46) ගීතයේ මුල් කොටස ගායනය කරන්න.
- සිසු / සිසුවියන් ලවා එය අනුකරණය කරවන්න.
  ''... මෑ වේ මා දුටු කොමළ ලියා ...'' ගීතය ගායනය කරන්න.
- ඒ ගීත දෙක අතර සම විෂමකම් පිළිබඳ ව සාකච්ඡා කරන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- ඇමුණුම 01 සිසුන් අතර බෙදා දෙන්න.
- එහි ඇතුළත් ඔබ දන්නා පැරණි ගී තනුව හා නව නාට්‍ය ගී තනුව සමාන බව පහදන්න. ගීත කිහිපයක් රසවත් ව ගායනය වාදනය කරමින් ශ්‍රවණයට සලස්වන්න.
- පැරණි නාඩගම්වල එන තනු නව නාට්‍ය කෙරෙහි බලපා ඇති අන්දම සිසුන් සමග සාකච්ඡාවක යෙදෙන්න.

(මිනිත්තු 15)

**පියවර 03**
- ඇමුණුම 01 හි සඳහන් තොරතුරු සිසුනට සටහනක් ලෙස ගොඩනගා ගැනීමට උපකාර කරන්න.

(මිනිත්තු 15)

පියවර 03 • නාට්‍ය ගීතය ගයමින් චරිත නිරූපණයක යෙදෙන්න.

(මිනිත්තු 15)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

: • නාඩගම් ශෛලියේ ගීත හා සමාන සරල ගී පිළිබඳ ව සාකච්ඡා කරන්න.

(මිනිත්තු 05)

**පසු අභ්‍යාස** :
- වාර අවසාන විවිධ ප්‍රසංගයේ අංකයක් ලෙසට පැරණි නාඩගම් ගීත හා නව නාට්‍ය ගී භාවිත කිරීමට සිසුන් මෙහෙයවන්න.
- සිසුන්ගේ සුවිශේෂ දක්ෂතා හඳුනා ගෙන සමස්ත ලංකා තරග අංක සඳහා පුහුණු කරවන්න.

**අතිරේක උදව්** :
- 2007 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පෙරදිග සංගීතය (12 වන ශ්‍රේණිය) මේ සඳහා පාදක කර ගත හැක.
- සිංහල නාඩගම් සම්ප්‍රදාය (ජී. ඩබ්ලිව්. ජයන්ත අරවින්ද)
- සිංහල නාඩගම් ගී සරණිය (පුණ්‍යසේන ගුණසිංහ) යන ග්‍රන්ථ

**ඇමුණුම 01** :

(ඔබ දන්නා ගීත පහත ලැයිස්තුවෙන් තෝරා ගෙන සටහනක් පිළියෙල කර ගන්න)

- පැරණි නාඩගම් ගීත තනු පාරම්පරිකව පැවතුන නිසා ශිල්පීන්ගේ අභාවයත් සමග එම ගී තනු අප්‍රචලිත වීම.
- නාඩගම්, ජනප්‍රියව පැවති යුගයේ අග භාගය වන විට මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා විසින් එම ගී තනු යොදා ගැනීම.

| පැරණි නාඩගම් ගීය | | | | ඒ අනුව නිර්මිත නව නාට්‍ය ගී | | |
|---|---|---|---|---|---|---|
| දුල් නිමල් සිසි සේ | - | ඉයුජින් | ⟶ | තත් සිරින් වොරැඳී | - | මනමේ |
| ගගන රිවි සොම් | - | ඇහැලේපොල | ⟶ | ඉර සඳ දෙවියනි | - | මනමේ |
| පවර පසිඳු | - | බ්‍රම්පෝඩ් | ⟶ | ලප නො ම වන් සඳ | - | මනමේ |
| ශබ්දාන්ත නක්ෂත්‍ර | - | ඇහැලේපොල | ⟶ | උදුල කරවන | - | මනමේ |
| සත් වෙත සෙත් දෙන | - | බ්‍රම්පෝඩ් | ⟶ | සත් හට සෙත් දෙන | - | මනමේ |
| මෙ මගින් ගිය | - | ඉයුජින් | ⟶ | රුසිරු ලඳුනි | - | මනමේ |
| ලෝ පසිඳු | - | බ්‍රම්පෝඩ් | ⟶ | සේ සුරිඳු | - | මනමේ |
| පින් සරු ධීරා | - | වෙස්සන්තර | ⟶ | දස දෙස ඉන්ද්‍රා | - | සිංහබාහු |
| යානත අතුල මල් පෙති | - | ඉයුජින් | ⟶ | බුදු තුල් ගුණැති | - | සිංහබාහු |
| ශ්‍රී සාර චන්ද්‍ර | - | ඉයුජින් | ⟶ | හෙනයක් සේ පතිත | - | සිංහබාහු |
| රශ්මි ප්‍රභූත වූ | - | ඇහැලේපොල | ⟶ | ඇනුදු දිගංගන | - | සිංහබාහු |

# නව නාට්‍ය ගී ගායනය

**නිපුණතාවය 6.0** : රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.2** : විවිධ ශෛලීන් ආභාසය කරගත් නව නාට්‍ය සම්ප්‍රදායන් අවබෝධ කර ගනිමින් ගායනයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :
- නව නාට්‍ය සම්ප්‍රදාය හා නාට්‍ය ශෛලීන් වෙන් කර හඳුනා ගනියි.
- තෝරා ගත් නාට්‍යයන්හි නිෂ්පාදකවරු හා සංගීත අධ්‍යක්ෂකවරු පිළිබඳ තොරතුරු රැස් කරයි.
- සම්ප්‍රදායික නාඩගම් ගීතවලට වඩා නව නාට්‍ය ගීතයන්හි තනු හා සංගීතමය අංගයන්හි වෙනසක් ඇති බව අවබෝධ කර ගනියි.
- නව නාට්‍ය ගීත ගායනය / වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- තෝරා ගත් නාට්‍ය ගීතයන්හි ගී පද මාලා, සර්පිනාවක්, තබ්ලාවක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

: 10 වන ශ්‍රේණිය දක්වා පැමිණි සංගීතය හදාරන දරුවන් මේ වන විටත් විවිධ නාට්‍ය ගීත ගායනා කර ඇති මුත්, නව නාට්‍ය ගීත හා සම්ප්‍රදායික නාට්‍ය ගීත වෙන් කර ගැනීමට හැකියාව වර්ධනය කර ගත යුතු ය. ඒ අනුව විශේෂයෙන් මනමේ, සිංහබාහු, කාලගෝල වැනි නාට්‍ය නාඩගම් ශෛලියේ ද, නව නාට්‍ය සම්ප්‍රදායේ ද යන්න වටහා දීම ගුරුවරයා සතු වගකීමකි. මේ අනුව ලංකාවේ ගැමි නාටක ගී, සාම්ප්‍රදායික නාඩගම් ගී, නූර්ති ගී වෙන් කර හඳුනා ගැනීම පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න. දෙවනුව මනමේ, සිංහබාහු, කාලගෝල, මහාසාර යන නාට්‍යවලින් එක් ගීතයක් බැගින් ගායනය / වාදනය කිරීම සඳහා පුහුණු කළ යුතුවේ. පහත දැක්වෙන ගීත මේ සඳහා වඩාත් සුදුසු ය.

සිංහබාහු - වගුරට නරනිඳු, මැවේ මා දුටු කොමළ ලියා
මනමේ - ප්‍රේමයෙන් මන, දුලා නෙතුපුලා
කාලගෝල - ආලෙ බැන්ද, අම්බරයේ සඳසේ

මෙහි දී නාට්‍ය ගීත ගායනය කිරීම හා රසාස්වාදයක යෙදීම අපේක්ෂා කෙරේ. එක් කාලච්ඡේදයක් එක් ගීතයක් ගායනය හා රස වින්දනය සඳහා යොදා ගන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- කාලගෝල නාට්‍යයේ එන ඔබ තෝරා ගත් ගීතය රංගෝචිත ලෙස ගයා වයා ඉදිරිපත් කරන්න. නාට්‍යයේ නිර්මාණ දායකත්වය හා කතා පුවත පිළිබඳ කෙටියෙන් සාකච්ඡා කරන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- සිසුන් සමග ගීතය ගායනය කර රසාස්වාදයක යෙදෙන්න. (මිනිත්තු 30)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිව කාලගෝල නාට්‍යයේ ගීතය ඉදිරිපත් කිරීමට සලසා අගයන්න. (මිනිත්තු 05)

(මනමේ - සිංහබාහු නාට්‍ය ගීත සඳහා එක් කාලච්ඡේදයක් බැගින් ඉහත පියවර හා කාලය අනුගමනය කරමින් අධ්‍යයනයට ඉඩ සලසන්න).

**පියවර 04** • ගීතය ගයන චරිතය රංගනයෙන් නිරූපණය කරමින් ගායනය කිරීමට යොමු කරන්න.

(මිනිත්තු 05)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

: • ඉතා මිහිරි ව රංගෝචිත ව හා නිවැරදි ව නාට්‍ය ගීත ගායනයේ සමත් සිසු / සිසුවියන් හඳුන්වා දෙමින් පන්තිය ඉදිරියේ ඔවුන් අගයන්න.

(මිනිත්තු 05)

**පසු අභ්‍යාස** : • වාර අවසාන විවිධ ප්‍රසංගයේ අංකයක් ලෙසට මෙම ගීත දෙකක් භාවිත කිරීමට සිසුන් මෙහෙයවන්න.

• සිසුන්ගේ සුවිශේෂ දක්ෂතා හඳුනා ගෙන විවිධ තරග අංක සඳහා පුහුණු කරවන්න.

**අතිරේක උදව්** : 2007 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 10 වන ශ්‍රේණිය 5.1.1 ක්‍රියාකාරකමේ පියවර ද මේ සඳහා පාදක කර ගත හැක.

සිංහබාහු - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර

මනමේ - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර

කාළගෝළ - පුන්‍යසේන ගුණසිංහ

ක්‍රියාකාරකම 26

# හින්දුස්ථානි තාල පදවල අවනද්ධාක්ෂර

**නිපුණතාව 7.0** : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 7.1** : හින්දුස්ථානි තාල පද හා සම්බන්ධ අවනද්ධාක්ෂර තබ්ලාවේ නිකුත්වන අයුරු විමර්ශනය කරමින් ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- තබ්ලාවේ දායාවෙන් (දකුණෙන්) උපදින අක්ෂර නම් කරයි.
- තබ්ලාවේ බායාවෙන් (වමෙන්) උපදින අක්ෂර නම් කරයි.
- දායාවේ සහ බායාවේ එකතුවෙන් උපදින අක්ෂර නම් කරයි.
- එක් එක් අවනද්ධාක්ෂර නිකුත්වන ස්ථාන වෙන් කොට දක්වයි.
- තබ්ලා වාදනයට පෙළඹවීමක් ඇති කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**:
- තබ්ලාවක්
- තබ්ලාවෙන් වයන විවිධ අවනද්ධ අක්ෂර ලියන ලද පත්‍රිකාවක්
- තබ්ලාවේ මුහුණත දැක්වෙන රූප සටහනක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

8 හා 9 ශ්‍රේණිවල දී තාල පද අධ්‍යයනය කර ඇති නිසා හින්දුස්ථානි තාල පදවල එන අවනද්ධාක්ෂර පිළිබඳ මේ වන විට සිසුවාට අවබෝධයක් ඇත. නමුත් එම අක්ෂර වෙන් වෙන් වශයෙන් ගෙන අධ්‍යයනය කර නොමැති බැවින් ඒවා හඳුනා ගැනීමත් තබ්ලාවෙන් ඒවා නිකුත් වන ආකාරය පිළිබඳවත් සිසුන් දැනුවත් විය යුතුය. මේ සඳහා සුදුසු පරිදි හඬ නිපදවෙන තබ්ලාවක් සපයා ගැනීම අත්‍යවශ්‍ය ය. ගුරුවරයාට ඒ පිළිබඳ නිපුණතාවය අඩු නම් ශ්‍රව්‍ය / දෘශ්‍ය තැටි / පටි මගින් මෙම පාඩම සංවර්ධනය කළ හැක.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- ඇමුණුමේ දක්වා ඇති රූප සටහන් දෘශ්‍ය උපකරණයක් මගින් පෙන්වන්න.
- නිර්දේශිත තාල පදයක් තබ්ලාවෙන් වයන්න. තබ්ලා වාදනය කළ නොහැකි නම් ශ්‍රව්‍ය / දෘශ්‍ය පට / තැටි මගින් ශ්‍රවණයට සලස්වන්න.
- එම තාල පදය සිසුනට හඳුනා ගැනීමට අවස්ථාව දෙන්න.
- තිට, තා, කත් වැනි අක්ෂර කීපයක් වෙන් වෙන් ව වයා පෙන්වන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- දායාවේ සහ බායාවේ මුහුණත සහිත රූප සටහන පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එහි ඇති කොටස් එකින් එක නම් කර හඳුන්වන්න.
- දායාවේ චාන්ටි කොටසින් න,ත අක්ෂරයත් ලවයෙන් තිං යන අක්ෂරත් ස්‍යාහි කොටසින් ති, ට, රි (රෙ), තුං යන අක්ෂරත් උපදින බව පහදා දෙන්න.
- වාදනය කර පෙන්වීම වඩාත් සුදුසු ය.
- බායාවේ කත්, කි, ක, ගෙ, ස යන අක්ෂර උපදින බව පහදා දෙන්න. හැකි නම් එය වයා පෙන්වන්න.

(මිනිත්තු 30)

පියවර 03 • ඇමුණුමේ දක්වා ඇති රූප සටහන සහ වගුව ප්‍රදර්ශනය කරන්න.
• කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිව එම ක්‍රියාකාරකමේ යොදවන්න.
• සපයා ගත් තොරතුරු දෘශ්‍ය උපකරණ ආශ්‍රයෙන් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**


: • පන්තියට ඉදිරිපත් කරන තොරතුරු අගයන්න.
• තබ්ලාවෙන් අවනද්ධාක්ෂර වයමින් ඒවා පිළිබඳ ව විමසමින් අගය කරන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස** : • දාදරා තාලය තබ්ලාවෙන් වාදනයට යොමු කරන්න. (තබ්ලාවක් නොමැති නම් රූප සටහනක් මත අතැඟිලි හැසිරවීමට යොමු කරන්න.

**අතිරේක උදව්** : ඩී. ආර්. පීරිස් මහතාගේ අභිනව තාල දීපනී හා විජේරත්න රණතුංග මහතාගේ තබ්ලා ධ්වනි - රංග පෙරේරා – තබ්ලාව

**ඇමුණුම 01 :**




අවනද්ධාක්ෂර නිකුත් වන ස්ථාන අංක යොදා පහත වගුව සම්පූර්ණ කරන්න.

| අවනද්ධාක්ෂර | බායාවෙන් | දායාවෙන් |
|---|---|---|
| ගෙ | | |
| කත් | | |
| නා | | |
| තා | | |
| ති | | |
| ට | | |
| තිරිකිට | | |
| ධා | | |
| ධි | | |
| තුන් | | |

# හින්දුස්ථානී තාල පදවල අවනද්ධාක්ෂර තබ්ලාවෙන් වයන ආකාරය

**නිපුණතාව 7.0** : සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 7.2** : හින්දුස්ථානි තාල පද හා සම්බන්ධ අවනද්ධාක්ෂර තබ්ලාවේ නිකුත්වන අයුරු විමර්ශනය කරමින් ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- තබ්ලාවේ අක්ෂර උපදින ස්ථාන හඳුනා ගනියි.
- තබ්ලාව මූලික අක්ෂර වයන ආකාරය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.
- තබ්ලාව වාදනයට පෙළඹෙයි.

**ගුණාත්මක යෙදවුම්**:
- තබ්ලාවේ මුහුණතෙහි රූප සටහනක්
- තබ්ලාවේ අක්ෂර උපදින ස්ථාන පැහැදිලි කරන ලද දෘශ්‍ය උපකරණයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

පසුගිය වසරවල දී තබ්ලාව පිළිබඳ මූලික අවබෝධයක් ලැබෙන පරිදි තාල වාද්‍ය භාණ්ඩ සඳහා වූ පාඩම් කීපයක් හඳුන්වා දී ඇත. මෙහි දී තබ්ලාවේ බායාව හා දායාව යන දෙකෙහි අක්ෂර වයන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීමට අවස්ථාව සැලසේ.

රූප සටහනක් මගින් තබ්ලාවෙහි අක්ෂර උපදින ස්ථාන හඳුනා ගෙන තිබෙන නිසා එම අක්ෂර වයන ආකාරය හඳුනා ගැනීම මෙහි අරමුණයි. ප්‍රවීණ ශිල්පියෙකුගේ තබ්ලා වාදනයක වීඩියෝ දර්ශනයක් නැරඹීමට අවස්ථාව සැලසීම මෙහි දී වැදගත් වේ.

ගුරුවරයාට හොඳින් තබ්ලාව වාදනය කළ හැකි නම් එසේ අවශ්‍ය නොවේ.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- ඇමුණුම අංක 01 ඇති රූප සටහන මේ සඳහා භාවිත කරන්න.
- දායාවේ ස්‍යාහි කොටසින් උපදින අක්ෂර වාදනය කර පෙන්වන්න.
- දායාවේ චාන්ටිය කොටසින් උපදින අක්ෂර වාදනය කර පෙන්වන්න.
- දායාවේ ලව කොටසින් උපදින අක්ෂර වාදනය කර පෙන්වන්න.
- බායාවේ අක්ෂර වාදනය කර පෙන්වන්න.

(ගුරුවරයා වශයෙන් ඔබට නිවැරදි අක්ෂර මතුවන සේ තබ්ලාව වාදනය කිරීමේ ප්‍රවීණත්වයක් නොමැති නම් පින්තූර සටහන්, වීඩියෝ පට වැනි දෑ මේ සඳහා භාවිතා කරන්න)

(මිනිත්තු 10)

**පියවර 02 (අ)**
- ඇමුණුම 02 දෘශ්‍ය උපකරණයේ ඇති රූප සටහනින් දක්වෙන අක්ෂර උපදින ස්ථාන පිළිබඳ පැහැදිලි කරන්න.
- දායාවේ පමණක් උපදින අක්ෂර පිළිබඳ ව සාකච්ඡා කරන්න. වාදනය කර පෙන්වන්න. සිසුන්ට ද එය අනුකරණය කිරීමට සලස්වන්න.

**(ආ)**
- බායාවේ පමණක් උපදින අක්ෂර සඳහා ද ඉහත ක්‍රමය අනුගමනය කරන්න.
- දායාවේ සහ බායාවේ එකතුවෙන් උපදින අක්ෂර තබ්ලාව භාවිතයෙන් පැහැදිලි කරන්න.
- කායදා කොටසක් උච්චාරණයට සලස්වා එය වාදනය කිරීමට යොමු කරන්න.

(මිනිත්තු 30)

පියවර 03 • මේ පිළිබඳ ව විශේෂ ඇල්මක් දක්වන හෝ තෝරා ගත් සිසුවෙකුට අක්ෂර කිහිපයක් වාදනය කිරීමට අවස්ථාව දෙන්න.

(ති, ට අක්ෂර ඉතා පහසුවෙන් වාදනය කළ හැක.)

• සිසුන් ලවා කායදාවක් ශබ්ද නගා උච්චාරණය කර එය අනුකරණය කිරීමට සලස්වන්න.

(මිනිත්තු 20)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

• තබ්ලාවෙන් අක්ෂර කිහිපයක් වාදනයට අවස්ථාව දී අගයන්න.
• ගුරුවරයා අක්ෂරය නම් කර උපදින ස්ථානය සිසුන්ගෙන් විමසන්න.

(මිනිත්තු 10)

**පසු අභ්‍යාස** : • නිදහස් කාලච්ඡේදවල දී සංගීත කාමරයට පැමිණ තබ්ලාව වාදනය කිරීමට ඉඩ සලසා දෙන්න.

**අතිරේක උදව්** : • ඔස්තාද් ශකීර් හුසේන් හෝ වෙනත් තබ්ලා වාදකයෙකුගේ තබ්ලා වාදනයක් නිරීක්ෂණය, ශ්‍රවණය, කිරීමට සලස්වන්න.

• අන්තර්ජාලයේ තබ්ලා වාදන නිරීක්ෂණය කරන්න.

• සම්භාව්‍ය තාල දීපනී – ඩී.ආර්. පීරිස්
තබ්ලා ධ්වනි – චානක පීරිස්
තබ්ලාව - විජේරත්න රණතුංග
තබ්ලාව – රංග පෙරේරා

**ඇමුණුම 01** :

තබ්ලාවේ මුහුණතෙහි රූප සටහනක්

මේ සඳහා 2007 8 වන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් දෘශ්‍යාධාරය යොදා ගත හැකි ය.

**ඇමුණුම 02 :**

දායාවෙන් උපදින අක්ෂර

| අක්ෂරය | උපදින ස්ථානය |
|---|---|
| ති | සෑාහි කොටසේ මැදට මහපට ඇඟිල්ල හා දබරැඟිල්ල හැර ඉතිරි ඇඟිලි තුනෙන් එකවර තැළීමෙන් උපදී. |
| ට | සෑාහි කොටසේ හරි මැදට දබර ඇඟිල්ලෙන් පමණක් තැලීමෙන් උපදී. |
| රි | ''ට'' අක්ෂරය උපදින ස්ථානයෙන් ම ''රි'' අක්ෂරය උපදී. (වාදනය වන අවස්ථාව අනුව ''ට'' අක්ෂරයම ''රි'' අක්ෂරය ලෙස හැඳින්වේ. |
| තුං | දබරැඟිල්ලෙන් සෑාහි කොටසට විවෘතව තැළීමෙන් ''තුං'' අක්ෂරය උපදී. |
| න | දායාවේ වාන්ටි කොටසට දබරැඟිල්ලෙන් තැළීමෙන් ''න'' අක්ෂරය උපදී. මෙහි දී වෙදෑඟිල්ල සෑාහි කොටසේ රඳවා තබා ගත යුතු ය. |
| ත | ''න'' අක්ෂරය උපදින ස්ථානයෙන්ම දබරැඟිල්ලෙන් තැළීමෙන් ''ත'' අක්ෂරය උපදී. මෙහි දී ද වෙදෑඟිල්ල සෑාහි කොටසේ රඳවා තබා ගත යුතු ය. |
| තිං | ලවයට තැළීමෙන් ''තිං'' අක්ෂරය උපදී. |
| තිත් | ති අක්ෂර උපදින ආකාරයටමය. |

බායාවෙන් උපදින අක්ෂර

| අක්ෂරය | උපදින ස්ථානය |
|---|---|
| ක | බායාවේ මුහුණතට වම් අත ඇඟිලි සියල්ල දිග හැර අල්ල ද සමග එකවර වදින සේ තැළීමෙන් ''ක'' උපදී. මෙහි දී ක්‍රියාකාරී වන්නේ අතේ මැණික් කටුවෙන් ඉහළ කොටසයි. |
| කි | ඉහත ආකාරයෙනි. |
| කත් | ඉහත ආකාරයට ම අත ඔසවා තදින් තැළීමෙන් ''කත්'' උපදී. මෙහි දී අතේ වැලමිටෙන් ඉහල කොටස ක්‍රියාත්මක වෙයි. |
| ග | වම් අතෙහි මැදැඟිල්ල හා දබරැඟිල්ල යන ඇඟිලි දෙකෙන් එකකින් ලවය කොටසට තැළීමෙන් ''ග'' උපදී. |
| ග | 'ග' අක්ෂරය නිෂ්පත්තියේ දී වාදකයා අතට යොදන බර වෙනස් කිරීමෙන් ගෙ, ගි, ගිං, ගෙං, ගො යන අක්ෂර නිපදවා ගනී. |

දායාවේ හා බායාවේ අක්ෂර එකතුවෙන් උපදින අක්ෂර

| අක්ෂරය | උපදින ස්ථානය |
|---|---|
| ධා | බායාවේ ''ගෙ'' අක්ෂරයත් දායාවේ ''න'' අක්ෂරයත් යන දෙක එකවර වැයීමෙන් උපදී. |
| ධිං | බායාවේ ''ගෙ'' අක්ෂරයත් දායාවේ ''තිං'' අක්ෂරයත් එකවර වැයීමෙන් උපදී. |
| ධි | බායාවේ ''ගෙ'' අක්ෂරයත් දායාවේ ''ති'' අක්ෂරයත් එකවර වැයීමෙන් උපදී. |

# ශ්‍රී ලංකාවේ ජන සංගීතයේ උන්නතියට දායක වූ සංගීතඥයෝ

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳී මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරුවෙයි.

**නිපුණතා මට්ටම 3.2** : ශ්‍රී ලංකාවේ සංගීතයේ උන්නතියට දායක වූ මෙරට සංගීතඥයින් අගය කරමින් ඔවුන්ගේ නිර්මාණ රස විඳියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- දේශීය ජන සංගීතයේ උන්නතිය සඳහා කැප වූ සංගීතවේදීන් දෙදෙනෙකුගේ ජීවන තොරතුරු මතකයේ රඳවා ගනියි.
- ඔවුන්ගේ නිර්මාණ වෙන් කර හඳුනා ගනියි.
- ඔවුන් විසින් ජන සංගීතය පිළිබඳ ව ලියන ලද ග්‍රන්ථ නම් කරයි.
- ඒවායේ අන්තර්ගතය පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඉහත කී සංගීතවේදීන් පිළිබඳ ගොනු කරගත් ජීවන තොරතුරු
- පටිගත කරගත් එම නිර්මාණ (දෙපානෝ නාට්‍යයේ පර්යේෂණ ගී වැඩසටහනෙන් ගීයක්)
- ස්වර පුවරුවක්, තාල වාද්‍ය භාණ්ඩයක්, කැසට් හෝ සී.ඩී. යන්ත්‍රයක්
- ගුරුවරයා විසින් සකස් කරගත් කියවීම් පත්‍රිකාවක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

දේශීය සංගීතයක අනන්‍යතාවය මතු කරලනු පිණිස තම තම දිවිය ඒ සඳහා ම කැප කළ යුග කිහිපයක සංගීතඥයින් දෙදෙනෙකුගේ මතකයන් දරුවන් තුළ ජීවමාන කිරීමට මෙම පාඩම ඇතුළත් කර ඇත. එම සංගීතඥයින් අතරින් ඩබ්.බී. මකුලොලුව හා සී.ද.එස්. කුලතිලක දෙපළගේ ජීවන තොරතුරු, සංගීතය සඳහා කළ කැපකිරීම්, නිර්මාණ දායකත්වය අගය කිරීමටත්, මතකයෙන් ගිලිහී යන ඔවුන්ගේ අමිල සේවාව මතු පරපුර වෙත සම්ප්‍රේෂණය කිරීමටත්, මෙම පාඩම 10 ශ්‍රේණියේ දරුවන්ට මහඟු පිටිවහලක් වනු ඇත. ඒ අනුව මෙම සංගීතවේදීන් දෙපළ ජන සංගීත අධ්‍යාපනයට කළ විශේෂ මෙහෙය හඳුනා ගැනීමට හා ඇගයීමට මෙම පාඩම ප්‍රයෝජනවත් වනු ඇත.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01** (පහත සඳහන් ප්‍රවේශ අතරින් ඔබ කැමති, සුදුසු ප්‍රවේශයක් භාවිත කරන්න)

(අ) දෙපානෝ නාට්‍යයේ ඔබ තෝරා ගත් ගීයක් ස්වර පුවරුව ආධාරයෙන් රසවත් ව ගයන්න.
- තාල වාදනයේ හැකියාව ඇති දරුවන් තාල වාදනය සඳහා යොදවන්න.
- එම ගීතය ශ්‍රවණයට සලස්වන්න.

(ආ) කැසට් හෝ සී.ඩී. යන්ත්‍ර මගින් 'දෑතට වළලු' ගීතය ශ්‍රවණයට සලස්වන්න.
- ශ්‍රවණය කරන ගීතය ළමුන් සමග එක්ව ගයන්න.

(ඇ) අදාළ එක් ගීතයක් ස්වර පුවරුව වාදනය කරමින් ගයන්න.
- දරුවන් ද ගායනයට එක්කර ගන්න.

(මිනිත්තු 20)

**පියවර 02**
- පන්තියේ සිසුන් කණ්ඩායම් 2කට බෙදන්න. ඩබ්ලිව්. බී. මකුලොළුව සූරීන් සහ සී. ද. ඇස්. කුලතිලක සූරින් පිළිබඳ ව ඔබ විසින් සකසා ගත් කියවීම් පත්‍රිකා කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- එම තොරතුරු පිළිබඳ ව සිසුන් අතර සංවාදයක් ඇති කරන්න. ඒ සඳහා ඔබ මූලික වන්න.
- ඉහත සඳහන් තොරතුරු සිසුන්ට සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 20)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් හෝ තනි තනි ව තොරතුරු ඉදිරිපත් කිරීමට සලසන්න.
- සෙසු අයත් ඊට දායක කරගන්න.
- අධ්‍යාපනයට ඉටු කළ සේවාවන් පිළිබඳ ඔබ පහදා දෙන්න.

(මිනිත්තු 35)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

: • තොරතුරු ඉදිරිපත් කළ දරුවන් අගයන්න.

(මිනිත්තු 05)

**පසු අභ්‍යාස** : • අදාළ සංගීතඥයන්ගේ ග්‍රන්ථ කියවීමට පොළඹවන්න. ඩබ්ලිව්. බී. මකුලොලුව සූරීන් සහ සී. ද. එස්. කුලතිලක සූරීන් විසින් ලියන ලද සංගීත ග්‍රන්ථ නම් කිරීමට සලසා අගය කරන්න.

**අතිරේක උදව්** :
- ඩබ්ලිව්. බී. මකුලොලුව, සී. ද. එස්. කුලතිලක මහත්වරුන් පිළිබඳ ව තොරතුරු සඳහන් විවිධ පොත්පත් පරිහරණය කොට සුදුසු පරිදි කියවීම් පතක් ඔබ විසින් සකසා ගන්න.
- හඬ ගුවන් විදුලි සඟරාව - 2013 ජනවාරි මාර්තු කලාපය - පිටු අංක 154, 163

ක්‍රියාකාරකම 29

# නාද නිෂ්පත්තිය සහ ප්‍රගමනය

**නිපුණතාව 9.0** : සංගීතයේ තාක්ෂණික මෙවලම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රාසංගික හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටම 9.1** : නාදයේ ත්‍රිවිධ ගුණ සහ එහි භෞතික පදනම විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- නාද සහ ශබ්ද අතර වෙනස දක්වයි.
- නාද සහ ශබ්ද විද්‍යාත්මක ව එකිනෙක සසඳයි.
- නාද උත්පාදනය වන අයුරු පැහැදිලි කරයි.
- සංඛ්‍යාතය, තරංගය, සම්පීඩනය, විරලනය වැනි පාරිභාෂික පද පැහැදිලි කරයි.
- වාතය තුළින් නාද තරංග ගමන් ගන්නා ආකාරය විස්තර කරයි.
- සංගීත ප්‍රසංගයක් ශාලාවක සහ එළිමහනක දී වඩාත් සාර්ථක ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය විද්‍යාත්මක කරුණු පිළිබඳ ව තර්ක කරයි.
- ප්‍රසංග වේදිකාවේ භාවිත කරුණු ලබන තාක්ෂණික උපකරණ (මයික්‍රෆෝන්, ඇම්ප්ලිෆයර්, මික්සර් ආදී) පිළිබඳ අධ්‍යයනය කිරීමට පෙළඹෙයි.

**ගුණාත්මක යෙදවුම්:**

- ඇමුණුම 1 වශයෙන් දක්වා ඇති විෂය කරුණු හා සම්බන්ධ රූපසටහන් හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ
- පාඩම සාර්ථක ව ඉදිරිපත් කිරීමට සුදුසු ගුරුවරයාට සපයා ගත හැකි තාක්ෂණික මෙවලම්
- 2007 පෙරදිග සංගීතය 10 ශ්‍රේණිය ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 125 හි දැක්වෙන දෘශ්‍ය උපකරණ සහ කාර්ය පත්‍රිකා

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

10 ශ්‍රේණියේ විද්‍යා විෂය නිර්දේශයෙහි ''ධ්වනිය'' යන පාඩම සිසුන්ට අධ්‍යයනය කිරීමට ඉඩ සලසා ඇත. විෂයාන්තර තිරස් සමෝධානයක් මගින් වඩාත් ඵලදායී ඉගෙනුම් අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා එම තේමාව සංගීතය හා බද්ධ කර ගනිමින් අධ්‍යයනය කිරීමට යොමු කිරීම මෙම පාඩම් කිහිපයෙන් අපේක්ෂිත ය. නාදයෙන් ශ්‍රැති ද, ශ්‍රැතිවලින් ස්වර ද ගොඩනැගී ඇති බව භාරතීය සංගීත සිද්ධාන්තවල පැහැදිලි වේ. කණට ඇසෙන සියුම් නාද එකිනෙක වෙන් කොට හඳුනාගත හැකි ලෙස වර්ග කරමින් ශ්‍රැති 22ක් ගොඩ නැගෙන බවත්, එම ශ්‍රැති 22 මත ස්වර 7ක් ස්ථාපනය වී ඇති බවත් භාරතීය සංගීතයේ දී පිළිගත් කරුණකි. මෙම විෂය කරුණු 10 ශ්‍රේණියේ දී ඉගැන්වීමට අපේක්ෂා නොකරන අතර ඒවා උසස් පෙළ පන්තියේ දී ඉගැන්වීමට යෝජනා කර ඇත.

අපේ කණට ඇසෙන සියලු හඬ, මිහිරි සහ අමිහිරි වශයෙන් කොටස් දෙකකට බෙදෙන බවත්, ඒවා නාද සහ ශබ්ද වශයෙන් නම් කරන බවත් මෙම පාඩම ආරම්භයේ දී පැහැදිලි කළ හැකි ය. එසේ ම නාද සහ ශබ්දවල විද්‍යාත්මක වෙනස ද සිසුන්ට පැහැදිලි කළ හැකි ය. එසේ ම සංගීතයේ දී යොදා ගන්නේ නාද බවත්, නාද උත්පාදනය වන අයුරු සහ අපේ කණ දක්වා ගමන් කරන අයුරු පැහැදිලි කිරීම ද මෙම පාඩමින් අපේක්ෂිත ය. මෙම ක්‍රියාකාරකම් සටහන අවසානයේ ඇමුණුම වශයෙන් දක්වා ඇති කොටස් විෂය කරුණු පැහැදිලි කිරීමට ගුරුවරයාට උපකාරී වනු ඇත.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

පියවර 01
- සංගීතයේ මාධ්‍ය නාද බවත්, නාද ශ්‍රැති වශයෙන් ද, ශ්‍රැති ස්වර වශයෙන් ද ගොඩ නැගී ඇති බව සාකච්ඡා කරන්න. අවශ්‍ය නම් ''චතුස් චතුස් චෛව'' ශ්ලෝකය ගයමින් පැරණි භාරතීය පඬිවරුන් නාද ස්වර දක්වා ගොඩ නගා ඇති අයුරු පහසුවෙන් මතක තබා ගැනීමට යොදා ගත් පිළිවෙළ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

පියවර 02
- සපත්තුවකින් බිම පිරිමැදීම, වයලීන තතත් පෙළීම වැනි ක්‍රියාකාරමක් මගින් කණට අමිහිරි සහ මිහිරි හඬ වෙන්කර ගැනීමට සිසුන්ට උදව් වන්න.
- දෘශ්‍ය උපකරණයක් මගින් ශබ්ද සහ නාද පිළිබඳ වෙනස ඉදිරිපත් කරන්න.
- නාද නිෂ්පත්තිය පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට ක්‍රියාකාරකමක යොදවන්න. නැතහොත් පැරණි ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ කාර්ය පත්‍රිකා අංක 1 ට යොමු කරන්න. ඇමුණුම 1 හි දැක්වෙන විෂය කරුණු ප්‍රදර්ශනය කරන්න.
- ඇමුණුම 2 හි දැක්වෙන විෂය කරුණු සිසුන්ට ලබා දී නාද තරංගයක් අපේ කණ දක්වා ගමන් කරන අයුරු අධ්‍යයනය කිරීමට ඉඩ සලසන්න.

(මිනිත්තු 30)

පියවර 03
- කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව පහත දැක්වෙන විෂය කරුණු පැහැදිලි කිරීමට අවස්ථාව දෙන්න.
  - ශබ්ද සහ නාද අතර වෙනස විද්‍යාත්මක ව පහදන්න
  - එක් කම්පන වාරයක් යනු
  - සංඛ්‍යාතය යනු
  - සම්පීඩන සහ විරලන මගින් නාද වාතය තුළ ගමන් ගන්නා අයුරු සහ වායුවේ දී ප්‍රවේශය
  - වාතයේ සිසිල් බව හෝ උණුසුම් බව තරංග ප්‍රගමනය සඳහා බලපාන අයුරු (වායු සමනය කළ ස්ටුඩියෝ, මධ්‍යාහ්න 12.00, සවස් කාලයේ රාත්‍රී කාලයේ ප්‍රසංග වේදිකාව)
  - රැස්වීම් ශාලාවක නාද තරංගවල පරාවර්තනය සිදුවීම ප්‍රසංගයේ ගුණාත්මක බවට බලපාන අයුරු
  - නාදයේ ගුණාත්මක බවට බලපාන තාක්ෂණික මෙවලම් (ඇම්ප්ලිෆයර්, මයික්‍රෆෝන්, බෆල් ආදිය)

(මිනිත්තු 35)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- පියවර 1, 2, 3 දී සජීවී ව සහභාගි වන සිසුන් උපස්ථම්භනය කරන්න.
- ''ශබ්ද, නාද වෙනස සහ නාද නිෂ්පත්තිය ප්‍රගමනය'' යන මැයෙන් රූපසටහන් යොදමින් පුවත්පතකට සුදුසු ලිපියක් සටහන් පොතේ ලිවීමට උපදෙස් දෙන්න.

(නිදහස් කාලයක දී සිසුන් විසින් ලියන සටහන කියවා ලකුණු ප්‍රදානය කරන්න.) (මිනිත්තු 5)


**පසු අභ්‍යාස** :
- වේදිකාවේ භාවිත කරන තාක්ෂණික මෙවලම් (ඇම්ප්ලිෆයර්, මයික්‍රෆෝන්, බෆල් ආදිය) ක්‍රියාත්මක වන අයුරු සහ ඒවායේ ගුණාත්මක බව පිළිබඳ අධ්‍යයනය කිරීමට සිසුන්ට මග පෙන්වන්න. (උපකරණ විකිණීමට සකසා ඇති සඟරා මගින් අන්තර්ජාලය තුළින්, විද්‍යුත් එන්සයික්ලෝපීඩියා මගින්, උපකරණ කුලියට සපයන ආයතන හෝ පුද්ගලයින් මගින්, නාද තාක්ෂණ ස්ටුඩියෝ නැරඹීමෙන්, ක්ෂේත්‍ර චාරිකා මගින්, සංගීත ප්‍රසංග නැරඹීම මගින්)

**අතිරේක උදව්** :
- 2007-10 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 123, 124, 125, 126


**ඇමුණුම 01**

- අපේ කණට ඇසෙන හඬ වර්ග දෙකකි. මිහිරි සහ අමිහිරි හඬ
- මිහිරි හඬ නාද වේ. අමිහිරි හඬ ශබ්ද වේ.
- සංගීතයේ දී ස්වර වශයෙන් ගොඩ නැගී ඇත්තේ කණට මිහිරි නාද ය.
- නාද නැවත නැවත ඒ ආකාරයෙන් ම ඇති කළ හැකි ය. ශබ්ද එසේ කළ නොහැක.
- නාද සමාකාරී කම්පනවලින් යුක්තයි. ශබ්ද විෂමාකාරී කම්පනවලින් යුක්තයි.
- නාද තරංගයක සහ ශබ්ද තරංගයක රූපසටහන් පහත දැක්වේ.

**රූප සටහන 01**




**රූප සටහන 02**




- කිසියම් වස්තූන් දෙකක් එකිනෙක ගැටීමෙන් ඇතිවන කම්පනයෙන් නාද හට ගනී. (රූප සටහන්වලට දැක්වෙන පරිදි නාද නිකුත් වන අයුරු නිරීක්ෂණ කරවන්න)




Figure 28.1




Figure 29.1

- (සපයා ඇති කාර්ය පත්‍රිකා 01 යොදා ගනිමින් එක් කම්පන වාරයක ගමනේ ස්වභාවය සොයන්න)
- නාද උත්පාදනයේ චලිතය කම්පනය යි. තත්පරයක දී සිදුවන කම්පන වාර ගණන සංඛ්‍යාතය යි.
- කියත් පටිය හෝ ප්ලාස්ටික් අඩිරූල දිග වැඩි නම් කම්පන වාර ගණන සංඛ්‍යාතය අඩු ය. නිකුත් වන්නේ පහළ හඬකි. කෙටි වූ විට සංඛ්‍යාතය වැඩි ය. ඉහළ නාදයක් නිකුත් වේ.
- බෝතලයේ ජලය අඩු නම් පිඹීමේ දී පහළ නාදයක් නිකුත් වන්නේ සංඛ්‍යාතය අඩු නිසා ය. ජලය වැඩියෙන් පිර වූ විට නිකුත් වන නාදය ඉහළ යන්නේ සංඛ්‍යාතය වැඩි නිසා ය.

**ඇමුණුම 02**

- නාද තරංග අපේ කණ දක්වා ගමන් කරන අයුරු




- තරංගයේ ගොඩ නැගෙන ශීර්ෂ මගින් වායු අනු එකිනෙක තෙරපේ. එය සම්පීඩනය යි. තරංගයේ ගොඩ නැගෙන නිම්න මගින් වායු අනු එකිනෙක ඉහිල් වේ. එය විරලනය යි. මෙසේ නොනවත්වා සිදුවන ක්‍රියාවලිය මගින් තරංගය අපේ කණ දක්වා ගමන් ගනියි.
- වියලි වායුවේ දී නාද තරංගයක වේගය තත්පරයකට මීටර් 331.3 කි.

# නාදයේ ත්‍රිවිධ ගුණ

**නිපුණතාව 9.0** : සංගීතයේ තාක්ෂණික මෙවලම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටම 9.1** : නාදයේ ත්‍රිවිධ ගුණ සහ එහි භෞතික පදනම විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :
- නාදයේ ත්‍රිවිධ ගුණ නම් කරයි.
- භාරතීය සංගීත සිද්ධාන්තවල දී නාදයේ ත්‍රිවිධ ගුණ නම් කළ අයුරු දක්වයි.
- බටහිර සංගීතයට අනුව ඒවා නම් කරයි.
- නාදයේ ත්‍රිවිධ ගුණ එකිනෙක පැහැදිලි කරයි.
- එක් එක් කාරණයට බලපාන හේතු දක්වයි.
- එක් එක් ගුණය හා සම්බන්ධ විෂය කරුණු රූප සටහන් දක්වමින් පැහැදිලි කරයි.
- නාද ශ්‍රැති, ස්වර වශයෙන් පෙළ ගැසී ඇති බව පිළිගනියි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුම වශයෙන් දක්වා ඇති විෂය කරුණු හා සම්බන්ධ රූපසටහන් හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ
- පාඩම සාර්ථක ව ඉදිරිපත් කිරීමට සුදුසු ගුරුවරයාට සපයා ගත හැකි තාක්ෂණික මෙවලම්
- 2007 පෙරදිග සංගීතය 10 ශ්‍රේණිය ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 129 සිට 132 දක්වෙන දෘශ්‍ය උපකරණ සහ කාර්ය පත්‍රිකා

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

නාද නිෂ්පත්තිය සහ ප්‍රගමනය පිළිබඳ පසුගිය පාඩමින් සිසුන් අධ්‍යයනය කර ඇත. මෙම පාඩමින් විපුලතාවය, තාරතාවය සහ ධ්වනි ගුණය යන නාදයේ ත්‍රිවිධ ගුණ පිළිබඳ සාකච්ඡා කිරීමට අපේක්ෂිත ය. පිළිවෙලින් රූප භේදය, උච්ච නීච භේදය සහ ජාති භේදය වශයෙන් භාරතීය සංගීත සිද්ධාන්තවල දක්වා තිබුණේ මෙම විෂය කරුණු ම බවත්, එසේ ම බටහිර සංගීතයේ දී ඒවා Magnitude, Pitch, Timber වශයෙන් නම් කරන බවත්, සිසුන්ට පැහැදිලි කිරීම අවශ්‍ය ය.

විශේෂයෙන් සංගීතය විෂයය භෞතික විද්‍යාත්මක පදනමකින් යුක්ත වන බව සිසුන්ට පැහැදිලි වන සේ පාඩම ක්‍රියාත්මක කළ යුතු වේ. මෙම ක්‍රියාකාරකම් සටහන අවසානයේ ඇමුණුම වශයෙන් දක්වා ඇති කොටස් විෂය කරුණු පැහැදිලි කිරීමට ගුරුවරයාට උපකාරී වනු ඇත.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01** එකම ගී ඛණ්ඩයක් පන්තියේ සිසුවෙකු හෝ සිසුවියකගේ සහය ඇති ව සංගීත භාණ්ඩ දෙකකින් එකවර වයා පෙන්වන්න. භාණ්ඩ දෙකට අනුව වෙන් වෙන් ව ස්වර කොටස් හඳුනා ගැනීමට සලස්වන්න. වෙන් වෙන් ව හඳුනා ගැනීමට හැකි වූයේ භාණ්ඩයේ හැඩය, අමුද්‍රව්‍ය, නාද නිකුත්වන පිළිවෙළ ආදී කරුණු මත බව සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- ඇමුණුම අංක 1 හි දක්වෙන රූපසටහන් සහ විෂය කරුණු ප්‍රදර්ශනය කර සිසුන්ට ලබා දී විපුලතාවය ඇතිවන අයුරු අධ්‍යයනයට ඉඩ සලසන්න.

තරංගයක ශීර්ෂ නිම්න, විස්තාරය ආදී සංකල්ප සාකච්ඡා කරන්න. තරංගයක විස්තාරය අඩු වැඩි වීමට පෙළීමේ බර හේතුවන බව රූපසටහන් ආදිය මගින් අධ්‍යයනයට යොමු කරන්න.

(මිනිත්තු 30)

- ඇමුණුම අංක 2 හි දැක්වෙන රූපසටහන් සහ විෂය කරුණු ප්‍රදර්ශනය කර සිසුන්ට ලබා දී තාරතාවය ඇතිවන අයුරු අධ්‍යයනයට ඉඩ සලසන්න. තරංගයක තරංග ආයාමය කෙටිවන විට සංඛ්‍යාතය ඉහළ යන අයුරු සංකල්ප සාකච්ඡා කරන්න. ඊට හේතු රූපසටහන් ආදිය මගින් අධ්‍යයනයට යොමු කරන්න.

(මිනිත්තු 30)

**පියවර 03**

- කණ්ඩායම් වශයෙන් පහත දැක්වෙන විෂය කරුණු පැහැදිලි කිරීමට අවස්ථාව දෙන්න.
  - කණ්ඩායම 1 - විපුලතාවය යනු පැහැදිලි කර තරංග විස්තාරය අඩු වැඩි වීමට හේතු සහ හඬ අඩු වැඩි වීමට බලපාන විද්‍යාත්මක හේතු පන්තිය ඉදිරියේ විස්තර කරවන්න.
  - කණ්ඩායම 2 - තාරතාවය යනු පැහැදිලි කර නාද ඉහළ පහළ වීමට බලපාන විද්‍යාත්මක හේතු පන්තිය ඉදිරියේ විස්තර කරවන්න.
  - කණ්ඩායම 3 - ධ්වනි ගුණය ඇති වීමට හේතු සාකච්ඡා කරන්න.

(මිනිත්තු 15)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- පියවර 1, 2, 3 දී සජීවී ව සහභාගි වන සිසුන් උපස්ථම්භනය කරන්න.
- ''නාදයේ ත්‍රිවිධ ගුණ සහ ඊට හේතු'' යන මැයෙන් රූපසටහන් යොදමින් පුවත්පතකට සුදුසු ලිපියක් සටහන් පොතේ ලිවීමට උපදෙස් දෙන්න.

(මිනිත්තු 05)

(නිදහස් කාලයක දී සිසුන් විසින් ලියන සටහන කියවා ලකුණු ප්‍රදානය කරන්න)

**පසු වැඩ** :


- නාදයේ ත්‍රිවිධ ගුණ පිළිබඳ ව භාරතීය සංගීත සිද්ධාන්තවලින් දක්වා ඇති විෂය කරුණු අධ්‍යයනයට ඉඩ සලසන්න.

**අතිරේක උදව්** :

- 2007 - 10 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 127 සිට 132 දක්වා


## ඇමුණුම 01

- විපුලතාවය නැතහොත් රූප භේදය යනු හඬෙහි සැර වේ.
- හඬ අඩු වැඩි වීමට බලපාන්නේ තරංගයක විස්තාරයයි.
- 0 රේඛාවේ සිට ශීර්ෂයක් හෝ නිම්නයක් ගමන් කළ උපරිම දුර විස්තාරයයි.
- විස්තාරය අඩු හෝ වැඩි වන්නේ පෙළීමේ බර අඩු හෝ වැඩිනම්ය.





## ඇමුණුම 02

- තාරතාවය නැතහොත් උච්චනීච භේදය යනු හඬෙහි ඉහළ පහළ භාවයයි.
- නාද උත්පාදකයේ
  - දිග අඩු නම්
  - ඝණකම අඩු නම්,
  - ප්‍රමාණයෙන් කුඩා නම් සංඛ්‍යාතය වැඩි ය. තාරතාවය ඉහළ ය.



**ඇමුණුම 03**

- එකිනෙක හඬ වෙන්කොට හඳුනා ගත හැකි වන්නේ ධ්වනි ගුණය නිසා ය.
- එකම සංඛ්‍යාතයක් වුව ද තරංග රටාව වෙනස්ව දකියි.
- එකිනෙක භාණ්ඩයේ හඬ වෙන් කොට හඳුනාගැනීමට තරංග රටාවේ වෙනස හේතු වෙයි.




- එකිනෙකාගේ කටහඬ වෙන් කොට හඳුනාගැනීමට තරංග රටාවේ වෙනස හේතුවන අතර, ඒ සඳහා පුද්ගලයාගේ ස්වර තන්තු, උගුරේ ප්‍රමාණය, මුඛ කුහරයේ ප්‍රමාණය, මුහුණේ මාංශපේශි ආදිය බලපායි.

# සප්තකයේ ස්වර සංඛ්‍යාත

ක්‍රියාකාරකම 31

**නිපුණතාව 9.0 :** සංගීතයේ තාක්ෂණික මෙවලම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටම 9.1 :** නාදයේ ත්‍රිවිධ ගුණ සහ එහි භෞතික පදනම විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල :**
- සප්තකයේ ස්වර එකිනෙක ඉහළ පහළ වන අයුරු පැහැදිලි කරයි.
- සප්තකයට අයත් ස්වරවල සංඛ්‍යාතයන් දක්වයි.

**ගුණාත්මක යෙදවුම් :**
- ඇමුණුම වශයෙන් දක්වා ඇති විෂය කරුණු හා සම්බන්ධ වගුවක්
- 2007 පෙරදිග සංගීතය 10 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 125

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

: සප්තකයට අයත් ස්වරවල සංඛ්‍යාතයන් එකිනෙකට වෙනස් ය. විද්‍යාවේ දී එක් ආකාරයකටත්, Concert Pitch යනුවෙන් තවත් ආකාරයකටත් සංඛ්‍යාතයන් දක්වා ඇත. පියානෝවක ස්වර 12 සුසර කරනුයේ සෑම ස්වරයක් අතර ම එක ම පරතරයක් පිහිටන ආකාරයකට ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**
- ස්වර සප්තකය ආරෝහණ අවරෝහණ වශයෙන් ගයා වයා පෙන්වන්න. ස්වර එකිනෙක ඉහළ පහළ වන අයුරු ස්වර සාකච්ඡා කරන්න.

(මිනිත්තු 05)

**පියවර 02**
- ඇමුණුම අංක 1 හි දැක්වෙන වගුව යොදා ගනිමින් සප්තකයේ ස්වරවල සංඛ්‍යාතයන් අධ්‍යයනයට යොමු කරන්න.

(මිනිත්තු 35)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් සප්තකයේ සංඛ්‍යාතයන් පැහැදිලි කිරීමට අවස්ථාව දෙන්න. ස ස්වරයේ සිට ම ස්වරයේ සංඛ්‍යාතය 3 : 4 අනුපාතයට වේ. ස ස්වරයේ සිට ප ස්වරයේ සංඛ්‍යාතය 2 : 3 අනුපාතයට වේ. ඒ අනුව එක් ස්වරයක සංඛ්‍යාතය මගින් අනෙක් ස්වරවල සංඛ්‍යාතයන් සොයා ගැනීමට අවස්ථාව දෙන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

සංඛ්‍යාත ඇතුළත් වගුවක් නිර්මාණය කිරීමට සලස්වා අගය කරන්න.
(මිනිත්තු 10)

**පසු අභ්‍යාස :** සංඛ්‍යාත ඇතුළත් වගු අධ්‍යයනය කිරීමට යොමු කරන්න.

## ඇමුණුම 01

| | ස | රි | ග | ම | ප | ධ | නි | ස |
|---|---|---|---|---|---|---|---|---|
| විද්‍යා විෂයේ දී සංඛ්‍යාතයන් | 256 | 288 | 320 | 340 | 384 | 426 | 480 | 512 |
| Concert Pitch | 262 | 294 | 330 | 349 | 392 | 440 | 466 | 524 |
| භාරතීය සංගීතයේ දී | 240 | | | 360 | | | | |
| අනුපාතය | | | | 2:3 | 3:4 | | | 1:2 |

# ගයා වයා විඳිමු හින්දි චිත්‍රපට ගී

**නිපුණතාව 5.0** : ව්‍යවහාරික සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ ව අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.1** : උතුරු ඉන්දීය චිත්‍රපට සංගීත නිර්මාණකරණයේ රාගධාරී පසුබිම සාකච්ඡා කරමින්, රස විඳිමින් ගීත ගායනයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :
- රාගාශ්‍රිත සිනමා ගී පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරයි.
- සිනමා ගීතවල සංගීත භාවිතය පිළිබඳ අවබෝධය ලබා ගනී.
- සිනමාරූපී සංගීතය යනු කවරේදැයි නිදර්ශන තුළින් අවබෝධ කර ගනියි.
- සිනමා ගී ආකෘතිය හා සරල ගීයක ආකෘතිය සසඳයි.
- රාගාශ්‍රිත සිනමා ගී ගායන වාදන රස විඳීමට පෙළඹෙයි.

**ගුණාත්මක යෙදවුම්** :
- නිර්දේශිත ගීත අන්තර්ගත DVD – VCD – CD – Pen Drive වැනි උපාංගවලින් එකක්
- සර්පිනා, ගිටාර්, ඕගන්, තබ්ලා, වයලින්, බටනලා යන සංගීත භාණ්ඩවලින් අවම වශයෙන් එකක්
- තෝරා ගන්නා ලද ගීතයේ පද මාලාව සහිත දෘශ්‍යාධාරකයක්
- අදාළ ගීතයේ Music track එකක්
- ගුරුවරයාගේ පාඩම් සැලසුමට අනුව සකසන ලද චිත්‍ර, ඡායාරූප, ලිපිලේඛන වැනි දෑ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

සිනමාරූපී සංගීතයෙහි භාව ප්‍රකාශනය හා විවිධ රස උද්දීපනය සඳහා, හින්දුස්ථානි රාගධාරී සංගීතය පදනම් ව නිර්මාණ බිහි වී ඇති ආකාරය පිළිබඳ ව ප්‍රමාණාත්මක දැනුමක් ලබා දීම හා චිත්‍රපට ගීතයක් ගායනා කිරීම මෙම පාඩමේ අරමුණ වේ.

සිනමා ගීතයක ආකෘතිය පිළිබඳ ප්‍රමාණාත්මක දැනුමක් ලබා දීම ද අපේක්ෂිත ය.

රාගාශ්‍රිත ව නිර්මාණය වූ හින්දි ගීත සඳහා පෙර අපර දෙදිග සංගීත භාණ්ඩ සුසංයෝගී ව යොදා ගැනීම එහි විචිත්‍රත්වය වැඩි වීමට හේතුවක් බව, නිර්දේශිත ගීත ඇසුරින් පහදා දෙන්න.

බෙයිජුබව්රා - මධුමතී - අභිමාන් - දෙව්දාස් - ජනක ජනක පායල් භාජේ යන චිත්‍රපට ගීත අතුරෙන්, ගුරුවරයාට පහසු එක් ගීතයක් ගායනා කිරීම අපේක්ෂිත ය.

සිනමා පටයේ අදාළ රූපරාමු සහිත DVD – VCD තැටි යොදා ගැනීමෙන් විපුල ඵල ලබාගත හැක.

එක් කාලඡේදයක් හින්දි චිත්‍රපට ගීත පිළිබඳ ව සිද්ධාන්තමය කරුණු සාකච්ඡා සඳහා යොදා ගැනීම ප්‍රමාණවත් ය.

60-70 දශකයේ විශිෂ්ට සංගීත නිර්මාණකරුවන් වන ඕපි නෛයාර්, නෞෂාඩ්, ලක්ෂ්මීකාන්ත් ප්‍යාරෙලාල්, එස්.ඩී. බර්මන්, ශංකර් ජායිකිශන්, කල්‍යාන්ජි ආනන්ද්ජි, ශලීල් චෞද්රි, රවි වැනි අයගේ නිර්මාණ පිළිබඳ ව සාකච්ඡා කිරීම මෙහි දී අපේක්ෂිත ය.

**නිර්දේශිත ගීත**

| චිත්‍රපටය | ගීතය | ආශ්‍රිත රාගය |
|---|---|---|
| බෛයිජුබව්රා | තුගංගාකි මෞජ මෙ | භෛරවී |
| අභිමාන් | තේරේමේරේ | ඛමාජ් |
| ජනක් ජනක් පායල භාජේ | ජනක ජනක පායල භාජේ | අඩානා |

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**

- අවශ්‍ය මාධ්‍යයක් උපයෝගි කර ගනිමින්, තෝරා ගන්නා ලද ගීතය ශ්‍රවණයට / නැරඹීමට සැලැස්වීම හෝ ගුරුවරයා විසින් වාද්‍ය භාණ්ඩයක ආධාරයෙන් / Music track ආධාරයෙන් ගීත රසවත් ව ඉදිරිපත් කිරීම.
- ගීත පදමාලාව සහිත දෘශ්‍යාධාරක / චිත්‍ර / ඡායාරූප ප්‍රදර්ශනය කරන්න.

(මිනිත්තු 10)

**පියවර 02**

- ගීතයෙහි ස්ථායි සහ අන්තරා කොටස් නිවැරදි ව ගයන තුරු, පන්තියට ගැළපෙන ක්‍රමවේදයක් ඔස්සේ ගායනයට හුරු කරවන්න.
- සදොස් තැන් ඇතොත් නිදොස් කර, උපස්ථම්භනය කරන්න.

(මිනිත්තු 70)

**පියවර 03**

- පන්ති කාමරයෙහි ශිෂ්‍ය සංඛ්‍යාවට සරිලන ක්‍රමවේදයක් ඔස්සේ ගායනය ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව සලසා දෙන්න.

  (වාදනය කිරීමට සමත් සිසුන්ගේ සහාය ඒ සඳහා යොදා ගන්නේ නම් මැනවි / Music track යොදා ගත හැක.)
- ගායනයෙන් තමා අත්විඳි හැඟීම් අනුසාරයෙන්, නිදහස් අදහස් ප්‍රකාශනයට අවස්ථාව සලසා දෙන්න. පාඩමේ අරමුණු ඉටුවන ආකාරයෙන් කතිකාවක් ගොඩ නගන්න.

(මිනිත්තු 40)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ඉදිරිපත් කරන ලද ගීතය අගයන්න.
- නිදහස් අදහස් ප්‍රකාශනය අගයන්න.

**පසු අභ්‍යාස :**

- කතිකාවෙන් එළිදරව් වූ කරුණු මූලාශ්‍ර කර ගනිමින්, සිනමා ගීතයේ රාගධාරී පසුබිම යන මාතෘකාව ඔස්සේ, පුවත්පතකට ලිපියක් සූදානම් කරන්න.
- සිනමා ගීතයේ රාගධාරී පසුබිම මාතෘකාව පදනම් කර ගනිමින්, නිදර්ශනාත්මක ගායනා සහිත කෙටි දෙසුමක් සාහිත්‍ය සමිතියට හෝ උදෑසන රැස්වීමේ දී කරන්න.

**අතිරේක උදව් :**

- 2007 වසරේ සිට ක්‍රියාත්මක ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.2 නිපුණතා මට්ටම

# ගයා වයා විඳිමු මව්පිය ගුණ වරුණ ගී

**නිපුණතාව 5.0** : ව්‍යවහාරික සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ ව අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 5.2 :** ශ්‍රී ලංකාවේ සරල සංගීත ක්ෂේත්‍රයේ මව්පිය ගුණ වරුණ සඳහන් ගීත ගායනයේ රසවිඳියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි.

**ඉගෙනුම් පල** :
- ගීතයක ඇති නිර්මාණශීලී අගය වටහා ගනිමින් රස විඳියි.
- ගී පදමාලා සහ තනු නිර්මාණය කිරීමට පෙළඹෙයි.
- ගීත භාවපූර්ණව ගයයි.
- දෙමාපියන් කෙරෙහි ඇති ළබැඳියාව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- කඳුළුහෙළා නැඹිලියට/ඉපදුණ දා මා හඬා වැටෙන්නැති/ගමට කලින් හිරු/ ආදරයේ උල්පත වූ අම්මා/විශාඛාව ඔබ මා දුටු බුදු සිරිතේ යන ගී අඩංගු කැසට්/CD/DVD/ පෙන්ඩ්‍රයිව් එකක්
- හාර්මෝනියම් /ඕගන්/ගිටාර් තබ්ලාවක්/හෝ වෙනත් තාල වාද්‍ය භාණ්ඩයක්
- තෝරා ගන්නා ලද ගීත දෙකෙහි පදමාලා අඩංගු දෘශ්‍යාධාරක හෝ ශිෂ්‍ය සංඛ්‍යාවට ප්‍රමාණවත් ඡායා පිටපත්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**
- පදමාලාවේ භාවාර්ථයට වඩාත් සංවේදී වන ආකාරයට මාපිය අගය වටහා දෙමින් කතිකාවක් ගොඩ නැගීම.
- පදමාලාවේ අරුත උද්දීපනය සඳහා තනුව සංගීත භාණ්ඩ සංයෝජනය හා භාවපූර්ණ ගායනය උපකාරී වන ආකාරය විමසන්න.
- වෙස්සන්තර කාව්‍යයේ එන වැලපුම් ගී නාද රටාව අනුසාරයෙන් නිර්මිත කඳුළු හෙළා නැඹිලියට ගීතයත් යමන් රාගාශ්‍රිතව නිර්මිත නැති බැරි මොහොතක පිහිටට එන්නේ, සොමිනස හෝ සංතාපය හමුවේ, මිහි මඬලේ අඳුරු කුසේ, දූණුකෙයියා මලක් වගෙ, ගමට කලින් හිරු යන මව්පිය ගුණ වරුණ ආශ්‍රිත ගී අතරින් එක් ගීතයක් ගායනයට පුහුණු කිරීම අපේක්ෂිත ය.

  මේ සඳහා ආදරයේ උල්පත වූ අම්මා, විශාඛාව ඔබ මා දුටු බුදු සිරිතේ වැනි ගීත ද යොදා ගත හැකි ය.
- මුල් ගීතයට හානියක් නොවන අයුරින් පුහුණුවීමේ වැදගත් බව පහදන්න.
- යෝජිත ගීත පන්තිය හමුවේ ඉදිරිපත් කර සිසුන් වැඩිදෙනා කැමති ගීතය පුහුණු කිරීම ඵලදායීවේ

**පාඩම සංවර්ධනය :** තෝරා ගත් ගීත ශ්‍රවණයට සලස්වන්න. නො එසේ නම් අදාළ ගීත ගායනා කළ හැකි සිසුන්ට එම ගීත වාදනය සහිත ව ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න)

**පියවර 01**
- සිසුන්ගේ කැමැත්ත අනුව ගායනය සඳහා තෝරාගත් ගීතයේ පද මාලාව ප්‍රදර්ශනය කරන්න. ඡායා පිටපත්/ සිසුන්ට ලබා දෙන්න.
- අදාළ ගීතයේ තනුව සිසුන්ට ග්‍රහණය කරගත හැකිවන සේ ගායනයට හුරු කරන්න. ගායනයෙහි සදොස්තැන් ඇතොත් නිදොස් කරන්න.

(මිනිත්තු 20)

**පියවර 02**

- ගීතය ගයමින් ශිෂ්‍ය සහභාගිත්වයෙන් රස වින්දනයට ලක් කරන්න.

- ගුරුවරයාගේ අභිමතය පරිදි ගුරුවරයා හෝ වාදන කුසලතාවයෙන් හෙබි සිසුන්ගේ සහාය වාදනය සහිත ව ගීතය ප්‍රසාංගිකව ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න.
- පුහුණුවීම් සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- ශිෂ්‍ය අදහස් උපස්ථම්භනය කරන්න.

(මිනිත්තු 80)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කළ ප්‍රාසාංගික අංග සහිත ගායනා අගයන්න.
- ප්‍රාසාංගික අංශයේ නිර්මාණාත්මක බව අගයන්න.
- ඉදිරිපත් වීම හා සාමූහික ව කටයුතු කිරීම අගයන්න.
- මව්පිය ගුණ වරුණ තේමා කරගත් පදමාලාවක් නිර්මාණය කරන්න.

(මිනිත්තු 20)

**පසු අභ්‍යාස :**

- මව්පිය ගුණ වරුණ ඇතුළත් ගීත ඇල්බමයක් හෝ පොත් පිංචක් සකසන්න.
- නිර්මාණය කළ ගීතයට සුදුසු තනුවක් ගුරුතුමාගේ මගපෙන්වීම මත නිර්මාණය කරන්න.

# ගී පද නිමවමු, තනු රටා මවමු

**නිපුණතාව 7.0** : සංගීත නිර්මාණකරණයෙහි අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 7.1:** ගී පද රචනාවක සුවිශේෂී ලක්ෂණ හඳුනාගනිමින් ගී පද නිර්මාණය කර තනු නිර්මාණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 01 යි.

**ඉගෙනුම් පල** :
- ගී පද රචනාවකට සුදුසු වන භාෂාව පිළිබඳ වටහා ගනී.
- භාව පූර්ණ ගීත නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුම 1 ළමුන් විසින් නිර්මාණය කරන ලද ගී පද රචනා ඇතුළත් දෘශ්‍ය උපකරණ
- සර්පිනාව, ඕගන් ආදී ස්වර පුවරු භාණ්ඩයක්
- තබ්ලාවක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**
- මෙම ක්‍රියාකාරකම ළමුන්ගේ ගී පද නිර්මාණ හැකියාව හා තනු රටා නිර්මාණ හැකියාව දියුණු කිරීම සඳහා යෝජනා කර ඇත. සුදුසු පරිදි ගුරුවරයා විසින් හඳුන්වා දෙන මාතෘකා ඔස්සේ ළමුන්ට ගී පද නිර්මාණයට හා තනු නිර්මාණයට මග පෙන්විය හැකි ය.

**ඉගෙනුම් ක්‍රියාවලිය :**

**පියවර 01**
- ගී පද රචනාවකට තනුවක් නිර්මාණය කිරීමේ දී පදවලට ගැළපෙන මූලික රිද්මය, ශ්‍රැතිය ගැන සිසුන්ගේ අදහස් විමසන්න.
- තනුව සරල හා සිත් ගන්නා සුළු ආකාරයේ ගීයක් සිහියට නංවා ගැයීමට සිසුන් පොළඹවන්න.
- එවැනි ගීතයන්හි කොටස් සිසුන් ලවා ගායනා කරවන්න.
- ඒ සඳහා ගුරුවරයා ද සහාය වන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.
  - නාද මාලාවේ මූලික ශ්‍රැතිය පිළිබඳ ව ඉතා සැලකිලිමත් විය යුතු බව පහදා දෙන්න.
  - පද මාලාවේ ප්‍රස්තුතාර්ථයට ගැළපෙන සේ නාද මාලාව නිර්මාණය කළ යුතු බව අවධාරණය කරන්න.
  - අවශ්‍ය පරිදි ප්‍රචලිත විරිතකට වුව ද ගැළපෙන නාද රටා යෙදිය හැකි බවත් ගීතය අංග සම්පූර්ණ වීම සඳහා පෙර වාදනය - ස්ථායී - අතුරු වාදනය - අන්තරා - විචිත්‍ර කෙටි සංගීත කොටස් (Bit) අඩංගු විය යුතු බවත් විස්තර කරන්න.

**පියවර 01**
- ළමුන් විසින් නිර්මාණය කළ නව ගී පද මාලා පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- පන්තිය කණ්ඩායම් 3 කට බෙදා ගී පද මාලා තුන වෙන් වෙන් ව බෙදා දෙන්න.
- කණ්ඩායම්වලට ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ සපයන්න.
- පද මාලාවන්ට උචිත රිද්ම රටාව තෝරා ගැනීමට සහායවන්න.
- මූලික ශ්‍රැතිය තෝරා ගැනීමේ දී ස, ම, ප යන ස්වර තුනෙන් උචිත එකක් යොදා ගැනීමට සලස්වන්න.

- නිර්මාණය කරන ලද නාද රටාව මත පද ප්‍රස්තාරයට යටින් ස්වර ප්‍රස්තාර කරන්න.
- කණ්ඩායම් නිර්මාණ සමස්ත පන්තියට ම ඉදිරිපත් කරන්න.
- නාද මාලාව අසම්පූර්ණ අවස්ථා ශ්‍රැතියෙන් බැහැර අවස්ථා ඇත්නම් ගුරුවරයා ගේ මැදිහත් වීමෙන් නිදොස් කරන්න.
- නාද මාලාව විචිත්‍ර කිරීම සඳහා කෙටි ස්වර ඛණ්ඩ (Bit) නැවත වාදනය ආදී උපක්‍රම භාවිතයට සහාය වන්න.
- තාල වාද්‍ය භාණ්ඩයක් අනිවාර්යෙන් ම යොදා ගන්න.

පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- ගී පද මාලාවක් සඳහා තනු නිර්මාණයෙහි දී එහි රිද්මය වැදගත් වන බව.
- නාද මාලා නිර්මාණය සඳහා කලින් ඇසූ පිරූ බව පහසුවක් වන බව.
- පදමාලාව යම් විරිතකට ගැළපෙන්නේ නම් තනු නිර්මාණය වඩා පහසු බව.
- ප්‍රස්තුතාර්ථය නාද මාලා නිර්මාණය සඳහා වැදගත් වන බව.
- මූලික ශ්‍රැතිය නොබිඳිය යුතු බව.
- තනු නිර්මාණයේ දී ස්වර ඥානය වැදගත් වන බව.
- වාද්‍ය භාණ්ඩ භාවිතා කිරීම තනු නිර්මාණය පහසු කරවන බව.

(මිනිත්තු 40)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සාර්ථක ගීතයක් වීමට ඇතුළත් විය යුතු අංග පැහැදිලි කරයි.
- ගීතයේ තනුවේ සහ පද මාලාව අතර ප්‍රසම්බන්ධය විග්‍රහ කරයි.
- පද සඳහා තනු නිර්මාණයේ දී සැලකිල්ලට ගත යුතු කරුණු පිළිබඳ ව අදහස් දක්වයි.
- නිර්මාණාත්මක ගුණය ප්‍රදර්ශනය කරයි.
- ප්‍රස්තාරකරණයෙහි යෙදෙයි.

**ඇමුණුම 01**

ගී පද මාලා : A කණ්ඩායම නිර්මාණය කළ නව ගී පද රචනය

ගී පද මාලා : B කණ්ඩායම නිර්මාණය කළ නව ගී පද රචනය

ගී පද මාලා : C කණ්ඩායම නිර්මාණය කළ නව ගී පද රචනය

## කවියක් ගීතයක් කරමු

ක්‍රියාකාරකම 35

**නිපුණතාව 7.0** : සංගීතය නිර්මාණකරණයෙහි අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 7.1 :** ගී පද රචනාවක සුවිශේෂී ලක්ෂණ හඳුනාගනිමින් ගී පද නිර්මාණය කර තනු නිර්මාණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 4 යි.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

ලාංකික සාහිත්‍ය ක්ෂේත්‍රය තුළ ප්‍රසිද්ධ පැදි රචකයින් හා ඔවුන්ගේ කෘතීන් පිළිබඳ ව ළමුන්ගේ අදහස් විමසන්න.

**ඉගෙනුම් පල** :

- සඳැස්, නිසඳැස්, කවි දෙවර්ගයම ගී තනු මගින් අලංකාර කර ගත හැකි බව පිළිගනියි.
- සඳැස් කවියට වඩා නිසඳැස් කවියක් ගීතයක් බවට පත් කිරීමේ දී වඩාත් ස්වාධීනත්වයක් ඇති කළ හැකි බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ස්වර පුවරු භාණ්ඩ කිහිපයක් හා තාල වාද්‍ය භාණ්ඩ කිහිපයක්

**පාඩම සංවර්ධනය**

**පියවර 01**

- සංදේශ කාව්‍ය හෝ සුදෝ සුදු වැනි නූතන කවියක් ගැන තොරතුරු විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.
- කවිය සඳැස් හා නිසඳැස් වශයෙන් දෙයාකාර බව.
- ගීතයක් බවට පත් කිරීමේ දී සඳැස් කවියකට වඩා නිසඳැස් කවියක වඩාත් ස්වාධීනත්වයක් ඇති බව.
- භාවිතයේ පවතින ඇතැම් ගීත කවි ආරෙන් ලියැ වී ඇති බව.

  උදා:" ලක් වැසියන් කෙරෙහි නැමී ......" - සුනිල් එදිරිසිංහ

  " තෙල් ගාලා හිස පීරාලා නිලට නිලයි නැනෝ..." - සුනිල් ශාන්ත

  " උපන්නේ පුතෙක් වී ...." - සුදත් සමරසිංහ

  " රූ රැසේ අඳිනා ලෙසේ..." - සුසිල් ප්‍රේමරත්න, ෂෙල්ටන් ප්‍රේමරත්න
- විවිධ ක්‍රම ශිල්ප යොදා ගැනීමෙන් කවියක් ගීතයක් කළ හැකි බව.

(මිනිත්තු 15)

**පියවර 02**

- පන්තිය කුඩා කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- එක් එක් කණ්ඩායමට ස්වර පුවරුවක් බැගින් බෙදා දෙන්න.
- එක් එක් කණ්ඩායමකට පාද 4 කින් යුත් කවියක් බැගින් ලබා දෙන්න.
- කණ්ඩායම් හතරට ලබා දුන් කවිවලට තනු නිර්මාණය කිරීමට සිසුන්ට සහාය ලබා දෙන්න.
- එම තනුව හා පද ප්‍රස්තාර කරවන්න.

(මිනිත්තු 100)

**පියවර 03** :

- කණ්ඩායම්වල නිර්මාණ පන්තියට ඉදිරිපත් කරවන්න.
- ළමුන් ලවා නිර්මාණ ගායනා කරවන්න.

(මිනිත්තු 40)

**ඇගයීම** : රසවත් ලෙස ගායනය කළ කණ්ඩායම තෝරා පන්තිය ඉදිරියට කැඳවා නැවත ගායනය කිරීමට අවස්ථාව ලබා දී ඇගයීමක් කරන්න.

(මිනිත්තු 05)

**පසු වැඩ :** කැමති මාතෘකා කිහිපයක් තෝරා ගෙන කවි නිර්මාණය කර එයට සුදුසු තනු නිර්මාණය කිරීමට සිසුන් යොමු කරවන්න.

# ජප්තාල්. දීප්චන්දි යන තාල මත නිර්මාණය වූ ගීත ප්‍රස්තාර කිරීම

**නිපුණතාව 8.0** : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගිනියි.

**නිපුණතා මට්ටම 8.1 :** ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල** :

- ශ්‍රවණය කළ ගායන වාදන කොටස් ජප්තාලය සහ දීප්චන්දි තාලය මත වෙන් කොට ගැනීමේ හැකියාව ලබයි.
- ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි.
- තාල පද අතර වෙනස්කම් වටහා ගනී.
- ජප්තාලය මාත්‍රා බෙදෙන අයුරු හඳුනා ගනියි.
- දීප්චන්දි තාලයේ මාත්‍රා බෙදෙන අයුරු හඳුනා ගනියි.

**ගුණාත්මක යෙදවුම් :**

- ජප්තාලය හා දීප්චන්දි තාලය මත ප්‍රස්තාර කරන ලද ගීත ඇතුළත් දෘශ්‍ය උපකරණය
- තාල වාද්‍ය භාණ්ඩයක්
- ජප්තාලය හා දීප්චන්දි තාල පද ප්‍රස්තාර සැකසූ දෘශ්‍ය උපකරණයක්

**ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :**

ප්‍රස්තාරකරණය පිළිබඳ හැකියාව සංගීතයේ දී ඉතා වැදගත් කුසලතාවයකි. මාත්‍රා 2/3/4 ආදී සරල තාල රූප මත ප්‍රස්තාර කිරීම එතරම් අපහසු නොවුණත් මිශ්‍ර මත්කැටි සහිත මාත්‍රා 2/3 / 3/4 ආදී තාල රූප මත ප්‍රස්තාර කිරීම තරමක් සංකීර්ණ වේ. එබැවින් මෙම පාඩම සිසුන්ට අපහසුවකින් තොර ව සිත් ගන්නා සුළු ලෙස මෙය අධ්‍යයනය කිරීමට හැකිවන සේ ඉදිරිපත් කිරීම ගුරුවරයා සතු දක්ෂතාවකි. මෙම තාල මත නිර්මාණය වූ පහත දැක්වෙන ගී පද මේ සඳහා යොදා ගත හැකි ය.

ගී පද
1. රන්/ වන්ක/ රල් / සැලේs
2. මොර / හිඹුටු / දම්/පනා
3. සමිඳු / පාසුමුල / පිදෙන / විලසින්
4. සැඳෑs / කළුවර/ කුරග / ගාසුචිත්
5. රන්ම / ලක්ලෙස/ දෙව්බ / ඹුන්දෝs

මෙම ගී පද එහි තනු සිහිපත් කරමින් රසවත් ව ඔබ විසින් ගයා/වයා ශ්‍රවණයට සලසා පද ප්‍රස්තාර කිරීමට යොමු කළ යුතු ය. මීට අමතර ව කාලය තිබෙන පරිදි මෙම තාල මත ගොඩ නැගුණු වෙනත් ගී පද ද යොදා ගත හැකි ය.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**

- ජප්තාලය මත නිර්මිත ගීතයක් ගයා පෙන්වන්න.
- සිසුන්ට තාලානුකූලව අත් තැළීමට අවස්ථාව දෙන්න
- දීප්චන්දි තාලය මත නිර්මිත ගීතයක් ගායනය කරන්න.
- සිසුන්ට තාලානුකූලව අත් තැළීමට අවස්ථාව දෙන්න.
- එම ගීත 02 හි මාත්‍රා බෙදෙන ආකාරය පිළිබඳ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 20)

**පියවර 02**

- ක්‍රියාකාරකම් සැලසුමේ සඳහන් කර ඇති ජප්තාලය මත ගොඩ නැගුණ ගී පද වෙන වෙන ම ගයා වයා පෙන්වන්න.
- ජප්තාල ගී පාදය විභාග නොබෙදා දක්වා (ප්‍රස්තාර නොකර) කළුලෑල්ලේ ලියන්න.
- සිසුන්ට සිතන්න ඉඩ දෙන්න.
- දීප්චන්දි තාලය මත ගොඩ නැගුණ ගී පද ද රසවත් ව ගයා/වයා පෙන්වන්න.
- දීප්චන්දි ගී පාදය ද විභාග නොබෙදා (ප්‍රස්තාර නොකර) කළුලෑල්ලේ ලියන්න.

(මිනිත්තු 30)

**පියවර 03**

- ජප්තාල් සහ දීප්චන්දි තාලමත ගොඩ නැගුණ ගී පද සාමූහික ව හෝ තනි තනි ව ප්‍රස්තාර කිරීමට යොමු කරන්න.
- වරින් වර එම ගී පද ගයා වයා පෙන්වන්න.
- සිසුන් විසින් ශ්‍රවණ මාධ්‍යයෙන් ප්‍රස්තාර කළ ගී පද ප්‍රදර්ශනයට ඉඩ සලසා සාකච්ඡා කරන්න. අදහස් දක්වන්න. අගය කරන්න.

(මිනිත්තු 30)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ජප්තාලය හා දීප්චන්දි තාලය මත උච්චාරණය කළ හැකි ගී පාද දෙකක් නිර්මාණය කොට ප්‍රස්තාර කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- විද්‍යුත් මාධ්‍යවලින් ප්‍රචාරය වන ගීත ශ්‍රවණය කොට ජප්තාලය හා දීප්චන්දි තාලය මත නිර්මාණය වූ ගීත ලැයිස්තුවක් පිළියෙල කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

# සමග්‍රහ විෂමග්‍රහ අවග්‍රහ සහිත ගී පද ප්‍රස්තාරකරණය

**නිපුණතාව** 8.0 : සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම 8.0.1 :** ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 01 යි.

**ඉගෙනුම් පල**

- සමග්‍රහ සහිත ගී පද ප්‍රස්තාර කරයි.
- අවග්‍රහ සහිත ගී පද ප්‍රස්තාර කරයි.
- විෂමග්‍රහ සහිත ගී පද ප්‍රස්තාර කරයි.
- විවිධ ග්‍රහයන් යෙදීම තුළින් ගීතයේ මාධුර්යය ඉස්මතු වන බව පිළිගනියි.

**ගුණාත්මක යෙදවුම් :**

- සමග්‍රහ අවග්‍රහ සහ විෂමග්‍රහ සහිත ගී පද ප්‍රස්තාර කරන ලද දෘශ්‍යාධාරකය
- තාල වාද්‍ය භාණ්ඩයක්, සර්පිනාවක්
- ග්‍රහ තුනට ගායනය කළ හැකි ගීත ලැයිස්තුවක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

මේ වන විට සිසුන් විවිධ ගීත ප්‍රස්තාර අධ්‍යයනය කර ඇත. ඒ තුළින් විවිධ සංකේත රාශියක් ද හඳුනා ගෙන ඇත. මෙම ක්‍රියාකාරකම්වල දී තාලය සමග ගීතය ආරම්භ කිරීම, තාලයක පළමු මාත්‍රාවෙන් පසුව ගීතය ආරම්භ කිරීම හා තාලය ආරම්භ කිරීමට පෙර ගීතය ආරම්භ කිරීම යන විවිධතා හඳුනා ගැනීමට ඇත. මේවා අප ග්‍රහ යනුවෙන් හඳුන්වයි. ඒවා වර්ග 3කි. එනම්, සමග්‍රහ, අවග්‍රහ, විෂමග්‍රහ යනුවෙනි. එම ග්‍රහයන් යොදා ගෙන ඇති ගී පද ශ්‍රවණ මාධ්‍යයෙන් හඳුනා ගෙන ප්‍රස්තාර කිරීම මෙහි දී සිදුවන අතර ඒ මගින් සංගීතයේ ප්‍රකාශනාත්මක බවට ඒවා වැදගත් වන අයුරු හඳුනා ගත හැකි ය.

**පාඩම් සංවර්ධනය :**

**පියවර 01**

- සමග්‍රහයෙන් ආරම්භ වන ගීතයක් ගයා සිසුන්ට අත් තැළීමට අවස්ථාව සලසා දෙන්න.
- සමග්‍රහයෙන් ගායනය කළ හැකි ''දිය ගොඩ සැම තැන'' ගීතය සිසුන්ට ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒ සඳහා ආඝාතය යෙදෙන අයුරු තබ්ලාවෙන්, වෙනත් තාල වාද්‍ය භාණ්ඩයකින් හෝ අත් තැළීමෙන් ප්‍රදර්ශනය කර පෙන්වන්න.
- අවග්‍රහයෙන් හා විෂමග්‍රහයෙන් ආරම්භ වන ගීත 2ක් අත් තැළීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 05)

**පියවර 02**

- සමග්‍රහ, අවග්‍රහ, විෂමග්‍රහ යෙදෙන ගී පද ඇතුළත් ලැයිස්තුව ප්‍රදර්ශනය කරන්න.
- එම ගීත ගුරුවරයා ගයන විට සිසු අභ්‍යාස පොතේ ගීතය ලියා අදාළ ''ග්‍රහය'' ලිවීමට උපදෙස් දෙන්න.
- එම ගී පාද ප්‍රස්තාර කිරීමට ද අවස්ථාව සලස්වන්න.

(මිනිත්තු 15)

**පියවර 03** • ප්‍රස්තාරකරණ ලද ගී පාද ගායනය කරමින් සිසුන්ට අත් තැළීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 05)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

වඩාත් ම මිහිරිව, රසවත් ව, නිවැරදි ව තාල තබමින් ගායනය කරන සිසුන් පන්තිය ඉදිරියට කැඳවා තාල තබමින් ගීත ගායනයට සලස්වා ඇගයීමක් කරන්න.

(මිනිත්තු 15)

**පසු අභ්‍යාස** : විවිධ ගීත ප්‍රස්තාරවල එන ප්‍රස්තාර අධ්‍යයනය කර, ගීත ලැයිස්තුවක් සකස් කර මුල් පාදය ප්‍රස්තාර කිරීමට උපදෙස් දෙන්න.

# E-Learning , E- Encyclopedia, E-Music (MIDI)

**නිපුණතාව 9.0** : සංගීතයේ තාක්ෂණික මෙවළම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි

**නිපුණතා මට්ටම 9.1** : සංගීත අධ්‍යයනයේ, නිර්මාණයේ සහ සංරක්ෂණයේ දී පරිගණකය භාවිතය පිළිබඳ අවබෝධය ලබමින් ප්‍රායෝගික අත්හදා බැලීම්වල යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල**

- පරිගණක ආශ්‍රිත සංගීත නිර්මාණයේ දී අවශ්‍ය වන පරිගණක මෘදුකාංග සහ දෘඪාංග නම් කරයි.
- පරිගණකය සහ අන්තර්ජාලය ආශ්‍රයෙන් සංගීතය විෂය ඉගෙනීමට පෙළෙඹෙයි.
- ඒ හා සම්බන්ධ මාර්ග පැහැදිලි කරයි.
- විවිධ විෂය කරුණු විද්‍යුත් මාධ්‍යයෙන් රැස් කරයි./ රැස් කිරීමට පෙළෙඹෙයි.
- පරිගණක ආශ්‍රිත සංගීත නිර්මාණ කාර්යයන්හි යෙදීමට කැමැත්ත පළ කරයි.
- ඒ හා සම්බන්ධ මෘදුකාංග විස්තර කරයි.
- MIDI භාවිත කරමින් සංගීත නිර්මාණය කිරීමේ ක්‍රමවේද පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- MIDI භාවිත කළ හැකි යතුරු පුවරු සංගීත භාණ්ඩයක්
- විද්‍යුත් විශ්ව කෝෂ ( Electronic Encyclopedia ) CD/DVD තැටි සහ පරිගණක
- මෙහි දක්වා ඇති කියවීමේ පත්‍රිකා සහ කාර්ය පත්‍රිකා
- පරිගණකයක කොටස් නම් කළ දෘශ්‍ය උපකරණයක්
- සපයා ගත හැකි නම් අන්තර්ජාල පහසුකම්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** : :

පරිගණකය අද ලෝකයේ පන්ති කාමරයේත්, පොදුවේ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ත් අත්‍යවශ්‍ය උපකරණයක් වී හමාර ය. සංගීතය විෂය ඉගැන්වීමටත් ඉගෙනීමටත් පරිගණකය සහ අන්තර්ජාලය උචිත පරදි භාවිතා කළ හැකි ය. ඒ අනුව සංගීතය විෂය හදාරන දරුවන්ට ද ඒ පිළිබඳ මගපෙන්වීම වත්මන් සංගීත ගුරුවරුන්ගේ කාර්යභාරය වී ඇත. ඒ සඳහා පාසලේ තොරතුරු තාක්ෂණය විෂයභාර ගුරුවරයාගේ සහාය ද ලබා ගත හැකිය. භාරතීය රාගධාරී සංගීත විෂය ඉගෙනීම සඳහා අන්තර්ජාලයේ ඉන්දීය වෙබ් අඩවි රාශියක් නිර්මාණය වී ඇත. බටහිර සංගීතය පිළිබඳ ව ද ලෝකයේ විවිධ රටවලින් නිර්මිත වෙබ් අඩවි අන්තර්ජාලයේ ඇත. ඊට අමතර ව විද්‍යුත් විශ්ව කෝෂ (Electronic Encyclopedia ) CD/DVD තැටි ලෙස අද වෙළඳපොලේ මිළ දී ගැනීමට ඇත.

Encarta , Encyclopedia Britannica, වැනි විද්‍යුත් විශ්ව කෝෂ පරිශීලනය කරමින් ස්වයං අධ්‍යයනයට යොමු කළ හැකිය.

W ikipedia යනු අන්තර්ජාලයේ ප්‍රචලිත විද්‍යුත් විශ්ව කෝෂයක් ලෙස දක්වන වෙබ් අඩවියකි. වෙනත් විෂයයන්වල මෙන් ම සංගීතයට ද අයත් ඕනෑම විෂය කරුණක් මෙහි අන්තර්ගත ය. හින්දුස්ථානි සංගීතය ගැන ඉගෙනුමට පහත වෙබ් ලිපිනයන් භාවිත කළ හැකි ය.

http://en.wikipedia.org/wiki/Hindustani_classical_music
http://www.britannica.com/EBchecked/topic/266470/Hindustani-music
http://raag-hindustani.com/
https://www.swarganga.org/ssm/?gclid=CI6krJaU8LkCFTF04godChUAmg
http:// *www.wesleyan.edu/music/vim*)

අන්තර්ජාලය ඇසුරු කිරීම ප්‍රවේශමෙන් කළ යුත්තකි. විශේෂයෙන් මෙම වයසේ දරුවන් එහි ඇති අනවශ්‍ය වෙබ් අඩවි කරා පිවිසීමෙන් බේරා ගෙන අධ්‍යයන කටයුතුවලට යොමු කළ හැකි වන්නේ පාසලේ අන්තර්ජාල පහසුකම්වලින් ය. E-Learning යනු මෙවැනි විද්‍යුත් මාධ්‍ය මගින් කරනු ලබන ඉගෙනුමයි.

E-Music යනු යතුරුපුවරු සංගීත භාණ්ඩ මගින් කරනු ලබන නිර්මාණයන් ය. නූතන යතුරුපුවරු සංගීත භාණ්ඩ පරිගණකයේ ස්වරූපයට දියුණු කර ඇත. පටිගත කිරීම හා සංගීත නිර්මාණකරණය යතුරුපුවරුවෙන් පමණක් කළ හැකිය. පරිගණකය හා යතුරු පුවරුව ආශ්‍රයෙන් කරනු ලබන සංගීත නිර්මාණ ගොනු හඳුන්වන්නේ MIDI File වශයෙනි.

MIDI යන්නෙහි තේරුම Musical Instrument Digital Interface යන්නයි. එම වැකියේ වචනවල මුල් අකුරු භාවිත කිරීමෙන් MIDI යන්න සෑදී ඇත. අන්තර්ජාලය තුළ මෙම වර්ගයේ සංගීත ගොනු ලෝකය පුරා භාවිත වේ. වයලින්, ගිටාර්, බටනලා ආදි සංගීත භාණ්ඩවල හඬ සාම්ප්‍රදායික භාණ්ඩවලින් තොර ව විද්‍යුත් ක්‍රමයකට සැකසීම නූතන යතුරුපුවරුවල සහ පරිගණක මෘදුකාංගවල ඇතී මෙය MIDI යනුවෙන් හැඳින්වේ.

පරිගණකය හා MIDI භාවිතයේ දී කරනු ලබන්නේ පරිගණකයේ ගබඩා කර ඇති Sound font (ශබ්ද පෙළ) MIDI KEY BOARD වෙනත් උපකරණයක් මගින් හැසිරවීමයි.

Sound fonts යනු සාම්ප්‍රදායික සංගීත භාණ්ඩවල නාදය පටිගත කොට ඒවා ස්වර අනුපිළිවෙල කොටස් වශයෙන් සකසා MIDI KEY BOARD වැනි බාහිර උපාංගයන් ඇසුරින් හසුරුවා ගත හැකි නාද පෙළයි.

**පාඩම් සංවර්ධනය :**

**පියවර 01** පහත දැක්වෙන කරුණු අලළා කෙටි සාකච්ඡාවක් කරන්න.

- පරිගණකය පමණක් ම යොදා ගනිමින් සංගීත නිර්මාණය කළ හැකි බව.
- හඬ පටිගත කිරීම, ශබ්ද සංස්කරණය හා සංගීත සංරක්ෂණයේ දී පරිගණකය වඩාත් වැදගත් වන මෙවලමක් බව.
- පරිගණකය සහ නූතන යතුරුපුවරු යොදා ගනිමින් සංගීත අධ්‍යයනයේ යෙදිය හැකි බව.
- පරිගණකය සහ නූතන යතරුපුවරු යොදා ගනිමින් එක් අයෙකුට සම්පූර්ණ වාදක මණ්ඩලයක ඇති අවශ්‍යතා ඉටු කළ හැකි බව.
- ප්‍රසංග වේදිකාවේ දී විශාල සංගීත භාණ්ඩ සංඛ්‍යාවක් එක් අයෙකු වාදනය සඳහා යොදා ගන්නා ලෙස ට පරිගණකය භාවිත කළ හැකි බව.
- නව සහශ්‍රයේ දී සංගීත විෂය ඉගෙනුම සඳහා ද පරිගණකය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන බව.

(මිනිත්තු 05)

**පියවර 02**

- පරිගණකයක කොටස් නම් කළ දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න.
- එහි ඇති පරිගණකයේ කොටස් නම් කරමින් හඳුන්වා දෙන්න.

(මිනිත්තු 35)

- E-Learning යන්න හඳුනා ගැනීමට කියවීමේ පත්‍රිකා යොදා ගනිමින් අභ්‍යාසයක යොදවන්න.
- ඇමුණුම අංක 1, හි දැක්වෙන කියවීමේ පත්‍රිකාවල ඡායා පිටපත් ළමුන් අතර බෙදා දෙන්න.
- සංගීත නිර්මාණයේ දී අවශ්‍ය වන පරිගණක දෘඪාංග පිළිබඳ ව දෘශ්‍ය උපකරණය ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.
- කාර්ය පත්‍රිකා 1 හි දැක්වෙන අභ්‍යාසයේ නිරත කරවන්න.

(මිනිත්තු 35)

- විද්‍යුත් විශ්ව කෝෂ ( Electronic Encyclopedia ) CD / DVD තැටි සහ පරිගණක ඇසුරින් කාර්ය පත්‍රිකා 2 හි දැක්වෙන අභ්‍යාසයේ නිරත කරවන්න.

(මිනිත්තු 35)

**පියවර 03**

- පරිගණකය සංගීතය විෂය ඉගෙනුමට සහ සංගීත නිර්මාණ කාර්යන්හි දී වැදගත් වන ආකාරය පිළිබඳ සිසුන් සංවාදයක යොදවන්න.

(මිනිත්තු 35)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- පරිගණකයක කොටස් නම් කරන්න. (මිනිත්තු 05)
- E-Learning යන්න සංගීතය විෂය ඉගෙනීමේ දී වැදගත් වන අයුරු පැහැදිලි කරන්න.
- පරිගණක ආශ්‍රිත සංගීත නිර්මාණය සඳහා අවශ්‍ය මෘදුකාංග සහ දෘඪාංග පිළිබඳ පැහැදිලි කරන්න. (මිනිත්තු 05)

**පසු අභ්‍යාස** :

- සුදුසු මෘදුකාංගයක් භාවිත කර සංගීත ඛණ්ඩයක් නිර්මාණය කිරීමට මග පෙන්වන්න.
- පරිගණක පහසුකම් අවශ්‍ය පරිදි නොමැති පාසල්වල දරුවන් සංගීතය සහ පරිගණකය යන මැයෙන් පුවත් පතකට ලිපියක් සකසන්න.
- ක්ෂේත්‍ර චාරිකා අධ්‍යයනයක් මගින් පරිගණක පහසුකම් සහිත පාසලකට ළමුන් කැඳවා ගෙන ගොස් මෙම ක්‍රියාකාරකම සඳහා මග පෙන්වීම ද මේ සඳහා විකල්පයක් ලෙස යෝජනා කළ හැක.

**අතිරේක උදව්** :

- පරිගණක විද්‍යාගාර සහිත පාසල්වල තොරතුරු තාක්ෂණ ගුරුවරයා ලවා සංගීත නිර්මාණ කාර්යයන් සඳහා අවශ්‍ය මෘදුකාංග පිළිබඳ හඳුන්වා එම මෘදුකාංග ස්ථාපිත කිරීමට මග පෙන්වන්න. ඒ ඇසුරින් සිසුන් නිදහස් කාලවලදී පරිගණක ආශ්‍රිත සංගීත නිර්මාණ කාර්යයන්වල යොදවන්න.

## කාර්ය පත්‍රිකා අංක 1

1. ප්‍රදර්ශනය කළ දෘශ්‍ය උපකරණය අධ්‍යයනය කර සංගීතය හා සම්බන්ධ ක්‍රියාකාරකම්වල යෙදීමේ දී පරිගණකයක ඇතුළත් විය යුතු කොටස් නම් කර ඔබේ අභ්‍යාස පොතේ ලැයිස්තුවක් පිළියෙළ කරන්න.
2. පරිගණකයක දළ රූප සටහනක් ඇඳ එම කොටස් ලේබල් කරන්න.
3. ඔබට සපයා ඇති කියවීමේ පත්‍රිකාව හොඳින් කියවන්න.
4. එම පත්‍රිකාව ආශ්‍රයෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ගොනු කරන්න.
    - විශ්ව සංගීතය පිළිබඳ අධ්‍යනය කිරීමේ දී පරිගණකය වැදගත් වන අයුරු ඔබේ බසින් ලියන්න.
    - පරිගණකය ආශ්‍රිත ව සංගීත නිර්මාණය කරන්නෙකුට භාවිත කළ හැකි මෘදුකාංග (Software) කිහිපයක් නම් කරන්න.
    - ශබ්ද පටිගත කිරීමේ දී පරිගණකය යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.
    - සුදුසු ක්‍රමයක් හෝ මෘදුකාංගයක් භාවිත කරමින් ශබ්ද පටිගත කිරීම සඳහා පරිගණකය යොදා ගැනීමේ දී අනුගමනය කළ යුතු පියවර අනුපිළිවෙළ දක්වන්න.
5. ගුරුවරයා සමග ඔබේ අදහස් සාකච්ඡා කරන්න.
6. MIDI & E-Learning යන සංකල්පවල තේරුම ඔබේ බසින් පැහැදිලි කරන්න.

## කාර්ය පත්‍රිකා අංක 2

1. E-Encyclopidia ( ENCARTA or BRITANICA) භාවිත කරමින් පහත දැක්වෙන සංකල්ප පිළිබඳ ඉංග්‍රීසි බසින් ලියා ඇති කොටස් word document එකකට copy කරන්න.
    i. Music
    i. Harmony
    iii. Magnitude - Timber - Pitch.
    iv. Ballet
    v. Symphony
    vi. Opera.
    vii. String Instruments
    viii. Wind Instrument
    ix. Percussion Instruments.
    x. Violin family.
2. සකසා ගත් ලිපි ගොනුව Print out ලබා ගන්න. ඉංග්‍රීසි ගුරුවරයෙක්ගෙන් සහාය ලබා ගනිමින් ඒවා ලිහිල් සිංහල බසට පෙරලන්න.
3. කණ්ඩායම්වලට බෙදී සපයා ගත් කරුණු පිළිබඳ ඉංග්‍රීසි සහ සිංහල තේරුම් දක්වමින් අවශ්‍ය තැන්වල පින්තූර සටහන් යොදමින් පොත් පිංචක් සකසන්න.
4. පොත් පිංචේ ඇතුළත් දේ පන්තියට ඉදිරිපත් කරන්න.
5. සුදුසු ක්‍රම ශිල්පයක් යොදා ගනිමින් හෝ පරිගණක විද්‍යාගාරයේ ඇති මෘදුකාංගයක් යොදා ගනිමින් ඔබේ කටහඬින් ගීතයක් ගයා පරිගණකය තුළ ම පටිගත කරන්න. එහි දිස්වෙන තරංග රටාව බලන්න. (මේ සඳහා Sound forge, Adobe Audition , Acid pro වැනි මෘදුකාංගයක් යොදා ගත හැකියි)
6. ඒ සඳහා ඔබ අනුගමනය කළ ක්‍රමය පියවරින් පියවර දක්වන්න.
7. MIDI format මත නිර්මාණය කළ සංගීත ඛණ්ඩයක් පරිගණකය හරහා නම්‍ය තැටියක (Floppy Disk) හෝ Pen Drive එකකට කොපි කර එය ඉලෙක්ට්‍රොනික් යතුරු පුවරුවක රඳවා එමගින Play කර බලන්න.

8. ස්වාභාවික සංගීත භාණ්ඩවල හඬ සමග ඉලෙක්ට්‍රොනික් යතුරු පුවරුවේන් නිකුත් වන හඬ කෙතරම් දුරට ගැළපේ දැ යි යන්න පිළිබඳ ඔබේ අදහස් ලියන්න.
9. සුදුසු ක්‍රමශිල්පයක් හෝ මෘදුකාංගයක් භාවිත කර කෙටි සංගීත ඛණ්ඩයක් නිර්මාණය කරන්න.
10. ඒ සඳහා ඔබ අනුගමනය කළ ක්‍රමය පියවරින් පියවර දක්වන්න.
11. .=rejrhd iu. idlÉPd lrkak'

**කියවීමේ පත්‍රිකා අංක 01**

2007 සංගීත ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 139 සිට 143 දක්වා සකස් කර ගන්න.

# Riping Music with Computer
## (පරිගණකය ඇසුරින් සංගීතය උකහා ගැනීම හා වාදනය කිරීම)

**නිපුණතාව 9.0** : සංගීතයේ තාක්ෂණික මෙවලම් හා භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කොට ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටම 9.2** : සංගීත අධ්‍යයනයේ නිර්මාණය සහ සංරක්ෂණයේ දී පරිගණකය භාවිතය පිළිබඳ ව අවබෝධය ලබා ගනිමින් ප්‍රායෝගික අත්හදා බැලීම්වල යෙදේ.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- පරිගණක භාවිතයෙන් අත්දැකීම් ලබයි.
- සංගීතය සංරක්ෂණ තැටි පිළිබඳ අවබෝධය ලැබීමෙන් තෘප්තිමත් වෙයි.
- පරිගණකය භාවිත කිරීම මඟින් බාහිරින් ඇතුල් කරන CD තැටියක ඇති Audio files පරිගණකයට ගබඩා කිරීමට පෙළඹෙයි.
- සංගීතය උකහා ගැනීමට (Rip) හැකි මන මෘදුකාංග සෙවීමට පෙළඹෙයි.


**ගුණාත්මක යෙදුම්** :
- පරිගණකයක් හෝ කීපයක් CD, DVD, Blue Ray,Mp3 ආදී තැටි කීපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :


ලෝකය පුරා දිනෙන් දින දියුණු වෙමින් ව්‍යාප්ත වන පරිගණකය වර්තමානයේ සංගීතය කෙරෙහි කර ඇති බලපෑම අතිමහත් ය. මේ පාඩමේ දී පරිගණකය ඇසුරින් සංගීතය උකහා ගැනීම (Rip) හඳුන්වා දීම සිදු කෙරේ. පරිගණක විද්‍යාගාරය හෝ සපයාගත් පරිගණකය ඇසුරින් පාඩම ක්‍රියාත්මක කළ යුතු ය. සංගීතය ශ්‍රවණය කිරීම සඳහා නිර්මිත CD, DVD ආදී තැටි විවිධ Audio Format වලින් ඉදිරිපත් ව ඇත. ඔබ අසා ඇති MP3, Audio ආදී ඊට උදාහරණය මේවා වාදනය කළ හැකි අයුරින් නිර්මිත විවිධ Music Players ද දක්නට ලැබේ. වර්තමානයේ දී අති නවීනතම Audio/Video තැටි ලෙස Blue Rey තැටි හඳුන්වා දිය හැකි ය. මේවා Play කිරීම සඳහා නැතහොත් වාදනය කිරීම සඳහා Blue Rey Player එකක් අවශ්‍ය වේ. නැතහොත් Blue Rey Rom එකක් සවිකළ පරිගණකයක් අවශ්‍යය. සාමාන්‍යයෙන් පරිගණකයක් වාදනය කළ හැකි Audio formats ලෙස Wave, Mp 3, Audio, Wma ආදිය නම් කළ හැක. කිසියම් format එකක් පරිගණකයේ වාදනය කළ නොහැකි නම් එම format එකට අදාළව Audio Codacs (කොඩැක්ස්) වැඩ සටහන පරිගණකයට ස්ථාපිත කර ගත යුතු ය.

තවත් සැලකිය යුතු වැදගත් දෙයක් වන්නේ කිසියම් සංගීතමය තැටියක් පරිගණකයට කොපි කිරීමයි. මෙහි දී Audio format එකේ හැර අනෙක් ඕනෑම තැටියක ඇති සංගීතය Copy Paste මගින් පරිගණකයට තැන්පත් කළ හැකි නමුත් Audio CD එකක් Rip කළ යුතු ය. එසේ Rip කිරීම සඳහා පරිගණකයේ Windows Media Player එක භාවිත කළ හැක. ඒ සඳහා ගන්නා පියවර අනුගමනය කර ඔබගේ හැකියාව වර්ධනය කරගන්න.


1. පරිගණකය ක්‍රියාත්මක කර ගන්න.
2. Start Menu හි ඇති All Program තුළ ඇති Windows Media Player ක්‍රියාත්මක කරන්න.




3. දිස්වෙන රූපයේ ඉහළම තීරුවට යටින් mouse හි දකුණු හිස Click කරන්න.
4. එවිට ඔබට පෙනෙන list එකෙන් Tool යන්න. Click කරන්න. (Option)




5. දැන් ඔබට ලැබෙන වින්ඩෝවේ ඉහළ Rip Music Click ක




6. මෙහි ඇති විධානයන් අනුව තමන් Rip කර සංගීතය Copy වන තැන. එහි නම්, format එක Audio Quality ආදිය තමන්ට අවශ්‍ය ලෙස සකසා ගත හැක.

7. එහි දැක්වෙන Rip CD Automatically යන්නට (✓) ලකුණක් දමා Apply කර OK කර ගන්න. තව ද Eject CD ripping යන්නට (✓) ලකුණ දමන්න.



8. දැන් ඔබ Windows Media Player වලින් ඉවත් වන්න.
9. Audio CD තැටිය CD/DVD රොම් වෙත ඇතුල් කරන්න.

දැන් wmp ඉබේ ක්‍රියාත්මක වී ඔබේ Audio තැටිය Rip කිරීමට පටන් ගනී. අවසන් වූ පසු ඉබේ Eject වේ. (එළියට පැමිණේ) ඔබ විසින් දෙන ලද ස්ථානයේ අදාළ Files දක්නට හැක. ඔබගේ අදාළ කාර්යයෙන් පසු නැවත Option, Rip Music වෙත ගොස් Rip CD Automatically යන්නෙහි (✓) යන්න ඉවත් කර O.K කර ගන්න. නැතහොත් අපට Copy කිරීමට අනවශ්‍ය Audio CD ද ඉබේම Copy වනු ඇත.

මීට අමතර ව තවත් Music Rip කර ගන්නා ආකාරයන් ඇත. මෙහි දැක්වෙනුයේ wmp මගින් පහසුවෙන් එය කර ගන්නා ආකාරයයි.

Sound forge / jet audio / Total Audio Video Converter ආදී පිටතින් ස්ථාපන කරන ලද මෘදුකාංග මගින් ද ඉතා පහසුවෙන් ඉහත කාර්ය කර ගත හැක.

**පාඩම සංවර්ධනය :**

**පියවර 01**
- සූදානම් කර ගත් තැටි එකින් එක ප්‍රදර්ශනය කරමින් සිසුන් හා ඒ පිළිබඳ කරුණු සාකච්ඡා කරන්න.
- එම තැටිවල ඇති සංගීතය හා සම්බන්ධ File format පිළිබඳ ව සාකච්ඡා කරන්න.

මෙය පරිගණක පාඩම සඳහා ආදර්ශයක් පමණි. අදාළ මගපෙන්වීම අනුව පරිගණක භාවිත කිරීමේ දී නිවැරදි මෙනුව සඳහා ඔබට යොමු විය හැකි ය.

- එම තැටි එකින් එකට පරිගණකයට දමා වාදනය කරමින්, Copy/පිටපත් කරමින් බලන්න.
- ඒ අතුරින් Audio CD Copy කිරීමට නොහැකි බව පිළිබඳ සාකච්ඡා කරන්න.

**පියවර 02**
- හැඳින්වීමේ කොටසේ දී ඇති අංක 1 සිට සියළු ක්‍රියාකාරකම්වල සිසුන් සමඟ යෙදෙන්න.

**පියවර 03**
- සිසුන් කණ්ඩායම් කර එක් එක් තැටි වර්ග වෙන වෙනම සිසුන්ට ලබා දෙන්න.
- එම තැටි පරිගණකයට දමා වාදනය හා Copy කරන ලෙස උපදෙස් දෙන්න.
- Audio CD තැටියක් Rip කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වෙනත් මෘදුකාංගයකින් (පරිගණකයේ ඇති) Audio තැටියක් Copy කිරීමට උත්සාහ කිරීමට සිසුන් පොළඹවන්න.
- ඔවුන් විසින් සොයාගත් තොරතුරු (එක් එක් කණ්ඩායම් වලින්) පන්තිය ඉදිරියට පැමිණ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් : :**

සිසුන් ඉදිරිපත් කරන කරුණු අනුව ඔවුන් ව අගයන්න.

**පසු අභ්‍යාස :** තව තවත් Audio, Video, Files වර්ග පිළිබඳ සොයා බලන්න.

# Music Learning and Searching in Internet
## (අන්තර්ජාලය ඇසුරින් සංගීතය ඉගෙන ගැනීම සහ සෙවීම)

**නිපුණතාව 9.0** : සංගීතයේ තාක්ෂණික මෙවලම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටම 9.2** : සංගීත අධ්‍යයනයේ නිර්මාණය සහ සංරක්ෂණයේ දී පරිගණකය භාවිතය පිළිබඳ ව අවබෝධය ලබමින් ප්‍රායෝගික අත්හදා බැලීම්වල යෙදේ.

**සැ. යු.** : මෙම පාඩම ලිවීමේ දී හුදෙක් භාවිතය සහ පහසුව සලකා භාෂා රීති අභිබවා සමහර වචන ඉංග්‍රීසියෙන් ද ඇතුළත් කොට ඇත.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල:**
- you tube භාවිත කරමින් අත්දැකීම් ලබයි.
- එමගින් සංගීතයට අදාළ කරුණු ඉගෙනීමෙන් තෘප්තිමත් වෙයි.
- you tube පරිහරණය පිළිබඳ හැකියාව වර්ධනය කරගනී.
- තමාට විෂය කරුණු ඉගෙනුම පිළිබඳ ගැටළුවක් මතු වූ අවස්ථාවක ඊට විසඳුම සෙවීමට you tube භාවිතයට පෙළඹෙයි.

**ගුණාත්මක යෙදවුම්:**
- අන්තර්ජාලය හා සම්බන්ධ කරගත් පරිගණකයක් හෝ කීපයක්.
- ඉගි සඳහන් කරන ලද අත් පත්‍රිකා කීපයක්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

You Tube අන්තර්ජාලයේ ඇති විශාලතම වීඩියෝ එකතුව ඇති වෙබ් අඩවියයි. මෙහි ඇති වීඩියෝ ප්‍රමාණය කොතරම් ද යත් පුද්ගලයෙකු තම ජීවිත කාලය මුළුල්ලේ ම පරිගණකය ඉදිරිපිට සිට නැරඹුවත් You Tube යේ ඇති වීඩියෝ ප්‍රමාණය නරඹා අවසාන කළ නොහැක. ගීත, චිත්‍රපට. ටෙලි නාට්‍ය විවිධ අවස්ථා පාඩම් මාලා How to do videos ආදී විවිධ වර්ගයේ වීඩියෝ මෙහි දක්නට ලැබේ. මෙම පාඩම අන්තර්ජාල පහසුකම් නොමැති නම් පියවරයන් ඉටු කළ නොහැක. එහි දී මෙහි ඇතුළත් විෂ කරුණු ඇතුළත් වන සේ ඔබට සුදුසු You Tube අඩවිය වෙත පිවිසීම සහ පරිශීලනයට පළමු ව ඔබගේ පරිගණකය අන්තර්ජාලය වෙත සම්බන්ධ කොට ඔබ කැමති සෙවුම් යන්ත්‍රයකින් (Search Engine)

උදා : Google, Yahoo, Firefox opera යන search engine භාවිත කොට You-tube.com යනුවෙන් ටයිප් කරන්න. දැන් ඔබ You-tube web අඩවිය වෙත පිවිසී අවසානයි. දැන් එහි search යනුවෙන් සඳහන් කොටුවක් දක්නට ඇත. එය මත තමාට සෙවීමට අවශ්‍ය වීඩියෝවේ ඉගිය සඳහන් කරන්න.

උදා : How to play Guitar
How to make Guitar
How to tie to tie
How to Play Thabla

Gazal, Quwwalli, bhajan Ravi Shankar ආදී වශයෙන් තමන්ට දැන ගත යුතු ඕනෑම දෙයක් මෙහි Search කළ හැක. එවිට ඊට අදාළ වීඩියෝ ඇති Window (වින්ඩෝවක්) දිස්වෙයි. එම වින්ඩෝවේ තමාට අවශ්‍ය ඕනෑම වීඩියෝ ක්ලිප් එකක් තෝරා නැරඹිය හැක. ලෝකේ සමහර ආයතන මගින්

පාඩම් මාලා සකස් කොට මෙහි ඇතුළත් කර ඇත. එමෙන් ම ඉන්ටනෙට් ඩවුන්ලෝඩ් මැනේජර් Internet download Manager (IDM) වැනි මෘදුකාංගයක් පරිගණකය තුළ ස්ථාපිත කිරීමෙන් තමන්ට අවශ්‍ය වීඩියෝ ඩවුන් ලෝඩ් කොට ඔබේ පරිගණකයේ ගබඩා කරගත හැක. මෙම You tube වෙබ් අඩවිය සිසුන් හට මෙන් ම ගුරුවරුන් වන ඔබටත් ඔබ ගේ දැනුම යාවත්කාලීන කර ගැනීමට මෙන් ම සංවර්ධනය කර ගැනීමට ලොව ඇති විශිෂ්ටතම මාධ්‍යයක් ලෙස හඳුන්වා දිය හැක. (මීට අදාළ රූප සටහන් (SCREEN Shots) ලබා දී ඇත.

පියවර 01
- ලෝකයේ තොරතුරු ගවේෂණ මාධ්‍යයන් පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- තොරතුරු ගවේෂණ මාධ්‍යයන් නම් කරන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- වර්තමානයේ ලොව තොරතුරු දැන ගැනීම සඳහා සුදුසු ම මාධ්‍ය කුමක්දැයි සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- අන්තර්ජාලයේ යම් තොරතුරක් සෙවීම සඳහා ගවේෂණය කළ හැකි අංග පිළිබඳ සාකච්ඡා කරන්න.
- (මෙම පියවර සඳහා ඉහත හැඳින්වීම කොටසේ you tube වෙබ් අඩවියට පිවිසීම යන ස්ථානයේ සිට සඳහන් ක්‍රියාකාරකම් කරන්න.) (ළමුන් සමඟ සාකච්ඡා කරමින්)

පියවර 02
- සිසුන් කණ්ඩායම් කර මුලින් සකස් කරගත් ඉඟි පත්‍රිකා එක බැගින් බෙදා දෙන්න.
- you tube වෙත පිවිස එම ඉඟිවලට අදාළ තොරතුරු ගවේෂණයට උපදෙස් දෙන්න.
- කණ්ඩායම්වලට වෙන් වෙන් ව හෝ එක් පරිගණකයක් හෝ වෙන වෙන ම පරිගණක 4 ක් හෝ ලබා දී අදාළ ඉඟි සෙවීමෙහි පොළඹවන්න.
- සොයාගත් තොරතුරු එක් ඉඟියක් එක් සිසුවෙකුට බැගින් වෙන් වෙන් ව පන්තිය ඉදිරිපිටට පැමිණ විස්තර කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එම විස්තර අනුව මීට පෙර තමා දැනසිටි කරුණු එක තීරුවකටත් නොදැන සිටි කරුණු තවත් තීරුවකටත් වෙන් වෙන් වශයෙන් සටහන් කිරීමට සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
- ඒ අනුව you tube භාවිතයෙන් තම දැනුමෙහි හිඩැස් පිරෙන ආකාරය පිළිබඳ සිසුන් සමඟ සකච්ඡා කරන්න.
- you tube ඇසුරින් සොයාගත් කරුණු ඉදිරිපත් කිරීමේ දී ඔවුන් ම අගයන්න. තම දැනුමෙහි (යම් විෂය කරුණු පිළිබඳ ව) හිඩැස් පිරවෙන ආකාරය ස්වයංව අධ්‍යයනය කිරීමට ලබා ගත් හැකියාව පිළිබඳ ව අගයන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- you tube ඇසුරින් සොයාගත් කරුණු ඉදිරිපත් කිරීමේ දී ඔවුන් ම අගයන්න. තම දැනුමෙහි (යම් විෂය කරුණු පිළිබඳ ව) හිඩැස් පිරවෙන ආකාරය ස්වයංව අධ්‍යයනය කිරීමට ලබා ගත් හැකියාව පිළිබඳ ව අගයන්න.
- සංගීතයට සම්බන්ධ තවත් විෂය කරුණු සෙවීමට පොළඹවන්න. තමාගේ ජීවිතයට අදාළ විෂය කරුණු ද (How to tie to tie) සෙවීමෙහි පොළඹවන්න. (you tube) ඇසුරින්

**අතිරේක උදව්:**
- you tube web අඩවියට How to use you tube for find Something? යනුවෙන් ටයිප් කොට තොරතුරු සොයන්න.

How to use you tube correctly and more faster? යනුවෙන් ටයිප් කොට තොරතුරු සොයන්න.

**ඇමුණුම**

**ඉඟි පත්‍රිකා**

**1 වන පත්‍රිකාව**

1. How to be a Perfect singer?
2. How to play guitar with chords?

**2 වන පත්‍රිකාව**

1. Body of Violin
2. Body of guitar

**3 වන පත්‍රිකාව**

1. How to Convert Audio file to MP3?
2. Windows Media Player

**4 වන පත්‍රිකාව**

1. Violin Family
2. Song from abhiman Hindi film

# ලයනල් රන්වල, රෝහණ බැද්දගේ සංගීතඥයෝ

**නිපුණතාවය** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟාකර ගැනීමට හුරුවෙයි.

**නිපුණතා මට්ටම** : ශ්‍රී ලංකාවේ සංගීතයේ උන්නතියට දායක වූ මෙරට සංගීතඥයින් අගය කරමින් ඔවුන්ගේ නිර්මාණ රස විඳියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- දේශීය ජන සංගීතයේ උන්නතිය සඳහා කැපවූ සංගීතඥයින් දෙදෙනෙකුගේ ජීවන තොරතුරු මතකයේ රඳවා ගනියි.
- ඔවුන්ගේ නිර්මාණ වෙන් කර හඳුනා ගනියි.
- එම ගීත ගයමින් රසාස්වාදයේ යෙදෙයි.
- එම ගීත නිර්මාණයන්හි අගය පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම්:**

- ඉහත කී සංගීතඥයන් පිළිබඳ ගොනු කරගත් ජීවන තොරතුරු
- අදාළ සංගීතඥයන්ගේ ගීත පටිගත කර ගත් සී.ඩී., ඩී. වී. ඩී.
- ස්වර පුවරුවක්, තාල වාද්‍ය භාණ්ඩයක්, කැසට් හෝ සී. ඩී. යන්ත්‍රයක්
- ගුරුවරයා විසින් සකස් කරගත් අදාළ තොරතුරු ඇතුළත් කියවීම් පත්‍රිකාවක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

මෙහි මුල් පාඩමින් අප ඩබ්ලිව්. බී. මකුලොලුව, සී. ද එස්. කුලතිලක සංගීතවේදීන් හා ඔවුන්ගේ සේවාව අධ්‍යයනය කළෙමු. මෙම පාඩමෙන් අප දැනුවත් කිරීමට අපේක්ෂා කරනුයේ ලයනල් රන්වල මහතාගේ සහ රෝහණ බැද්දගේ මහතාගේ සේවාවයි.

**පාඩම සංවර්ධනය** (පහත සඳහන් ප්‍රවේශ අතරින් ඔබ කැමති ප්‍රවේශයක් හෝ සුදුසු ප්‍රවේශයක් භාවිත කරන්න.)

**පියවර 01**

- ඔබ තෝරාගත් ගීයක් ස්වර පුවරුව ආධාරයෙන් රසවත්ව ගයන්න.
- තාල වාදනයේ හැකියාව ඇති සිසු සිසුවියක් තාල වාදනය සඳහා යොදවන්න.
- ගායනයෙන් හෝ කැසට්, සී. ඩී. යන්ත්‍ර මඟින් ගීත ශ්‍රවණයට සලස්වන්න.
- ශ්‍රවණය කරන ගීතය ළමුන් සමඟ එක් ව ගයන්න.
- අදාළ එක් ගීතයක් ස්වර පුවරුව වාදනය කරමින් ඔබ රසවත් ව ගයන්න.
- සිසුන් සිසුවියන් ද ගායනයට එක් කරගන්න.

(මිනිත්තු 30)

**පියවර 02**

- ඔබ විසින් සකසා ගත් කියවීම් පත්‍රිකා පන්තියේ ළමුන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- එම තොරතුරු පිළිබඳව සිසුන් අතර සංවාදයක් ඇති කරන්න. ඒ සඳහා ඔබ මූලික වන්න.
- තොරතුරු සිසුන්ට සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- ඉහත සංගීතඥයන් ගේ ගීතයක් ගැයීමට පුහුණුවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 30)

**පියවර 03**
- කණ්ඩායම් වශයෙන් හෝ කේවලව හෝ සංගීතඥයන්ගේ තොරතුරු ඉදිරිපත් කිරීමට සලසන්න.
- සෙසු අයත් ඊට දායක කරගන්න.
- ඔවුන්ගේ නිර්මාණවල ගීතවල අරුත්, සංගීතයේ ගැළපීම්, සංගීත භාණ්ඩවල උපයෝගීතාවයන් ගැන ඔබ පහදා දෙන්න.

(මිනිත්තු 15)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- ඉදිරිපත් කළ සිසු/සිසුවිය අගයන්න.

(මිනිත්තු 05)

**පසු අභ්‍යාස**
- අදාළ සංගීතඥයාගේ වෙනත් ගීත නිර්මාණ රැස්කර ශ්‍රවණය කිරීමට පොළඹවන්න.

**අතිරේක උදව්**
- ලයනල් රන්වල මහතා සහ රෝහණ බැද්දගේ මහතා පිළිබඳව තොරතුරු සඳහන් විවිධ පොත්පත් පරිහරණය කොට සුදුසු පරිදි කියවීම් පතක් ඔබ විසින් සකසා ගන්න.

# හරිප්‍රසාද් චෞරසියා, ශබීර් හුසේන්, රවිශංකර්

**නිපුණතාව 3.0** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟාකර ගැනීමට හුරුවෙයි.

**නිපුණතා මට්ටම 3.3 :** උතුරු ඉන්දීය අධ්‍යතන සංගීතඥයින් හඳුනා ගනිමින් ඔවුන්ගේ නිර්මාණ අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :
- භාරතීය වාද්‍ය ශිල්පීන් තිදෙනෙකුගේ ජීවන තොරතුරු සාකච්ඡා කරයි.
- එම තිදෙනාගේ වාදන රස විඳියි.

**ගුණාත්මක යෙදවුම් :**
- සංගීතඥයින් තිදෙනාගේ ජීවන තොරතුරු ඇතුළත් පත්‍රිකාව
- සංගීතඥයින් තිදෙනාගේ වාදන ඇතුළත් තැටි/පටි හෝ (Pen drive)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

මෙහි සඳහන් සංගීතඥයින් පිළිබඳ ජීවන තොරතුරු සැකෙවින් හඳුනා ගැනීමත්, ඔවුන්ගේ නිර්මාණ රස විඳීමත් මෙම පාඩමෙන් අපේක්ෂිතය. විවිධ සංගීතඥයින්ගේ නිර්මාණ මේවන විට වෙනස් පාඩම් ඔස්සේ රසවිඳ ඇති හෙයින් මෙම පාඩම ගොඩනැගීම එතරම් අපහසු නොවේ. මේ අයගේ වාදන ශ්‍රවණය කරමින් එහි ඇති රස භාවයන් පිළිබඳ විස්තරයක් කිරීමේ හැකියාව ගුරුවරයා සතුවිය යුතුය.

**පාඩම් සංවර්ධනය :**

**පියවර 01**
- පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියාගේ වාදනයක් ශ්‍රවණයට සලසන්න.
- පණ්ඩිත් රවිශංකර්ගේ වාදනයක් ශ්‍රවණයට සලසන්න.
- ඔස්තාද් ශකීර් හුසේන්ගේ වාදනයක් ශ්‍රවණයට සලසන්න.
- ඇමුණුම අංක 01 හි වගුව ඇතුළත් පත්‍රිකාව සිසුන්ට බෙදා දෙන්න.

(මිනිත්තු 10)

**පියවර 02**
- පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියාගේ වාදනය පිළිබඳ තොරතුරු අදාළ වගුව සම්පූර්ණ කරන්න.
- පණ්ඩිත් රවිශංකර්ගේ වාදනය පිළිබඳ ව තොරතුරු අනුව වගුව සම්පූර්ණ කරන්න.
- ඔස්තාද් ශකීර් හුසේන්ගේ වාදනය පිළිබඳ ව තොරතුරු අනුව අදාළ වගුව සම්පූර්ණ කරන්න.

(මිනිත්තු 15)

**පියවර 03**
- සම්පූර්ණ කර ලද වගුවේ තොරතුරු ඇසුරින් බටනලා වාදනය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- වගුවේ තොරතුරු ඇසුරින් සිතාර් වාදනය පිළිබඳ තොරතුරු සාකච්ඡා කරන්න.
- වගුවේ තොරතුරු අනුව තබ්ලා වාදනය පිළිබඳ සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සංගීතඥයින් තිදෙනා පිළිබඳ වෙන් වෙන්ව තොරතුරු ඉදිරිපත් කරන්න.
- ඔවුන්ගේ වාදන පිළිබඳ ව වෙන් වෙන්ව තොරතුරු ඉදිරිපත් කරන්න. (මිනිත්තු 05)

**පසු අභ්‍යාස**
- සංගීත කාමරයට හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයට ගොස් එම වාදන නැවත නැවත ශ්‍රවණය කරන්න.

**අතිරේක උදව්:**
- අන්තර්ජාලය ඇසුරින් මෙම වාදකයින් තිදෙනාගේ වාදන නැරඹීමට යොමු කිරීම.

**ඇමුණුම අංක 01 - සංගීතඥයින්ගේ ජීවන තොරතුරු**

| | හරිප්‍රසාද් චෞරසියා | ශබීර්හුසේන් | රවිශංකර් |
|---|---|---|---|
| වාදන ශෛලිය වර්ගය | | | |
| භාවිත කළ සහාය වාද්‍ය භාණ්ඩ | | | |
| භාවිත කළ ශිල්ප ක්‍රම | | | |
| යොදාගත් තාල පද | | | |
| භාණ්ඩ අයත් වර්ගය | | | |
| ජීවන තොරතුරු කෙටියෙන් | | | |

පහත සඳහන් තොරතුරු මේ සඳහා උදව් කරගන්න.

**වාදන ශිල්පක්‍රම**

ආලාප, තානාලංකාර, ඣාලා, තිහායි, කායදා, පල්ටා. ගත්. හින්දුස්තානී තාල පද, තත්, ඝන සුෂිර, අවනද්ධ. විලම්භලය, මධ්‍යලය, දෘතලය, චක්‍රදාර්, ජෝඩ්ආලාප, ලෙහෙරා, මීන්ඩ්, ගමක්, මූර්කි, ක්‍රින්තන්

**ජීවන තොරතුරු**

මුස්ලිම් ජාතිකයෙකි. දක්ෂ සිතාර් වාදකයෙකි. බටනලා වාදකයෙකි. පද්මභූෂණ සම්මානලාභියෙකි. රාග නිර්මාණය කර ඇත. පියා අල්ලා රක්ඛා වේ.

# ජග්ජිත් සිං, රහුමාන් සංගීතඥයෝ

**නිපුණතාව** : සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟාකර ගැනීමට හුරුවෙයි.

**නිපුණතා මට්ටම** : උතුරු ඉන්දීය අද්‍යතන සංගීතඥයින් හඳුනා ගනිමින් ඔවුන්ගේ නිර්මාණ අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :
- ජග්ජිත් සිං. රහුමාන් යන සංගීතඥයින් ගේ නිර්මාණ රසවිඳීමට කැමැත්ත පල කරයි.
- වෙනත් සංගීතඥයින්ගේ නිර්මාණ රසවිඳීමට පෙළඹෙයි.

**ගුණාත්මක යෙදවුම්**:
- ජග්ජිත් සිං ගේ ගසල් ගායනය ඇතුළත් ශ්‍රව්‍ය, දෘශ්‍ය තැටි/පටි
- රහුමාන්ගේ නිර්මාණ ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය තැටි/පටි
- තොරතුරු ඇතුළත් පත්‍රිකාව (ඇමුණුම අංක 1)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

මෙහි සඳහන් සංගීතඥයින් දෙදෙනා පිළිබඳ සැකෙවින් ජීවන තොරතුරු, ඔවුන්ගේ දක්ෂතා හා නිර්මාණ රසවිඳීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය. මොවුන්ගේ නිර්මාණ කිහිපයක් ශ්‍රවණයට සලසා ඒ පිළිබඳ ව විචාරාත්මකව අදහස් ඉදිරිපත් කිරීමත් සිසුන් තුළ සම්භාව්‍ය සංගීතය පිළිබඳ ඇති ඇල්ම වැඩි කිරීමත් යන කාරණා දෙකම මේ තුළින් ඉටු කිරීමට බලාපොරොත්තු වන අරමුණකි. එබැවින් මේ ගායනා පිළිබඳ විචාරාත්මක අදහස් දැක්වීමට ගුරුවරයා පොහොසත් විය යුතු ය.

**පාඩම සංවර්ධනය** :

**පියවර 01**
- ජග්ජිත් සිං ගේ ගසල් ගායනයක් හා රහුමාන්ගේ සංගීත නිර්මාණ කිහිපයක් ශ්‍රවණයට සලස්වන්න. වීඩියෝ දර්ශනයක් ඇත්නම් පින්තූර අවශ්‍ය නොවේ.

(මිනිත්තු 10)

**පියවර 02**
- සංගීතඥයින් දෙදෙනාගේ තොරතුරු ඇතුළත් පත්‍රිකාව පන්තියට බෙදා දෙන්න. (ඇමුණුම අංක 1)
- නැවත වරක් නිර්මාණ ශ්‍රවණයට සලස්වා වගුවේ සඳහන් තොරතුරු සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරන්න. (ඇමුණුම අංක 2)
- වරින් වර නිර්මාණය ශ්‍රවණයට යොමු කරන්න.

(මිනිත්තු 15)

**පියවර 03**
- වගුවේ සඳහන් තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- තොරතුරුවල සාරවත් බව හා නිවැරදි බව තහවුරු කර ගන්න.

(මිනිත්තු 10)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

සිසුන් කණ්ඩායම් දෙකකට වෙන්කොට දෙදෙනාගේ තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

(මිනිත්තු 05)

**පසු අභ්‍යාස** : පාසලේ ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ හෝ සංගීත පන්ති කාමරයේ උපකරණ මගින් නැවත නැවත ශ්‍රවණයට යොමු කරන්න.

**අතිරේක උදව්** : අන්තර් ජාලය ඇසුරින් මෙම ශිල්පීන්ගේ නිර්මාණ රසවිඳීමට යොමු කිරීම.

**ක්‍රියාකාරකම 44**

# වාර්ෂික විවිධ ප්‍රසංගය

**නිපුණතාව 3.0** : සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන හා ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.4** : ලබා ගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගික ව ඉදිරිපත් කරමින් සතුට ලබයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

**ගුණාත්මක යෙදවුම්:**

- එක් එක් ප්‍රසංග අංකයට ගැලපෙන ලෙස සකස් කර ගත් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ
- වාද්‍ය භාණ්ඩ

**ඉගෙනුම් පල** :

- ප්‍රාසංගික අත්දැකීම් ලබමින් සතුටු වෙයි.
- සංගීතය විෂය ඉගෙනීමෙන් තෘප්තිමත් වෙයි.
- වේදිකාව පරිහරණය පිළිබඳ අත්දැකීම් ලබයි.
- විවිධ පෞරුෂ ගුණාංග වර්ධනය කර ගනියි.
- ගායන වාදන තනි ව ඉදිරිපත් කිරීමට පෙළඹෙයි.
- මෙතෙක් උගත් ගායන වාදන හැකියා ප්‍රසංගික ව ප්‍රදර්ශනය කරයි.
- ඉදිරිපත් වීම, සංවිධානය හා මෙහෙයවීම වැනි ගුණාංග ප්‍රගුණ කරයි.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

පාසල් වේදිකාවේ ප්‍රාසංගික අවස්ථාවකට සහභාගි වීමට සිසුහු කැමැත්තක් දක්වති. එයින් ඔවුන් තුළ පෞරුෂ ගුණාංග රාශියක් වර්ධනය වනු ඇත එබැවින් සැම විට ම විශේෂ තෝරා ගැනීමක් නොකර සියලු ම සිසුන්ටද සහභාගි වීමට අවස්ථාව ලැබෙන පරිදි පාසල් විවිධ ප්‍රසංගය සැලසුම් කර ගැනීම ගුරුවරයාගේ වගකීමකි. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩසටහනට ගැලපෙන ලෙස කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ලකුණු පිරිනැමීමක් ද කළ හැකි ය. මෙහි දී මහා පරිමාණයේ විවිධ ප්‍රසංගයක් පැවැත්වීම ම අරමුණු කර නැත. එබැවින් පහත දැක්වෙන කරුණු ඔබට මේ සඳහා උපකාර වනු ඇත.

- මෙතෙක් 10 වන ශ්‍රේණිය දක්වා පෙරදිංග සංගීතය විෂය නිර්දේශයෙහි උගත් ක්‍රියාකාරකම් ඇසුරෙන් විවිධ ප්‍රසංගයට සුදුසු ප්‍රසංග අංක පුහුණු කළ හැකි ය.
- ශ්‍රේණි මට්ටමින් වෙන වෙනම විවිධ ප්‍රසංගය පැවැත්වීම හෝ සියලු පන්ති සහභාගි කරගනිමින් එක් විවිධ ප්‍රසංගයක් පාසල තුළ පැවැත්වීම.
- වේදිකාවේ ප්‍රාසංගික අත්දැකීම් ලැබෙන පරිදි අවම වශයෙන් පාසල් නිල ඇඳුමින් හෝ ගායන, වාදන, රංගන අයිතමවලට සිසුන්ට ඉදිරිපත් වීමට අවස්ථාව ලබාදීම.
- කාලය, ඉඩකඩ, පහසුකම් ප්‍රමාණවත් පරිදි වර්ෂය තුළ ලබාගත නොහැකි වූයේ නම් පාසල තුළ ඉඩකඩ ඇති ස්ථානයක අනෙක් ගුරු භවතුන් සහ දෙමාපියන් ඉදිරියේ කේවල සහ සාමූහික ප්‍රසංග ලෙස කෙටි සංදර්ශනයක් පවත්වා සිසුන් අගය කිරීම සහ ධෛර්යමත් කිරීම කළ හැකි ය. සුදුසු පරිදි ළමුන් ප්‍රාසංගික අත්දැකීම් ලැබෙන අයුරින් මෙම විවිධ ප්‍රසංගය සැලසුම් කිරීමට උත්සාහ කරන්න.

- කාලච්ඡේද 5 ක් යනු සති දෙකක කාලයකි. සිසුන් පන්ති කාමරයේ දී උගත් සංගීතමය ප්‍රායෝගික අංග ඇසුරින් කිසියම් තේමාවකට ගැලපෙන ලෙස කණ්ඩායම් වශයෙන් හෝ ඒකල ව වේදිකාවේ රඟ දැක්වීමට සුදුසු ගායන, වාදන, නාට්‍ය, අංග කණ්ඩායම වශයෙන් පුහුණු කරගැනීමටත්, විවිධ ප්‍රසංගය සැලසුම් කිරීමටත් මෙම කාලච්ඡේද 05 යොදා ගැනේ. වැඩි පිරිසක් යොදා ගැනීම වඩාත් සුදුසු ය. පහත දැක්වෙන කරුණු පිළිබඳ ගුරුවරයා සැලකිලිමත් විය යුතු වේ.
- 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සියලුම පන්ති එක් දිනක දී යොදා ගන්නේ නම් උපරි ම අන්දමින් පැය දෙකහමාරක පමණ කාලයකට ගැළපෙන ලෙස ප්‍රසංගය සඳහා ප්‍රසංග අංක ලැයිස්තුවක් පිළියෙළ කිරීමට සිසුන් දායක කර ගැනීම.
- එක් එක් ශ්‍රේණිවල සිසුන්ට වැඩ බෙදා දීම.
- පොදු වාදක මණ්ඩලයක් සෑම ප්‍රසංග අංකයක් සඳහා ම යොදා ගැනීම හා ගුරුභවතුන්ගේ සහාය ලබා ගැනීම.
- පන්ති කාමරයේ අධ්‍යයනය කළ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට මුල් තැනක් ලබා දීම.
- බාහිර සම්පත් පුද්ගලයන් සහභාගි කර නොගෙන පාසලේ සිසු - ගුරු සම්පත්වලින් පමණක් සරල ව ප්‍රසංගය පැවැත්වීම.
- සරල ප්‍රසංග අංකවලින් ආරම්භ කිරීම.
- පාසල් වේදිකාව භාවිත කරන්නේ නම් ඒ සඳහා සුදුසු සැලසුමක් පිළියෙළ කර වේදිකා පරිපාලනයට කණ්ඩායමක් යෙදවීම.
- ප්‍රේක්ෂක පිරිස පිළිබඳ අවධානය යොමු කරමින් අසුන් පැනවීම.
- පිළිගැනීම වැනි කාර්යයන් සඳහා ද සිසුන් යොමු කිරීම.

එක් එක් ශ්‍රේණියට ගැළපෙන ලෙස පන්ති කාමරයේ අධ්‍යයනය කළ කොටස් ඇසුරින් ප්‍රසංග අංක සැකසීම යන කාරණය පිළිබඳ වැටහීමක් ලබා ගැනීමට පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඔබට මග පෙන්වනු ඇත.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 1**
- විවිධ ප්‍රසංගයකට ඉදිරිපත් වීමෙන් ශිෂ්‍යයාට ලැබෙන වාසි පිළිබඳ ව සාකච්ඡා කරන්න. (මිනිත්තු 10)

**පියවර 2**
- තෝරාගත් ප්‍රසංග අංක පුහුණු කරන්න. (මිනිත්තු 30)
- තෝරාගත් ප්‍රසංග අංක පුහුණු කරන්න. (මිනිත්තු 40)

**පියවර 3**
- කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව වේදිකාවේ හෝ පන්ති කාමරයේ සලස්වන්න. (මිනිත්තු 40)
- ස්වර නියමිත නාදස්ථාන අනුව ගායනයට යොමු කරන්න. සුදුසු අංග චලන ප්‍රාසංගික ව යොදා ගන්න. (මිනිත්තු 40)
- මෙම පන්තියට යෝජිත කොටසේ සමස්ත නිමාව ඉදිරිපත් කර අගයන්න. (මිනිත්තු 30)

**ඇගයීම් හා තක්සේරුකරණය :**
- කණ්ඩායම් ලෙස හෝ කේවල ව අගය කර ලකුණු ප්‍රදානය කරන්න. (මිනිත්තු 10)

**පසු වැඩ :**
- විවිධ ප්‍රසංගයක දී ඉටු කළ යුතු වැඩ කොටස් ලැයිස්තුවක් සිසුන් ලවා පිළියෙළ කරවන්න.
- මෙවැනි ප්‍රසංගයක් සාර්ථක ව ඉදිරිපත් කිරීමට තවදුරටත් කළ යුතු සංවිධානාත්මක වැඩ කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කරන්න.

**අතිරේක උදව් :** 2007 - 10 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය